# බස්නාහිර පළාතේ පළාත් සභාව
## மேல் மாகாண மாகாண சபை
WESTERN PROVINCE PROVINCIAL COUNCIL

**2013 සැප්තැම්බර් 24 වන අඟහරුවාදා**
2013 செபடெம்பர் 24 செவ்வாய்க்கிழமை
Tuesday 24th September 2013

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාතේ සභා ගොඩනැඟිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවැති සභා රැස්වීම**

பத்தரமுல்ல, ஸ்ரீ ஜயவர்த்தனபுர, டென்சில் கொப்பேகடுவ மாவத்தை, இல. 204 இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09.46 ට පළාත් සභාව රැස් විය.**
*மு.ப. 09.46 க்கு சபை கூடியது*
The Provincial Council met at 09.*46* a.m.

**ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.**
*திரு. தவிசாளர் [ சுனில் விஜேரத்ன அவர்கள்] தலைமை வகித்தார்.*
*Mr. Chairman [ Sunil Wijerathne ] in the Chair*

# සභාපතිවරයාගේ නිවේදනය
ANNOUNCEMENT OF CHAIRMAN

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*"2013 අංක..... දරන බස්නාහිර පළාතේ පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය (සංශෝධන) ප්‍රඥප්තිය දෙවනවර කියැවීමේ වැඩ කටයුතු ඊළඟ සභා රැස්වීම් දිනයේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමට කටයුතු කරන බව කාරුණිකව දැනුම් දෙනවා."*

# ලිපි ලේඛන පිළිගැන්වීම
## PAPERS PRESENTED

**ගරු ප්‍රසන්න රණතුංග** (ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකී රක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂයය භාර අමාත්‍යතුමා)
Hon. Prasanna Ranathunga (Chief Minister and the Minister of Finance and Planning, Law and Order, Land, Education, Local Government, Provincial Administration, Manpower and Employment, Economic Promotion, Power and Energy and Trade Affairs)

ගරු සභාපතිතුමනි, *"2013 පරිපූරක ඇස්තමේන්තුව - 01 හා ඊට අදාළ විසර්ජන ප්‍රඥප්තිය සම්බන්ධ ලිපි ලේඛන සභාවට ඉදිරිපත් කරනවා. "*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එම ලේඛනවල පිටපත් න්‍යාය පත්‍රය සමඟම සියලුම ගරු මන්ත්‍රීතුමන්ලා වෙත ලැබෙන්නට සලස්වා තිබෙනවා. වැඩිදුර සාකච්ඡාව අද දින න්‍යාය පත්‍රයේ පොදු කටයුතු විෂයයේදී කළ හැකි බව මේ අවස්ථාවේදී දැනුම් දෙනවා.

# කාරක සභා වාර්තා
COMMITTEE REPORTS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

2013.09.03 වන දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව මම පිළිගන්වනවා.

***අදාළ වාර්තාවේ පිටපත් ගරු මන්ත්‍රීවරුන්ගේ මේසය මත තබා ඇති බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.***
*Hon. Chairman declared that a copy of the relevant report is placed on the tables of the Hon. Members.*

# පෙත්සම්
PETITIONS

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, මීගොඩ, ඕවිටිගම, නාගහවත්ත, අංක 302/1 B හි පදිංචි පී.එච්.ආර්. සමරසේන යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A. M. Yoosuf

කළුතර, නාගොඩ, කෝසල මාවතෙහි පදිංචි කේ.එල්.පී රාජකරුණා යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

***[සභා මේසය මත තබන ලද පෙත්සම්]***
*[Tabled petitions]*

**ප්‍රදීප් පෙරේරා ගරු මන්ත්‍රීතුමාගේ අත්සනින් යුත්,**

වැබඩ, කිරිල්ලවල, පල්ලියහේනවත්ත, අංක 120/11 හි පදිංචි ඒ.ටී පත්මසීලි යන අයගේ පෙත්සම,

සියඹලාපේ, උඩුපිල පාර, අංක 354/A හි පදිංචි ජේ.එම්.ඩී.එම්. ජයමාන්න යන අයගේ පෙත්සම සහ,

වත්තල, ගොංගිතොට, දවටගහවත්ත, අංක 15/1 හි පදිංචි එච්.ඒ. පෙරේරා යන අයගේ පෙත්සම.

**සුමිත් ලාල් මෙන්ඩිස් ගරු මන්ත්‍රීතුමාගේ අත්සනින් යුත්,**

කළුතර දකුණ, වික්‍රමසිංහ පෙදෙස, 42/17 හි පදිංචි ජේ.එච්. සීලවතී යන අයගේ පෙත්සම සහ

කළුතර, කලමුල්ල, ශාන්තමරියා මාවතෙ හි පදිංචි පී. සෙබස්තියන් තිසේරා යන අයගේ පෙත්සම

***ඉදිරිපත් කරන ලද පෙත්සම්, මහජන පෙත්සම් කාරක සභාවට යොමු කළ යුතු යැයි නියෝග කරන ලදී.***

*Petitions Presented, ordered to refer to the Petitions committee.*

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු

ORAL ANSWERS TO QUESTIONS

## අත්තනගල්ල විවිධ සේවා සමූපකාර සමිතිය : සභාපතිවරයා

ATTANAGALLA MULTIPURPOSE COOPERATIVE SOCIETY: CHAIRMAN

**01.**

**යූ.ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා විසින්, ගරු ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු, සමූපකාර සංවර්ධන, ආහාර සැපයීම හා බෙදාහැරීමේ කටයුතු සහ ග්‍රාම සංවර්ධන විෂය භාර අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/v(1)13/12)**

අ. අත්තනගල්ල විවිධ සේවා සමූපකාර සමිතියේ සභාපතිවරයා ගම්පහ දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු සංගමයේ අධ්‍යක්ෂකවරයෙකු බව දන්නේද ?

ආ. ඒ හේතුවෙන් සමූපකාර මණ්ඩලය වාර්ෂික 16.25%ක පොළියක් ලබා දෙන බව දන්වා තිබියදී, සමිතිය සතු මුදල් ගම්පහ දිස්ත්‍රික් සමූපකාර ග්‍රාමීය බැංකුවේ රුපියල් ලක්ෂ 375 ක් 15.25% පොළියක් මතද, කොළඹ ග්‍රාමීය බැංකු සංගමයේ රුපියල් ලක්ෂ 150 ක් 16% පොළිය මතද, තැන්පත් කිරීමෙන් සමිතියට වාර්ෂිකව රුපියල් 412,500/- පොළිය අහිමි වූ බව දන්නේද ?

ඇ. 2012 වසරේ සභාපතිගේ කැමැත්තට ගම්පහ දිස්ත්‍රික් බැංකු සංගමයේ තැන්පත් කරන ලද මුදල් අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය මත ශ්‍රී ලංකා ජාතික සමූපකාර මණ්ඩලයේ තැන්පත් කිරීමෙන් රුපියල් 468,750/- ක අමතර පොළියක් ලැබුණ බව පිළිගන්නේද ?

ඈ. සමිතිය යටතේ පාලනය වන සමූපකාර ෆාමසියට ලබා ගන්නා ඖෂධ සඳහා ලැබෙන කොමිස් මුදල් සභාපති පෞද්ගලිකව තමාම ලබා ගන්නා බව දන්නේද ?

ඉ. සමිතියේ පාරිභෝගික අංශය මාසිකව රුපියල් ලක්ෂ 15 ක පාඩුවක් ලබන බව දන්නේද?

ඊ. මෙම වංචා හා දූෂණයන්ට එරෙහිව සමිතියේ උපසභාපති ඇතුළුව අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් තිදෙනෙකු 2013.06.20 දින සිට තනතුරුවලින් ඉල්ලා අස්වී ඇති බව දන්නේ ද?

උ. සභාපතිවරයාගේ විෂමාචාරයන්ට එරෙහිව පියවරක් ගන්නේද? නොඑසේනම් මන්ද ?

**ගරු උපාලි කොඩිකාර** (ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු, සමූපකාර සංවර්ධන, ආහාර සැපයීම් හා බෙදා හැරීම් කටයුතු සහ ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා)

Hon. Upali Kodikara (Minister of Transport, Sports and Youth Affairs, Cultural and Arts Affairs, Cooperative Development, Food Supplies and Distribution and Rural Development)

අ. ඔව්.

ආ. නැත.

දිස්ත්‍රික් බැංකු සංගමයේ මුදල් තැන්පත් කිරීම සාමාජික සමිතියක යුතුකමක් හා වගකීමකි.

ඇ. ඔව්.

ඈ. නැත.

ඉ. ඔව්.

ඊ. 2013.06.18 වන දින අධ්‍යක්ෂවරයෙකුද, 2013.06.27 වන දින උප සභාපති සහ අධ්‍යක්ෂවරු දෙදෙනෙක්ද සමිතියේ අධ්‍යක්ෂ ධූරවලින් ඉල්ලා අස්වී ඇත.

උ. පියවර ගෙන ඇත.

ඉදිරිපත් වී ඇති චෝදනා හා පෙත්සම් සම්බන්ධයෙන් මේ වන විට පරීක්ෂණ පැවැත් වේ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නවලට පිළිතුරු ටික පැහැදිලි වුණේ නැහැ. මෙතැන සෝෂාව වැඩි වුණා. කමක් නැහැ. කොහොම වුණත් මගේ අතුරු ප්‍රශ්න තුන මම අහන්නම්. පිළිතුරු ටික සභාගත කරන්න කියලා ගරු අමාත්‍යතුමාගෙන් ඉල්ලීමක් කරනවා. පළමුවැනි අතුරු ප්‍රශ්නය. ශ්‍රී ලංකා සමූපකාර ජාතික මණ්ඩලයට 16.25% ක පොළී ප්‍රතිශතයක් දීමට ලිඛිතව කැමැත්ත ප්‍රකාශ කර සිටියදී 15.25% ට අඩු පොළියට මුදල් තැන්පත් කිරීමට හේතුව කුමක්ද?

දෙවැනි ප්‍රශ්නය. අඩුම වශයෙන් 16% යේ පොළී ප්‍රතිශතයක් ගෙවන කොළඹ ග්‍රාමීය බැංකු මහා සංගමයේ සියලු මුදල් තැන්පත් කිරීමෙන් පාඩුව අවම වන බව ඔබතුමා දන්නේද? එහෙම කළා නම් අඩුම වෙනවා.

තුන් වැනි ප්‍රශ්නය. මේ සියල්ලටම හේතුව සභාපතිවරයා ගම්පහ දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු සංගමයේ අධ්‍යක්ෂක තනතුර ආරක්ෂා කර ගැනීම නොවේද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙතුමාගේ අතුරු ප්‍රශ්නවලට පිළිතුරු ගරු ඇමැතිතුමා -

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ගරු සභාපතිතුමනි,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී. ]***
*[Expunged on the order of the chair]*

ඊළඟ සභා වාරයේදී උත්තර දෙන්න පුළුවන්.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී. ]***
*[Expunged on the order of the chair]*

***න්‍යාය පත්‍රයේ අංක 02 යටතේ සරත් පතිරණ ගරු මන්ත්‍රීතුමාගේ නමින් යුත් ප්‍රශ්නය ගරු ප්‍රධාන අමාත්‍යතුමාට ඉදිරිපත් කරන ලදුව, ඊට සති දෙකක කාලයක් කල් ඉල්ලූ බැවින් ප්‍රශ්නය ඉදිරි සභාවට යොමු කරන ලෙසට ගරු සභාපතිතුමා විසින් නියෝග කරන ලදී.***

*The question in the name of the Hon. Sarath Pathirana, member, under item No. 2 of the agenda, was presented to the Hon. Chief Minister and as two weeks time was asked for, the Chairman ordered that the question be referred to the next Council sitting.*

# නොපැමිණ සිටීමේ අවසරය
LEAVE OF ABSENCE

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ගරු සභාපතිතුමනි, *"සේනක දමයන්ත ද සිල්වා ගරු මන්ත්‍රීතුමාට මාස තුනක කාලයක් නොපැමිණ සිටීමේ අවසරය ලබා දිය යුතු යැයි"* ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ මට වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. විශේෂයෙන්ම මේ බස්නාහිර පළාත් සභාවේ 2013 වසරේ ක්‍රීඩා උළෙල සම්බන්ධව. විශේෂයෙන් බස්නාහිර පළාත් සභාවේ ක්‍රීඩා උළෙලේ ආරාධනා පත්‍රය සම්බන්ධව. ගරු සභාපතිතුමනි, අපි දන්නවා මේ පළාත් සභා පිහිටෙව්වේම මේ රටේ දෙමළ කථා කරන ජනතාවට යම්කිසි ආකාරයේ බලය විමධ්‍යගත කිරීමක් හා ඒ අයටත් නිසි තැනක් ලබා දීමේ අරමුණ ඇතුවයි. නමුත් මේ ආරාධනා පත්‍රයේ - මම දන්නේ නැහැ, ගරු ඇමැතිතුමා දන්නවාද කියලා. ආරාධනා පත්‍රයේ දෙමළ භාෂාව ලියලා තිබෙනවා සම්පූර්ණයෙන්ම වැරැදියි. විකෘතියි. අඩුම ගණනේ ගරු ආණ්ඩුකාරතුමාගේ නමවත් හරියට ගහලා නැහැ. ඉතින් මම දන්නේ නැහැ, කවුද මේවා කරන්නේ කියලා. මේක සම්පූර්ණයෙන්ම වැරැදි දෙයක්. දෙමළ, මේ රටේ ජාතික භාෂාවක්. මේ රටේ තිබෙන සිංහල භාෂාව වාගේම සම තැන දීපු භාෂාවක්. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ඒක සහතික කරලා තිබෙනවා. පළාත් සභාවේ ඒක සහතික කරලා තිබෙනවා. නමුත් මෙතුමා මේ බස්නාහිර පළාත් සභාවේ ජාතික ක්‍රීඩා උළෙලට දීපු ආරාධනා පත්‍රය ද්‍රවිඩ භාෂාවෙන් ගහලා තිබෙනවා සම්පූර්ණයෙන්ම වැරැදියි. ව්‍යාකරණ විතරක් නොවෙයි. ඒකේ තේරුමත් වැරැදියි. නම් වැරැදියි. ඉතින් මම දන්නේ නැහැ, මේවා නිවැරැදිද කියලා බලන්නේ නැත්තේ ඇයි කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා එය සභාගත කරන්න.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ඇයි මේක නිවැරැදිව කළේ නැත්තේ? මෙය ඇමැතිතුමා නොදැනුවත්ව වුණාද? මෙයට වගකිව යුතු පුද්ගලයන් කවුද?

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ගරු සභාපතිතුමනි, භාෂා පරිවර්තනය සම්බන්ධයෙන් වැරැද්දක් තිබෙනවා නම් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ආරාධනා පත්‍රය සභාගත කරන්න.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

මම සභාගත කරනවා.[1]

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

පරිවර්තනයන් සම්බන්ධයෙන් තිබෙනවා නම්, ඒ වැරැද්ද කරපු නිලධාරීන් සම්බන්ධයෙන් පරීක්ෂණයක් කරලා අපි ඒකට වාර්තාවක් ඉදිරිපත් කරන්නම්. ආරාධනා පත්‍රයක් භාෂාවලින් පරිවර්තනය කිරීම ඇමැතිවරයාගේ රාජකාරියක් නොවෙයි.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ඒක තමයි. මේ ගැන සොයා බලන්න. මෙය බස්නාහිර පළාත් සභාවටම කරපු කැළලක් කියලා තමයි මම නම් දකින්නේ. මේ ගැන සොයා බලන්න. මම මේ ආරාධනා පත්‍රය සභාගත කරනවා.

[1] සභා ලේකම් කාර්යාලයේ හැන්සාඩ් අංශයේ තබා ඇත.

# පෞද්ගලික පැහැදිලි කිරීම්
## PERSONAL EXPLANATIONS

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, මෙම අවස්ථාව ලබා දීම සම්බන්ධව මම ස්තුතිවන්ත වෙනවා. විදුලි පණිවුඩ සේවාව කියන්නේ ටෙලිග්‍රෑම් කියලා කවුරුත් දන්නවා, ඒ ටෙලිග්‍රෑම් සේවාව ඔක්තෝබර් මාසයේ මුල සිට නවත්වන බව අපට මාධ්‍යයෙන් දැන ගන්න ලැබිලා තිබෙනවා. එම නිසා ඒ සම්බන්ධව තමයි මම මේ අදහස් ප්‍රකාශ කරන්න බලාපොරොත්තු වෙන්නේ. මේ සේවාව ජනතාව අතර ඉතාම ප්‍රචලිත සේවාවක්. ඒත් අද නවීන තාක්ෂණයත් එක්ක e-mail කියයි. SMS, Web Site කියයි. ඒ නවීන ක්‍රියාදාමයන් තුළ යම් යම් දේවල් යටපත් කරන්න හැදුවත්, මේ දුප්පත් ජනතාවගේ ඕනෑම අවශ්‍යතාවයකට - රැකියාවකට යන්න බැරි වුණොත්, නැත්නම් ඈත ප්‍රදේශයකට මංගල්‍යයකට හෝ අවමංගල්‍යයකට, නැත්නම් වෙනත් අවශ්‍යතාවයකට මුදල් යවන්න පරක්කු වීමක්, මොනවා හරි ෆිනෑන්ස් ආයතනයකට සම්බන්ධව යවන්න තිබෙන කෙටිම තැපැල් සේවාව, පණිවුඩ සේවාව තමයි ටෙලිග්‍රෑම් සේවාව. ඒකේ යම් යම් අඩුපාඩු තිබෙන්න පුළුවන්. සාමාන්‍යයෙන් දිනකට 10,000 ක්, 12,000 ක් අතර ප්‍රමාණයක් ටෙලිග්‍රෑම් ගියා. ඒත් අද ඒ ප්‍රමාණය අඩු වෙන්න පුළුවන්. ඒ නිසා රජය විසින් මේ වාගේ තීන්දුවක් අරගෙන තිබෙනවා නම් ඒක සමස්ත ජනතාවටම කරන නිග්‍රහයක්. විපක්ෂය වශයෙන් ඒ සඳහා අපේ විරෝධය ප්‍රකාශ කරනවා.

ඒ වාගේම ඒ ආයතනවලින් යම් යම් දේවල් හඳුන්වා දෙන්න යන බවක් ප්‍රකාශ කරලා තිබෙනවා. ඒ පිළිබඳව ජනතාව තවම දැනුවත් වෙලා නැහැ. ඔක්තෝබර් මාසයේ 01 වැනිදා කියන්නේ, තව දවස් ගණනයි. විශේෂයෙන්ම මහජන නියෝජිතයන් වශයෙන් අපත් ඒවායින් ප්‍රයෝජන ගන්නවා. අපේ මන්ත්‍රීවරුන්ට SMS වලින් පණිවුඩයක් යවන්න පුළුවන් වාගේම අපට පුළුවන් අපට ඡන්දය දුන්න ජනතාවට නොයෙකුත් අවශ්‍යතාවයන්වලට, නොයෙකුත් රැස්වීම්වලට, නැත්නම් නොයෙකුත් ක්‍රියාදාමයන්වලට එන්න කියලා ටෙලිග්‍රෑම් යවන්න. මේ වාගේ නොයෙක් අවශ්‍යතාවයන් උදෙසා අපි ටෙලිග්‍රෑම් පාවිච්චි කරනවා. ඉතින් ඒ අවස්ථාව අපට නැති වෙනවා. එම නිසා ඒක අපට

වාගේම දුප්පත් ජනතාවටත්, විශේෂයෙන් සමස්ත ජනතාවට වන පීඩාවක්. තැපැල් සේවාව සේවාවක්. සෞඛ්‍ය සේවාව වෙන්න පුළුවන්. නැත්නම් අධ්‍යාපනය වෙන්න පුළුවන්. නැත්නම් දුම්රිය සේවාව වෙන්න පුළුවන්. ඒවායෙන් පාඩු ලබන්න පුළුවන්. මේක සේවාවක්. පාඩු ලබනවා කියලා මේ සේවාව නවත්වා දැමීම කාලෝචිත නැහැයි කියන එකයි අපි ප්‍රකාශ කරන්නේ. එම නිසා මෙය හුදෙක්ම ජනතාවට ළඟින්ම තිබෙන සේවාවක් බැවින් මේ සම්බන්ධව නව ක්‍රම හඳුන්වා දෙන්න ප්‍රථම මම ගරු ප්‍රධාන අමාත්‍යතුමා මාර්ගයෙන් තැපැල් අමාත්‍යතුමා වෙත ඉල්ලීමක් කරනවා. මෙයට ඉක්මන් තීන්දුවක් අරන් මේ ක්‍රමය නවත්වන්න එපාය කියන එක තමයි අපි මේ වේලාවේ ප්‍රකාශ කරන්නේ. අපි මාධ්‍යයෙනුත් ඉල්ලීමක් කරනවා. මේ සම්බන්ධයෙන් බස්නාහිර පළාත් සභාවේ විරෝධය අපි ප්‍රකාශ කරනවා. විශේෂයෙන්ම මේ ටෙලිග්‍රෑම් නැවැත්වීම කාලෝචිත නැහැ. ඒක ජනතාවට අවශ්‍ය දෙයක්. විශේෂයෙන්ම -

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

දැන් ඕවා ඕනෑ නැහැ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

ටෙලිග්‍රෑම් කියන එක අපි කාටත් අවශ්‍යයි නේ. ඔබතුමන්ලා දැන් අධිමානසිකත්වයෙන් ඉන්න නිසා මේ ටෙලිග්‍රෑම් ඕනෑ නැතිව ඇති. ටෙලිග්‍රෑම් එක ඕනෑ. මළ ගෙදරකට යන්න බැරි වුණොත්, ඔයා Job එකට දාපු එක්කෙනෙකුට රැකියාවට යන්න බැරි නම් ටෙලිග්‍රෑම් එකක් යවන්න ඕනෑ. ඒ අයට SMS යවන්න දන්නේ නැහැ. ඒ අයට e-mail යවන්න දන්නේ නැහැ. ගරු මන්ත්‍රීතුමා මේ පිළිබඳව සාධාරණව හිතන්න. මේක ජනතාව අතර තිබෙන දෙයක්. මේ සම්බන්ධයෙන් ඔබතුමන්ලා කණ්ඩායම් රැස්වීම්වල කථා කරන්න ඕනෑ. අපි නොවෙයි. ඔබතුමන්ලා කථා කරන්න ඕනෑ. එම නිසා මෙයට විරෝධය ප්‍රකාශ කරමින්, මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඇත්තටම අපේ ස්තුතිය ප්‍රකාශ කරනවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, විශේෂ ප්‍රකාශයක් කිරීම සඳහා අවස්ථාවක් ලබා දීම පිළිබඳව ඔබතුමාට පළමුවෙන්ම ස්තුතිවන්ත වෙනවා. 2013 අයවැය විවාදයේදී මේ ක්‍රීඩා අමාත්‍යාංශයට මිලියන 20 ක්, ලක්ෂ 200 ක් වෙන් කෙරුවා. ඒ ලක්ෂ 200 න්, එකසිය හතලිස් හතර ලක්ෂ අසූදාහක් තිබෙන්නේ, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමෙන්, දිස්ත්‍රික්ක මට්ටමෙන්, ඒ වාගේම පළාත් මට්ටමෙන් සහ ජාතික ක්‍රීඩා උළෙල සම්බන්ධව ක්‍රීඩකයන්ට මුදල් වියදම් කරන්න. වැඩ සටහන් කරන්න. ඒ වාගේම පොල්වත්තේ ක්‍රීඩා විද්‍යායතනයට ක්‍රීඩා පුහුණු වැඩ සටහන් කියලා ලක්ෂ 55 ක් වෙනම වෙන් කරලා තිබෙනවා. 39 වැනි ජාතික ක්‍රීඩා උළලේ අද ජයග්‍රහණය සමරන අවස්ථාවේ රන් පදක්කම් සංඛ්‍යාව 2009 ඉඳලා ගත්තොත්, 2009 රන් පදක්කම් සංඛ්‍යාව 77 යි. 2010 වසරේ 75 යි. 2011 වසරේ 81 යි. 2012 වසරේ 78 යි. 2012 වසරේ 76 යි. ඒ වාගේම තිබෙන සියලුම මුළු තරග සංඛ්‍යාව 48 යි. කණ්ඩායම් තරග 11 යි තිබෙන්නේ. ඒ වාගේම මලල ක්‍රීඩා හැටියට ක්‍රීඩා පිටියේ ක්‍රීඩා කරන ඉසව් 36 ක් තිබෙනවා. මලල ක්‍රීඩකයන්ට වුණු අසාධාරණය නිසා අද බස්නාහිර පළාතට ක්‍රීඩා ඉසව් 36 න් රන් පදක්කම් දිනා ගන්න ලැබුණේ 06 යි. ගැහැණු තරග හැටියට 03 කුත්, ඒ වාගේම පිරිමි තරග හැටියට 03 කුත් හැටියට තමයි ඒ පදක්කම් 06 ක් ලබා ගත්තේ. තරග ඉසව් 30 ක් අපි පැරදිලා තිබෙන්නේ. ඒකට ප්‍රධාන හේතුව තමයි ක්‍රීඩා විද්‍යායතනයට ලක්ෂ 55 ක් වෙන් කරලා මේ වන කොට දස ලක්ෂ අසූ පන්දාහක් විතරයි වියදම් කරලා තිබෙන්නේ. තිස් හතර ලක්ෂ දාහතර දාහක් තවම ඉතිරිව තිබෙනවා. එතකොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමට හැම අවුරුද්දේම අපේ බස්නාහිර පළාත් සභාවෙන් අනූ තුන්දාහක් වෙන් කරනවා. ඒ වාගේම අපේ මහ ආණ්ඩුවේ ක්‍රීඩා අමාත්‍යාංශයෙන් පහළොස් දාහක් වෙන් කරනවා. එක් ලක්ෂ අට දාහක් ලැබෙනවා. ඒ වාගේම දිස්ත්‍රික්ක මට්ටමට, එක දිස්ත්‍රික්කයකට ලක්ෂ 10 ගණනේ වෙන් කරනවා. ඒ වාගේම බස්නාහිර පළාත් තරගයට ලක්ෂ තිහක් වෙන් කරනවා. ඒ වාගේම ජාතික ක්‍රීඩා උළෙලට ලක්ෂ 32 ක් වෙන් කරනවා. මේ මුදල් වෙන් කරලා මේ ක්‍රීඩා අමාත්‍යාංශයට මුළු අවුරුද්දටම තිබෙන වැඩ සටහන මේක විතරයි. මේ වැඩ සටහන කරලා මලල ක්‍රීඩා ඉසව් 36 න් අපට 06 ක් නම් ජයග්‍රහණය කරන්න පුළුවන් වුණේ, එය බරපතළ ගැටලුවක්. එය මේ පදක්කම්වලින් අපට පැහැදිලිව පෙනෙනවා.

අවුරුද්දෙන් අවුරුද්ද රන් පදක්කම් සංඛ්‍යාව අඩු වෙනවා වාගේම මලල ක්‍රීඩක ක්‍රීඩිකාවන් ලොකු අපහසුතාවයක් ඇවිල්ලා අද ක්‍රීඩක ක්‍රීඩිකාවන් අනික් පළාත්වලට

[ ගරු මෙරිල් පෙරේරා]

ගිහිල්ලා තිබෙනවා. උදාහරණයක් ගත්තොත් කඳාන ඩී මැසනඩ් විද්‍යාලයේ මගේ නිවස ළඟ පදිංචි වෙලා ඉන්නේ. ජෝයි ධනුෂ්ක පෙරේරා. යගුලිය විසි කිරීමේ තරගයේදී අවුරුදු ගණනාවක් තරග වාර්තා තබපු ක්‍රීඩකයා. අද ඔහු නැගෙනහිර පළාතට ගිහිල්ලා ලියාපදිංචි වෙලා නැගෙනහිර පළාතට තරග කරනවා. ඒකට ප්‍රධාන හේතුව තමයි එකක්, පුහුණුවීම් කටයුතු කරන්න අවශ්‍ය පහසුකම් ලබා නොදෙන එක. ඒ වාගේම අනික් එක තමයි තරග ජයග්‍රහණය කළ විට ලබා දෙන මුදල අඩුවීම ගැන. නැගෙනහිර පළාතේ රන් පදක්කමකට රුපියල් 25,000 ක් ලබා දෙනවා. ඒ වාගේම රිදී පදක්කමක් ගත්තාම රුපියල් 15,000 ක් දෙනවා. ලෝකඩ පදක්කමක් ගත්තාම රුපියල් 10,000 ක් දෙනවා. අපේ තරග මුදල අඩු වීමත්, ඒ වාගේම පුහුණුවීම් කටයුතුවලදී උදව් නොකිරීම නිසාත් අද ක්‍රිඩක ක්‍රීඩිකාවන් අනික් පළාත්වලට තරග කරන අවස්ථාවක් ඇවිල්ලා තිබෙනවා.

මම දකින පළමුවැනි දේ ක්‍රීඩා අධ්‍යක්ෂකතුමා, ඒ වාගේම දිස්ත්‍රික්කයේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සභාව නිශ්ශබ්ද වන්න. එතුමා කියන කිසි දෙයක් ගරු මන්ත්‍රීතුමන්ලාට ඇහෙන්නේ නැහැයිලු. කරුණාකර සභාව නිශ්ශබ්ද වන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

බස්නාහිර පළාතේ ක්‍රීඩා අධ්‍යක්ෂකතුමා, ඒ වාගේම දිස්ත්‍රික්කයේ ඉන්න අපේ ක්‍රීඩා නිලධාරීන්, ඒ වාගේම කොට්ඨාශ ක්‍රීඩා නිලධාරීන්ගේ එකමුතුකම නැතිකම තමයි මීට හේතුව. මේ තරගාවලිවලට ඒ සියලුම දෙනා ප්‍රධාන වගකීම දරන්න ඕනෑ. ඒ අයගේ කිසිම එකමුතුවක් නැහැ. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමේ කරනකොට ඒ ප්‍රදේශයේ මන්ත්‍රීවරු සහභාගි කරවාගෙන කමිටුවක් හදලා කරන්න කියලා උපදෙස් දීලා තිබෙනවා. දිස්ත්‍රික් මට්ටම තිබෙන කොට දිස්ත්‍රික් මට්ටමේ කමිටුවක් හදලා ක්‍රීඩා තරගාවලිය කරන්න කියලා තිබෙනවා. පළාත කරනකොට පළාතේ කමිටුවක් හදන්න කියලා තිබෙනවා. මෙතැන පොත් තුනක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා සභාව නිශ්ශබ්ද වන්න. පෞද්ගලික කථා නවත්වන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, 2011, 2012, 2013 කියලා පොත් තුනක් මුද්‍රණය කරලා තිබෙනවා. මේ පොත් තුනේ කමිටුවල නම් තිබෙනවා. උපදේශක කාරක සභාවේ නම් තිබෙනවා. නමුත් කියන්න කැමැතියි, දැන් අර එක්සත් ජාතික පක්ෂයේ ගරු මන්ත්‍රීවරයෙක් පෙන්නුවා. පළාත් ක්‍රීඩා උළෙල සුගතදාස ක්‍රීඩා පිටියේ අගෝස්තු 04 වැනිදා පැවැත් වුණු -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා, කරුණාකරලා ඔබතුමා පොඩ්ඩක් නිශ්ශබ්ද වෙලා ගරු මන්ත්‍රීතුමාගේ කථාවට අවධානය යොමු කරන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

පළාත් ක්‍රීඩා උළෙල සුගතදාස ක්‍රීඩා පිටියේ පැවැත් වෙන බව දැනුම් දෙන මේ Invitation එක ලැබුණේ අපට මේ ක්‍රීඩා උළෙල පැවැත් වුණායින් පස්සේ. වියදම් කරලා හදපුවා. ඒ වාගේම තමයි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටම, දිස්ත්‍රික් මට්ටම. පළාත් මට්ටම. අපි ඇමැතිතුමාගෙන් ඇහුවොත් කවුද මන්ත්‍රීවරු සහභාගි වුණේ කියලා, මම දැනුවත්ව මන්ත්‍රීවරයෙක්, දෙන්නෙක් විතරයි සහභාගි වෙලා තිබෙන්නේ. අඩුම ගණනේ ක්‍රීඩා අධ්‍යක්ෂක හැටියට මේ ක්‍රීඩා අමාත්‍යාංශයේ නිලධාරීන් හැටියට අඩුම ගණනේ මන්ත්‍රීවරුන්ට දැනුම් දීලා, දිනය වෙන් කරගෙන, දිනය වේලාසනින් දැනුම් දීලා - මේ Invitation එක පහුවෙලා ගියත් කමක් නැහැ. වේලාසනින් දැනුම් දීලා තිබුණා නම් අපේ මන්ත්‍රීවරුන්ට සහභාගි වෙන්න පුළුවන්. කිසිම සම්බන්ධීකරණයක් නැති නිසා අද ක්‍රීඩා අමාත්‍යාංශයෙන් අවුරුද්දට තිබෙන එකම ක්‍රීඩා උළෙල, සම්බන්ධීකරණය නැති නිසා හරියට කෙරෙන්නේ නැහැ. අද ප්‍රාදේශීය ලේකම් මට්ටමින්, දිස්ත්‍රික් මට්ටමින්, පළාත් මට්ටමින් ජාතික උළෙලට ගිහිල්ලා අද මලල ක්‍රීඩාවට වෙලා තිබෙන දේ හොඳටම අපට දැක ගන්න පුළුවන්.

අනික තමයි, පසුගිය 20 වැනි ආසියානු මලල ක්‍රීඩා ශූරතාවලියට අපේ බස්නාහිර පළාතෙන් ක්‍රීඩකයෝ හතර දෙනෙක් ඉදිරිපත් වුණා. ඒ හතර දෙනා ඉදිරිපත් වෙලා ලෝකඩ පදක්කම දිනා ගත්තා. ඒ ලෝකඩ පදක්කම දිනාගත්ත ක්‍රීඩකයන් හතර දෙනාට නැවත ලෝක මලල ක්‍රීඩා ශූරතාවලියට සහභාගි වෙන්න අවස්ථාව ලැබුණා. ලංකාවේ පළමුවැනි වතාවට. එක ක්‍රීඩකයෙක් ඇවිල්ලා තමුන්ගේ පාවහන් යුගල පාවිච්චි කරන්න බැරි නිසා මේ ක්‍රීඩා අමාත්‍යාංශයට ඇවිල්ලා ඉල්ලුවා ලෝක මලල ක්‍රීඩා ශූරතාවලියට යන්න පාවහන් යුගලක් ලබා දෙන්න කියලා. ඒ යුගල ලබා දෙන්න බැහැයි කියලා ක්‍රීඩකයාව ප්‍රතික්ෂේප කෙරුවා. ඒ නිසා අපි හොඳටම දකිනවා. මේ ක්‍රීඩා අමාත්‍යාංශයේ අධ්‍යක්ෂකතුමා ඇතුළු නිලධාරී මණ්ඩලය නිසා අද ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට මේ මලල ක්‍රීඩාව එපා වෙලා අද දවසින් දවස මලල ක්‍රීඩා ශූරතාවලින් රන් පදක්කම් අපට නැති වෙලා තිබෙනවා.

ඒ නිසා අපි ඉල්ලීමක් කරනවා. මොකද, සමස්ත ලංකා පාසල් ක්‍රීඩා උත්සවයේදී බස්නාහිර පළාත තමයි පළමුවැනි ස්ථානය. වැඩිපුර මලල ක්‍රීඩාවලින් ජයග්‍රහණය ලබන්නේ අපේ බස්නාහිර පළාතේ පාසල් ක්‍රීඩක ක්‍රීඩිකාවෝ. හැබැයි, ඒ ක්‍රීඩික ක්‍රීඩිකාවන් ජයග්‍රහණය කෙරුවායින් පස්සේ ඔවුන්ව ක්‍රීඩා සමාජවලට යොමු කරලා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින්, දිස්ත්‍රික් මට්ටමින්, පළාත් මට්ටමින්, ජාතික මට්ටමට ගෙනෙන වැඩ පිළිවෙළක් නැහැ. මුදල් වෙන් කරලා තිබුණත් ඒ මුදල් හරියාකාරව වියදම් කරමින් වැඩ සටහන් ක්‍රියාත්මක නොකරන නිසා අද දවසින් දවස වන පරිහානිය ,මේ අවුරුදු 4 ½ තුළම ක්‍රීඩාව ගැන කථා කරන අයවැයේදී හැමදාම පැහැදිලි කරලා දුන්නා. නමුත් මෙයට වැඩ පිළිවෙළක් නැති නිසා අද විශාල වශයෙන් මේ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ලොකු අපහසුතාවයකට පත් වෙලා තිබෙනවා. අනික තමයි ජාතික ක්‍රීඩා උළලෙට අපි පළාතෙන් තෝරාගන්න ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට වෙනම පුහුණුවීම් කටයුතු කරලා ඒ අයව පෙළගස්වලා, එක තැනකට ගෙනැල්ලා ජාතික ක්‍රීඩා උළෙලට ගෙනි යනකොට අපට ඒ අවස්ථාව දෙන්න ඕනෑ කියලා අපි පැහැදිලිව කිව්වා. මෙදා පාර ඇඳුමේ Measurement එක, තමුන්ගේ අමාත්‍යාංශයට ගෙනැල්ලා ගන්නකොට පල්ලෙහාට ඇඳුම මහලා ගෙනැල්ලා ඉවරයි. එක Tailor කෙනෙක් ඇවිත් ක්‍රීඩකයාගේ උඩ කොටසේ Measurement එක මනිනවා. මහලා ගෙනැල්ලා පල්ලෙහාත් ඇඳුම් ටික බානවා. ඒ නිසා කිසිම වැඩ පිළිවෙළක් නැහැ.

ඒ වාගේම තමයි ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට අවශ්‍ය උපකරණයක් ලබා දීමේදී හැමදාම කිව්වා ඒ ක්‍රීඩක ක්‍රීඩිකාවන් තෝරාගෙන අවශ්‍ය ක්‍රීඩා උපකරණ දෙන්න කියලා. නමුත් ක්‍රීඩක ක්‍රඩිකාවන් ඉල්ලන උපකරණය නොවෙයි ලබා දීලා තිබෙන්නේ වෙනත් උපකරණ. ඒ අයට දුවන්න පුළුවන්, සෙල්ලම් කරන්න පුළුවන්, ක්‍රීඩා කරනකොට අවශ්‍ය උපකරණ ඉල්ලුවොත්, තමුන්ට ඕනෑ එක නැතිව වෙනත් එකක් දීම නිසා ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ක්‍රීඩාවත් එපා වීම නිසා තමයි අද මේ මලල ක්‍රීඩාවට මේ තත්ත්වය උදා වෙලා තිබෙන්නේ. ඒ නිසා මම ගරු සභාපතිතුමා මාර්ගයෙන් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් සහ ගරු ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ලබන අවුරුද්දේ 40 වැනි ක්‍රීඩා උළෙල එන්නේ. 40 වැනි ක්‍රීඩා උළෙල එනකොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින්, දිස්ත්‍රික් මට්ටමින්, පළාත් මට්ටමින් ක්‍රීඩක ක්‍රීඩිකාවන් ගැන සොයා බලලා මේ ගැන හොඳට අවධානය යොමු කරලා හොඳ අවස්ථාවක් ලබා නොදුන්නොත් ලබන පාර මේ රන් පදක්කම් 06 ත් නැති වෙලා මලල ක්‍රීඩාව එන්න එන්නම නැත්තටම නැති වෙනවා කියලා කියමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

ගරු සභාපතිතුමනි, මම ඔබතුමා මාර්ගයෙන් ගරු ප්‍රධාන අමාත්‍යතුමාට යොමු කරන ප්‍රශ්නයක්. ගරු ප්‍රධාන අමාත්‍යතුමනි, ඔබතුමා දන්නවා ඉංගිරිය සුමනජෝති විද්‍යාලය පමණයි ඉංගිරිය නගරයේ තිබෙන එකම ප්‍රාථමික පාසල. මේ පාසලට ළමයින් ඇතුළත් කිරීමේදී අවුරුදු ගණනාවක් තුළ නගරය ආසන්න පාසල කිට්ටුම දෙමව්පියන්ගේ ළමයින් ඇතුළත් කිරීමට නොහැකියාව උඩ වරින් වර ළමයින් ඇතුළත් කිරීමේ ප්‍රශ්නය මතු වුණා. මේ වසරේත් ඔබතුමා දන්නවා, අන්තිම වසර. මේ ගිය මාසයේ 16 දෙනෙක් ඇතුළත් කළා. ගරු සභාපතිතුමනි, ඒ ඇතුළත් කළ 16 දෙනා මාස අටක් ඉස්කෝලේ යන්නේ නැතිව සිටිය ළමයින්. මේ 16 දෙනාම පාසලට ඉතාම සමීපව ඉන්න ළමයින්. මේ වසරේ ඇති වෙලා තිබෙන ප්‍රශ්නය තමයි, පළමුවැනි වසරට ඇතුළත් කිරීම සඳහා ඉල්ලුම්පත් ලැබිලා තිබෙනවා, පදිංචි දරුවන්ගෙන් පමණක් 282 ක්. මේ පාසලේ පන්ති 06 යි තිබෙන්නේ. පන්තියකට 40 ගණනේ බැලුවාම ඇතුළත් කරන්න පුළුවන් ප්‍රමාණය 240 යි. මෙයින් ක්‍රියාන්විතයෙන් 42 ක් ගන්න වෙනවා. 42 දෙදෙනෙක් අඩු කළාම ඉතිරි වන්නේ 198 යි. පදිංචි

[ ගරු පී.ඩී. අබේරත්න]

අයගෙන් ගන්න වෙන්නේ 50% යි. එතකොට 99 යි. එතකොට 99 ක් ගන්නකොට දැනට ඉල්ලුම් පත්‍ර ලැබිලා තිබෙන ප්‍රමාණයෙන් 168 දෙනෙක්ම ඉන්නේ පාසල අවට ගත යුතුම ප්‍රමාණයේ දරුවෝ. එතකොට මේ 99 ක් ගත්තාම සහෝදර පදනම සහ ආදි ශිෂ්‍ය පදනමෙන් 20 ක් ගන්න පුළුවන්. ඒ 20 ත් අවට ළමයින්ගෙන්ම ගත්තොත් එහෙත් 49 දෙනෙක් ඉතිරි වෙනවා. එතකොට මේ 49 දෙනාගේ දෙමව්පියන්ට විශාල ප්‍රශ්නයකට මුහුණ දෙන්න වෙනවා. මේ ප්‍රශ්නය අවුරුද්දක් අවුරුද්දක් ගණනේ තිබෙනවා. 2009 දී හිටපු ගරු මහ ඇමැතිතුමා 1 වසරට පන්තියක් වැඩි කළා. ඒ වසරට පමණක්. ඒ අවුරුද්දේ පන්තිය මේ වසරේදී අවසාන වෙනවා. එතකොට එක පන්තියක ඉඩ එනවා. පාසලේ අඩුපාඩුකම් තිබෙනවා. පිළිගන්නවා. පාසල් ගොඩනැගිලි නැහැ. ළමයින්ට උගන්වන්න ගුරුවරුන්ගේ අඩුපාඩු තිබෙනවා. මම ගරු ඇමැතිතුමාට කියනවා. දෙමව්පියන්ට තිබෙන්නේ විශාල ප්‍රශ්නයක්. මේ වර්ෂයේදී මේ 49 දෙනා අනිවාර්යෙන්ම ඉතිරි වෙනවා. එතකොට පාසලේ අවට ඉන්න දෙමව්පියන්ට දරුවන්ව ඇතුළත් කර ගන්න බැරිව විශාල ප්‍රශ්නයකට මුහුණ දෙන්න වෙනවා.

මේකට ප්‍රධානම හේතුව තමයි ඉංගිරිය නගරයට තිබෙන්නේ පාසල් දෙකයි. එකක් ගාමිණී මහ විද්‍යාලය. ඒකට හයෙන් ඉහළ දරුවෝ විතරයි යන්නේ. පළමුවැනි වසරට ඇතුළත් කරන්න පුළුවන් සුමනජෝති පාසලට විතරයි. මම ගරු සභාපතිතුමාගේ මාර්ගයෙන් ගරු මහ ඇමැතිතුමාගේ අවධානයට යොමු කරනවා. මේ වසරේ අඩුම ගණනේ එක පන්තියක්වත් වැඩි කරලා දෙන්න. ඒකට අවශ්‍ය ගොඩනැගිලි ලබන වසරේ හදන්න පුළුවන්. මේකට ගොඩනැගිලි වශයෙන් ප්‍රතිපාදන අවශ්‍ය වෙන්නේ නැහැ. මොකද හේතුව 2009 දී ඇති කරපු පන්තිය 5 වැනි වසරෙන් වසර පහකට පසුව මේ අවුරුද්දේදී අවසාන වෙනවා. ලබන වසරේ ඒ පන්තියේ ඉඩ කඩ ලැබෙනවා. ඒකට ගුරුවරයෙක් සොයා ගත්තාම තව පන්තියක් ඇතුළත් කරන්න පුළුවන්. එතකොට අඩුම ගණනේ මේ ළමයින් 40 දෙනාවත් ගත්තොත් නව දෙනෙයි අඩු වෙන්නේ. නගරයට මෙය දැවෙන ප්‍රශ්නයක්. මට විශේෂයෙන් සෑම දෙනෙක්ම ඇවිල්ලා කියනවා. අපේ යසපාල කෝරළගේ ගරු මන්ත්‍රීතුමා ඉන්නවා. එතුමා දන්නවා. එතුමා විශාල මහන්සියක් ගත්තා මේ 16 දෙනා ඇතුළත් කරගන්න. නමුත් ලබන වසරට මීට වැඩිය විශාල ප්‍රශ්නයක් වෙනවා. මේ ඇතුළත් කරන්න ඉන්න ළමයින් මේ පාසල් සීමාවේම ඉන්න, පාසලටම ගත යුතු දරුවෝ. ඒ අයගේ ප්‍රශ්නය විසඳීම අපි කාගේත් යුතුකමක් වෙනවා. ඒ නිසා මම ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ දැඩි අවධානය යොමු කරනවා. ලබන වසරට තව එක පන්තියක් වැඩි කරලා දෙන්න, ඒ අවට ළමයින් ටිකක් ගන්න පුළුවන් වෙන්න. එතකොට එයට අවශ්‍ය ගොඩනැගිලි පහසුකම් ලබන අවුරුද්ද ඇතුළත හැදුවාම පන්තියක් වැඩි වුණාම එක පන්තියක ඉඩ වැඩිවෙන හින්දා මෙය විසඳගන්න පුළුවන් වෙයි කියලා මම විශ්වාස කරනවා. ඒ නිසා මම මේ ගැන මීට වැඩිය කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. මේ ගැන අවධානය යොමු කරලා මේ වසරේදී මේ දරුවන්ගේ ප්‍රශ්නය විසඳීමට අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා පියවරක් ගනියි කියලා දැඩි විශ්වාසයක් ඇතිව මගේ වචන ස්වල්පය අවසන් කරනවා. කාලය දීම පිළිබඳව ගරු සභාපතිතුමාට මම ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු අර්ෂාද් නිසාම්ඩීන්**
Hon. Arshad Nisaamdeen

ගරු සභාපතිතුමනි, අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් බොහොමත්ම ස්තුතියි. 2013 සැප්තැම්බර් මාසයේ 04 වැනි දින බොදුබල සේනා ලේකම් ගලබඩ අත්තේ ඥානසාර හිමියන් විසින් කරපු ප්‍රකාශයක් එක්තරා මාධ්‍ය පත්‍රයක පළ වෙලා තිබුණා. කුඩු කිලෝ ග්‍රෑම් 260 ක ප්‍රමාණයක් ලංකාවේ අහු වුණා. ඒක මුළු රටම දන්නවා. මේ කුඩු ව්‍යාපාරයේ ලංකාවේ මුස්ලිම් අන්තවාදීන් සිටින බවට ඒ ප්‍රකාශයේ සඳහන් කරලා තිබෙනවා. මම උන්වහන්සේගෙන් ඉල්ලා සිටිනවා. මුස්ලිම් අන්තවාදීන් සිටිනවා නම් ඒ මුස්ලිම් අන්තවාදීන් කවුද කියලා එළි කරන්න කියලා. රටේ ආරක්ෂක අමාත්‍යාංශයක් තිබෙනවා. ආරක්ෂක හමුදාව තිබෙනවා. රටේ මුස්ලිම් අන්තවාදීන් සිටිනවා නම් හෙළි කරන්න. ඒකට තවත් ප්‍රකාශයක් එකතු කරලා තිබෙනවා. ආණ්ඩුවේත් මැති ඇමැතිවරු මේකට සම්බන්ධ වෙලා ඉන්නවාය කියලා, ඒකත් එළි කරන්න. එළි කරන්නේ නැතිව මුස්ලිම් ජනතාවට නිකන් බොරු චෝදනා දාන්න එපා කියලා මම උන්වහන්සේගෙන් ඉල්ලා සිටිනවා. ඒ වාගේම තව දෙයක් කියනවා. මේ මුස්ලිම් අන්තවාදීන් කියන අන්තවාදීන් මේ රටේ සිටිනවා නම් මේ වාගේ දේවල්වලට අපිත් ඉඩ දෙන්නේ නැහැයි කියලා මම ප්‍රකාශ කරනවා. ඒ වාගේම මම ඉල්ලා සිටිනවා. මේ කුඩු ව්‍යාපාරය පිටිපස්සේ ඉන්නේ කවුද කියලාත් අපි

දන්නවා. උන්වහන්සේ දන්නවාද දන්නේ නැහැ. මේ මුළු රටේම කුඩු ව්‍යාපාරය ප්‍රචලිත වුණේ 1983 න් පස්සේ තමයි.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ඔබතුමා කියන්න කවුද කියලා.

**ගරු අර්ෂාද් නිසාම්ඩීන්**
Hon. Arshad Nisaamdeen

ආරක්ෂක අමාත්‍යාංශය දන්නවා, කවුද ඉන්නේ කියලා. ඒ ගොල්ලන්ව අත්අඩංගුවට ගන්න. ඒ ගොල්ලන්ව අත්අඩංගුවට ගන්නේ නැතිව මේ මුස්ලිම් ජනතාවට හිරිහැර කරන්න එපාය කියලා මම ඉල්ලා සිටිනවා. අපි දන්නවා, මේ කුඩු ව්‍යාපාරය කොහොමද ආවේ කියලා. කුඩු ව්‍යාපාරයේ එවකට ඩේලු කියලා කුඩු රජෙක් සිටියා. ඔහු කුඩු ගෙනාවේ කොහෙන්ද? ඔහු මුස්ලිම්ද? ඊට පස්සෙත් ඔහුත් එක්ක රවී සිටියා. ගාමිණී සිටියා. ඒ අය මුස්ලිම්ද? මේක ව්‍යාපාරයක්. මේක පාතාලයන් ඇති කරන ව්‍යාපාරයක්. මේකට මුස්ලිම් කියලා නම ගාව ගන්න එපා කියලා ගරු ඇමැතිතුමාගෙන් ඉල්ලනවා. හැම එකකටම මුස්ලිම් අන්තවාදීන්. මුස්ලිම් අන්තවාදීන්. මොකක්ද මේකේ තේරුම. මම ඉල්ලා සිටිනවා, අතිගරු ජනාධිපතිතුමාට හරි කියලා මේ කරන ප්‍රකාශ වහාම නතර කරන්න කියලා. මේ වාගේ ප්‍රකාශයන් කිරීමෙන් අපේ මුස්ලිම් ජනතාවට සැහෙන්න හිත රිදීමක් වෙලා තිබෙනවා. මේ වාගේ බොරු චෝදනා එල්ල කරන්න එපා කියලා මම ඉල්ලා සිටිනවා. මේ බොරු චෝදනා එල්ල කරන්නේ නැතිව මේ කුඩු ව්‍යාපාරය කරන අය අත්අඩංගුවට ගන්න. අත්අඩංගුවට ගන්නේ නැතිව මුස්ලිම් ජනතාවට ඒක යොමු කරන්න එපාය කියලා ඉල්ලනවා.

තව දෙයක් මෙහි කියලා තිබෙනවා. 99% ක්ම මුස්ලිම් ගෑනු හිරේ ඉන්නේ කුඩු විකුණලා තමයි කියලා. උන්වහන්සේ ගිහින් බැලුවාද කියලා මම දන්නේ නැහැ. එහෙම ඉන්නවාද නැද්ද කියලාත් මම දන්නේ නැහැ. වැරැද්දක් කළා නම් ඕනෑ එක්කෙනෙක් හිරේ යනවා. අද රටේ සල්ලිවලට හැම දෙයක්ම කරන්න පුළුවන් කියලා කුඩු ව්‍යාපාරය ප්‍රචලිත කරනවා. කුඩු ව්‍යාපාරයෙන් යැපෙන්නෝ සැහෙන ප්‍රමාණයක් අද රටේ ඉන්නවා. ඒ අයව අල්ලන්නේ නැතිව මුස්ලිම් ජනතාවට අන්තවාදී කියලා, මුස්ලිම් ජනතාවට අවලාද කිරීම ගැන අපේ කනගාටුව ප්‍රකාශ කරනවා. ඒ වාගේම ඔබතුමා මගින් ජනාධිපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. මෙහෙම ප්‍රකාශ කිරීමෙන් අපේ මුස්ලිම් ජනතාව සැහෙන්න කළකිරීමකට පත් වෙලා ඉන්නවා. මේ වාගේ ප්‍රකාශයන් මින් ඉදිරියට නොවන්න වැඩ පිළිවෙළක් කරන්න කියලා ඉල්ලමින් මම නිහඬ වෙනවා.

**ගරු ප්‍රදීප් පෙරේරා**
Hon. Pradeep Perera

ගරු සභාපතිතුමනි, අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙනවා. මතක් කරන්නට ඕනෑ පළමුවෙන්ම මේ රටේ අවුරුදු ගණනක් තිස්සේ යුද්ධයක් තිබිලා අතිගරු ජනාධිපතිතුමා මේ රටට නිදහස ගෙනාවේ අපේ මිනිස්සුන්ගේ ජීවිත පූජා කරලා. අපි ලේ හලලා නිදහස ගෙනාවේ මේ එක එක්කෙනාට ඕනෑ ඕනෑ විධියට අපේ දිස්ත්‍රික්කවල, අපේ රටේ, අපේ සමාජයේ හැසිරෙන්නට නොවෙයි. මම සභාගත කරනවා, 2013 සැප්තැම්බර් මස 22 වැනි ඉරිදා මව්බිම පුවත්පත. උපුටා දක්වන්නේ Ceylon Today පුවත්පතේ නෙරංජලා ආරියවංස ලියපු ලිපියක්. මේකේ කියනවා,

*"එපා කියලා ආයාචනා කරද්දී මාව බලෙන්ම ගහේ බැන්දා. පාක් රෝඩ් ගෙදරකට ගෙනිහින් ලියුමකට බලෙන් අත්සන් ගත්තා. මංම බැඳගත්තා කියලා කියන්න කැමරා අල්ලගෙන බල කළා. ආයේ කවදාවත් ලංකාවේ පස් පාගන්න එන්නේ නැහැ."*

මෙන්න ශ්‍රී ලංකාවේ ඉපදුණු, ගම්පහ දිස්ත්‍රික්කයේ පදිංචි මුස්ලිම් රාජ්‍ය නිලධාරියෙක් කරන ප්‍රකාශයක්. රාජ්‍ය නිලධාරියෙක් කරන ප්‍රකාශයක්. ගම්පහ දිස්ත්‍රික්කයේ සමෘද්ධි නිලධාරියෙක්. එතුමා මේ රටේ රාජ්‍ය නිලධාරියෙක් විධියට වසර 15ක් සේවය කළාට පස්සේ තමයි රට හැර ගිහිල්ලා මේ වාගේ ප්‍රකාශයක් මේ මාධ්‍යට කරන්නේ.

ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාවේ ඔබතුමා හරහා අතිගරු ජනාධිපතිතුමාගෙන් මම ගෞරවනීය ඉල්ලීමක් කරනවා. ඔබතුමා මේ රටේ යුද්ධය ඉවර කරලා, මේ රට සමෘද්ධිය කරා ඉදිරියට ගෙන යන ගමනේ අපේ මිනිසුන්ට යහපත උදා කරන්න ඕනෑ නම්, මේ අයහපත් දේවල් අයින් කරන්නට ඕනෑ. මම නම කියන්න භය නැහැ. මේ කියන්නේ ගරු මර්වින් සිල්වා ඇමැතිතුමාට. පත්තරේ මේ ප්‍රකාශය කරලා තිබෙන්නේ ගරු මර්වින් සිල්වා ඇමැතිතුමාට. මේ පිළිබඳව සොයා බලන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා පාර්ලිමේන්තු ඇමැතිවරයෙකුගේ නම මෙතැන සඳහන් කරන්න එපා.

**ගරු ප්‍රදීප් පෙරේරා**
Hon. Pradeep Perera

ගරු සභාපතිතුමනි, ඒක පත්තරේ තියෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා පත්තරය සභාගත කරන්න.

**ගරු ප්‍රදීප් පෙරේරා**
Hon. Pradeep Perera

ඒක පත්තරේ තියෙනවා. ඕනෑ නම් මම පත්තරේ කියවන්නම්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙක් වශයෙන් හැකිතාක් එවැනි ප්‍රකාශවලින් වළකින්න.

**ගරු ප්‍රදීප් පෙරේරා**
Hon. Pradeep Perera

ආණ්ඩු පක්ෂයේ තියා මොන පක්ෂයේ වුණත් වැරැද්ද නම් වැරැද්ද. වැරැදි නම් වැරැදියි. ජනතාව මහජන නියෝජිතයෙක් විධියට ගෙනැල්ලා තිබෙන්නේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම කියන්නේ හැකිතාක් දුරට -

**ගරු ප්‍රදීප් පෙරේරා**
Hon. Pradeep Perera

මේවා කරන්න නොවෙයි. ඒත් එක්කම මම මතක් කරලා දෙනවා. මෙහිදී ඔහු ප්‍රකාශ කරනවා, මම ආයිත් මේ රටේ පස් පාගන්නේ නැහැයි කියලා. මේ තමන් ඉපදුණු මාතෘ භූමිය. මේ තමන්ගේ ඥාති සමූහයා ජීවත් වන ගම, රට, නගරය. පස් පාගන්නේ නැහැයි කියලා මේ මනුස්සයා ප්‍රකාශයක් කරලා තිබෙනවා. විශේෂයෙන්ම මම ආණ්ඩු පක්ෂයේ, විපක්ෂයේ සියලුම මුස්ලිම් මන්ත්‍රීවරුන්ටත් කියනවා. ඒ වාගේම සමෘද්ධි අධිකාරිය. සමෘද්ධි අධිකාරිය මෙතුමා වෙනුවෙන් කිසිම දෙයක් කරලා නැහැ. (බාධා කිරීම්) එතුමාගේ සාධාරණය වෙනුවෙන් පෙනී හිටලා නැහැ. ඒක තමයි සත්‍ය කථාව.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

මර්වින්ට භයයි.

**ගරු ප්‍රදීප් පෙරේරා**
Hon. Pradeep Perera

මේ පළමුවැනි එක නොවෙයි. මීට අමතරව මේජර් චන්දන ප්‍රදීප් සුසේන්ට පහර දුන්නා. ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ බුද්ධි බලකායේ අතිවිශාල ශ්‍රේෂ්ට රාජකාරියක් කරගෙන මේ බස්නාහිර පළාතේ හිටපු බුද්ධි නිලධාරියෙකුට අභූත චෝදනා නගලා, පහර දීලා ඔහු අද අවලංගු කාසියක් විධියට මුලතිව් දිස්ත්‍රික්කයේ කොණක ඉන්නවා. තමන්ගේ මව් ඒකකයෙන් අයින් කරලා දාලා. අපි මේවාට විරුද්ධයි. රට වෙනුවෙන් වැඩ කරපු මිනිස්සුන්ට පහර දීලා, තමන්ගේ දේශපාලන බලය භයිය පෙන්නලා ඔවුන් අද පැත්තකට දාලා තිබෙනවා. මම අතිගරු ජනාධිපතිතුමාගෙන් ඉතාමත් ගෞරවනීය ඉල්ලීමක් කරනවා. ගරු සභාපතිතුමනි, ඔබතුමා හරහා ගරු ආරක්ෂක ලේකම්තුමාගේ අවධානය මේ වෙනුවෙන් යොමු කරනවා. ඒ වාගේම මම දන්නේ නැහැ, මට ඊයේ පෙරේදා ආරංචියක් ආවා හෙට අනිද්දා ඇමරිකාවට යන්න හදනවයි කියලත්. මම දන්නේ නැහැ මෙයාද කියන එක. මට සැකයක් තියෙනවා මෙයා කියලා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

කවුද මෙයා කියන්නේ?

**ගරු ප්‍රදීප් පෙරේරා**
Hon. Pradeep Perera

මෙයා කියන්නේ මම අර කියපු සිද්ධියට අදාළ අමාත්‍යතුමා. මම දන්නේ නැහැ මේවාට හේතුව මොකක්ද කියන එක. සමහර විට මෙතුමා කිව්වා මුස්ලිම් අන්තවාදීන් එක්ක මොකක්ද කථාවක් කියලා. මම දන්නේ නැහැ එතුමා නම නොකිව්වාට එයාද කියලා මම දන්නේ නැහැ. ඒ නිසා මම මේ බස්නාහිර පළාත් සභාවේ ගරු සභාපතිතුමා හරහා අතිගරු ජනාධිපතිතුමාගෙන් ගෞරවනීය ඉල්ලීමක්

කරනවා. මේ වෙනුවෙන් පෙනී සිටින්න ඕනෑ. අපි අපේ මිනිස්සු රකින්නට ඕනෑ. පක්ෂ පාට භේද මොනවා තිබුණත් මහජනතාව සුරක්ෂිත කිරීම ජනතා නියෝජිතයෝ විධියටත්, අතිගරු ජනාධිපතිතුමාටත්, ගරු ආරක්ෂක ලේකම්තුමා හැටියට එතුමාටත් පැවරෙන රාජකාරිය. මම නැවත නැවත ඉල්ලීමක් කරනවා. අපි මේ රට වෙනුවෙන් ලේ හලපු මිනිස්සු. මේ රට වෙනුවෙන් අතපය පූජා කරපු මිනිස්සු අපි. අපි භය නැහැ. මමත් ජීවත් වෙන්නේ මහර ආසනයේ. කැලණිය ආසනයට අල්ලපු ආසනයේ. ඒ නිසා මේ වෙනුවෙන් සාධාරණය ඉෂ්ට සිද්ධ කරන්නය කියන ඉල්ලීම කරන ගමන් මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්. ගරු සභාපතිතුමනි, මම මුස්ලිම් ජාතිකයෙක් හැටියට එතුමාට ස්තුතිවන්ත වෙනවා මේ රටේ ජීවත්වන මුස්ලිම් ජනතාව වෙනුවෙන් කළ ප්‍රකාශයත්, සිදු වුණු අසාධාරණය පිළිබඳව කථා කිරීම ගැන. මහජන නියෝජිතයෙක් හැටියට, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙක් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා ස්තුති කථාවලට යන්න අවශ්‍ය නැහැ.

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

ස්තුතියක් නොවෙයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය කියන්න කෝ?

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

ජාතිය වෙනුවෙන් -

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා වරප්‍රසාද ප්‍රශ්නය කියන්න.

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

ඒත් එක්කම ගරු සභාපතිතුමනි, අර්ෂාඩ් නිසාම්ඩීන් ගරු මන්ත්‍රීතුමා මුස්ලිම් ජාතිකයන්ට සිදු වුණු අසාධාරණය පිළිබඳව කථා කළා වාගේම මම මතක් කරන්න ඕනෑ දැනට (බාධා කිරීම්) මගේ ජාතිය වෙනුවෙන් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමා ජ්‍යෙෂ්ට මන්ත්‍රීවරයෙක්. කෙටියෙන් වරප්‍රසාද ප්‍රශ්නය කියන්න.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

රීතිය කියන්න.

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

මගේ වරප්‍රසාදය කළුතර දිස්ත්‍රික්කයේ වියන්ගල්ල මුස්ලිම් ජනතාව ජීවත් වන ප්‍රදේශයේ මෙවැනි සිදුවීමක් පසුගිය කාලේ සිද්ධ වුණා. ඒ නිසා ඔබතුමා මගින් නීතිය හා සාමය පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයා හැටියට ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලීමක් කරනවා, මේ මතු වුණු කාරණා සම්බන්ධයෙන්, මේ රටේ ජීවත් වන සියලුම ජාතීන්ගේ ජාතික සමගිය බිඳින්න ඉඩ දෙන්න එපැයි කියන එක ඔබතුමා මගින් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

න්‍යාය පත්‍රයට අනුව මීළඟට තිබෙන්නේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් පරිපූරක ඇස්තමේන්තුව ඉදිරිපත් කිරීම. එසේම දැනට මෙම න්‍යාය පත්‍රයේ තිබෙන පෞද්ගලික මන්ත්‍රී යෝජනාවලින් සිරිකමල් පිලිෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව කිහිප වරක් කල් ගියා. එම යෝජනාවත් අද දින සභාවේ විවාදයට ලක් කිරීමට බලාපොරොත්තු වෙනවා. ඒ නිසා ගරු මන්ත්‍රීතුමන්ලා තේ විවේකය සඳහා විනාඩි 15 ක කාලයක් වැය කර නැවත සභා ගර්භයට පැමිණෙන ලෙසට මම ඉතාමත් ගෞරවයෙන් ආරාධනා කරනවා.

[ ගරු සභාපතිතුමා]

ඒ අනුව දැන් මෙම සභාව පෙරවරු තේ විවේකය සඳහා විනාඩි 15 කට කල් තබනවා.

***ඊට අනුකූලව පළාත් සභාව තාවකාලිකව අත්සිටුවන ලදින් පූ.භා. 11.10 ට යළිත් රැස් විය.***
*Sitting, accordingly suspened untill 11.10 a.m. and then resumed.*

# 2013 පරිපූරක ඇස්තමේන්තුව - 01
## SUPPLEMENTARY ESTIMATE - 01 - 2013

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, *"2013 වර්ෂය සඳහා බස්නාහිර පළාතේ පළාත් සභාවේ අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු හා කාර්යාලවල පහත සඳහන් අවශ්‍යතාවයන් එනම්, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2012 මගින් වැඩි කරන ලද දීමනා, සෞඛ්‍ය අමාත්‍යාංශ පොදු චක්‍රලේඛ අනුව සෞඛ්‍ය ක්ෂේත්‍රයේ වැඩි වූ දීමනා සහ පුද්ගලික පඩිනඩි යටතේ අවශ්‍ය අතිරේක වියදම් දැරීම සඳහා ප්‍රතිපාදන සැලසීම, බස්නාහිර පළාත තුළ ආදාහනාගාර ඉදි කිරීම සඳහා රජයේ ප්‍රදාන වශයෙන් ලැබී ඇති මුදල වියදම් දැරීම සඳහා ප්‍රතිපාදන සැලසීම, පළාත් සභා සංවර්ධන වැඩ සටහන් අපේක්ෂිත ඉලක්ක කරා ළඟා කරවීමට අවශ්‍ය අතිරේක ප්‍රතිපාදන සැලසීම, 2012 වර්ෂයේ ලෝක බැංකු ව්‍යාපෘති යටතේ බස්නාහිර පළාත් සභාවට ලැබී තිබූ නමුත්, ව්‍යාපෘති අනුමත නොවීම හේතුවෙන් ඉතිරිව තිබූ මුදල්, 2013 වර්ෂයේ ක්‍රියාත්මක ද්විතියික පාසැල් දහස සංවර්ධනය කිරීමේ වැඩ සටහන යටතේ මහින්දෝදය විද්‍යාගාර ඉදි කිරීම සඳහා යොදා ගැනීමට අනුමැතිය ලැබී ඇති හෙයින් ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සැලසීම හා ගුරු පුහුණු වැඩ සටහන් සඳහා රජයේ ප්‍රදාන යටතේ ලැබී ඇති මුදල් වියදම් දැරීම සඳහා ප්‍රතිපාදන සැලසීම,යන කරුණු වෙනුවෙන් පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කළ යුතුව ඇති හෙයින් ඒ සඳහා ඉදිරිපත් කරන ලද 2013 පරිපූරක ඇස්තමේන්තුව 01 (පුනරාවර්තන වියදම් රු. 624,746,000/-, මූලධන වියදම් රු. 793,000,000/-, මුළු ප්‍රතිපාදනය රු. 1,417,746,000/-) අනුමත කළ යුතුය."* යන යෝජනාව ඉදිරිපත් කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

ගරු සභාපතිතුමනි, ස්තුතිවන්ත වෙනවා අවස්ථාව ලබා දීම ගැන. මම හිතන්නේ, මේ අවුරුද්දේ පළාත් සභාවේ අවසාන පරිපූරකය වෙන්න ඕනෑ කියලයි. පසුගිය කාලයේ පරිපූරක වාගේ ඉදිරිපත් වුණත් මෙවර පරිපූරක සීමා කරගෙන ඉදිරිපත් කිරීම පිළිබඳව මම විශේෂයෙන්ම සතුටු වෙනවා. ඒ වාගේම මේ පරිපූරකයේ මූලධන වියදම් 50% ක් තිබෙනවා. ඒ වාගේම පුනරාවර්තන වියදම 50% ක් පමණ තිබෙනවා. නමුත් මූලධන වියදමේදී විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ - පරිපූරකය පිළිබඳව නිරන්තරයෙන්ම අපේ අදහස් ප්‍රකාශ කරන්නේ, මූල්‍ය කළමනාකරණය පිළිබඳව. ඔබතුමා මාර්ගයෙන් ගරු ප්‍රධාන ඇමැතිතුමාට මේ අදහස් ඉදිරිපත් කරන්න වෙනවා. විශේෂයෙන්ම මම ගිණුම් කාරක සභාවේ සාමාජිකයෙක් හැටියට මෙය සාකච්ඡා කිරීමේදී පසුගිය වර්ෂවල අපි දකිනවා මූල්‍ය පරිපාලනය පිළිබඳව හරි දැක්මක් නැතුව කටයුතු කරපු බවක්. ඒ වාගේම හරි පාලනයක් නොමැතිව කටයුතු කරපු බවක්. ඒ නිසා මේ පිළිබඳව ගරු සභාපතිතුමනි ඔබතුමා මගින් මුදල් විෂයය භාර අමාත්‍යවරයා හැටියට ගරු ප්‍රධාන ඇමැතිතුමාට මතක් කරන්න ඕනෑ, මේ පිළිබඳව අවධානය යොමු කරන්නය කියන එක.

දැන් මොහොතකට කලින් අපේ මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළෙත් මූල්‍ය පාලනය පිළිබඳව ඇති වෙලා තිබෙන ප්‍රශ්න සම්බන්ධව. ක්‍රීඩා අමාත්‍යාංශය ගැන කථා කළත් එතුමා පෙන්නුම් කළේ ඒකයි. මේ මුදල් නිසි ලෙස ආයෝජනය වෙලා නැහැ. මේ මුදල් නිසි ලෙස ප්‍රයෝජනයට අරගෙන නැහැ. ඇඳුම් සූදානම් කරනකොට ඇඳුම් මහලා ඉවරයි කියලා එතුමා උදාහරණයක් හැටියට පෙන්නුවා. දැන් මෙතැන කොහේ හරි ප්‍රශ්නයක්, අඩුවක් තිබෙනවා ගරු සභාපතිතුමනි. ඒ නිසා ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කරනවා. ගරු සභාපතිතුමනි, මම මීට කලිනුත් මතක් කරලා තිබෙනවා. මේ මුදල් පාවිච්චි කිරීමේදී යටිතල පහසුකම් අතින් අපට මීට වඩා සංවර්ධනය කරන්න තිබුණා. එතැනදී අනෙකුත් ව්‍යාපෘති දිහාත්, අනෙකුත් වියදම් දිහාත් ගැඹුරට අධ්‍යයනය කරන්න වෙනවා. විශේෂයෙන්ම මේ මුදල් ලබා ගැනීමේදී විශාල දුෂ්කරතාවයකට ඔබතුමාට මුහුණ දෙන්න සිදු වෙනවා. අපට තිබුණු ආදායම මධ්‍යම රජය අරගෙන කටයුතු කරගෙන යන නිසා පළාත් සභාවේ ආදායම් තත්ත්වය හුඟක්

අඩු වෙලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, මධ්‍යම රජයෙන් දැනට යෝජනා කර ඇති පරිදි භාණ්ඩාගාරයෙන් දෙන ප්‍රතිපාදන අනුව තමයි අපට දැන් කටයුතු කරන්න වෙලා තිබෙන්නේ. මම විශේෂ ඉල්ලීමක් කරනවා. පසුගිය කාලයේ අපි දැකපු අඩුපාඩුකම් පිළිබඳව. එක අවස්ථාවක අපි ඔබතුමා ගෙන්නලා සාකච්ඡා කළා, මේ සම්බන්ධව සාකච්ඡා කරන්න ඕනෑ කියලා. මෙන්න මෙතැනදී විගණකාධිපතිවරයා පවා පෙන්නුම් කරනවා, නිවැරැදි මූල්‍ය කළමනාකරණයක් මත කටයුතු කරන්න ඕනෑය කියලා. එතැනදී මුදල් පාවිච්චි කිරීමේදී ඵලදායීතාවයක් නැහැයි කියන එක පැහැදිලි වුණා. මේ මහජන මුදල්. ඔබතුමා භාණ්ඩාගාරයෙන් ලබා ගත්තත්, පළාත් සභාවෙන් ලබා ගත්තත්, පළාත් සභාවේ තැන්පතුවලින් කටයුතු කරන්න ඕනෑ කියලා ලබා ගත්තත් මේවා මහජන මුදල්.

විශේෂයෙන්ම මෙතැනදී දැඩි ලෙස මූල්‍ය කළමනාකරණය පිළිබඳව අවධානය යොමු කරන්න. දැඩි මූල්‍ය පාලනයක් කරන්න කියන එකයි මම ඔබතුමාගෙන් ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටින්නේ. ඒ නිසා පරිපූරකය ඉදිරි මාස කිහිපය ඇතුළත - තව මාස දෙකයි තියෙන්නේ. නොවැම්බර් වනකොට අපේ අලුත් ඇස්තමේන්තුව ඔබතුමාට ඉදිරිපත් කරන්න පුළුවන් වෙනවා. එම නිසා පරිපූරකයේ මුදල් ඉතිරි නොවන විධියට විදයම් කරලා ඵලදායීතාවයක් අපට ලබා දෙන්න කියන එකයි විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ. ඒ සඳහා අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, අධිකාරී වාගේ ආයතනවල මූල්‍ය පාලනය ඉතා වැදගත් වෙනවා. ඒවායේ යම් යම් සම්පත් ලබාගෙන, යෝජනා ඉදිරිපත් වෙලා ව්‍යාපෘතිය නිසි ඇගයීමක් වෙලා නැහැ. ඇගයීමට ලක් වෙනවා නම්, ඒ ව්‍යාපෘති ඉදිරිපත් වුණු වෙලාවේ නිවැරැදි සැලසුමක් ඇතුව සාකච්ඡා කරලා මෙපමණයි කියන එක කල්පනා කරනවා නම් මම හිතන විධියට අපට මූල්‍ය පාලනයක් ඇති කරගන්න පුළුවන්. උදාහරණයක් විධියට ක්‍රීඩා අමාත්‍යාංශය පමණක් නොවෙයි, පසුගිය කාලවල අපි නිවාස යෝජනාවක් ගැන කථා කරලා ඒ යෝජනාවේ ප්‍රතිඵල අද වනකල් අපට ලබා ගන්න බැරුව ගියා. ඒ අය මුදල් පවා පාවිච්චි කරලා ලක්ෂ ගණන් මුදල් පවා අපට අහිමි වෙලා තිබෙනවා. ඒ නිසා මේ නාස්තිය පිළිබඳව, හරි කළමනාකරණයක් පිළිබඳව තමයි මම මගේ අදහස් හැටියට සහ අපේ කණ්ඩායමේ අදහසක් හැටියට ගරු සභාපතිතුමා මාර්ගයෙන් ඉදිරිපත් කරන්නේ. ඒ නිසා මෙම ඇස්තමේන්තුව ඉදිරිපත් කිරීම පිළිබඳව මගේ විරුද්ධත්වයක් නැහැ. ඉල්ලීමක් කරන්නේ මේ නව වැනි මාසේ අවසන් සතියේ අපි ඉන්නේ. දහය, එකොලාහ යන මාස දෙක ඇතුළත අඩුම ගාණේ දෙසැම්බර් 15 වැනිදාට කලින් හරි ඒවා නිසි ලෙස ආයෝජනය වන විධියට ඵලදායී ලෙස ක්‍රියාත්මක කරන්න කියලා මම විශේෂයෙන් ඉල්ලීමක් කරනවා. ස්තුතියි.

**ගරු ඩී.ඒ. චන්ද්‍රභානු**
Hon. D.A. Chandrabhanu

ගරු සභාපතිතුමනි, 2013 අවුරුද්දේ පරිපූරක ඇස්තමේන්තුව සභාවට ඉදිරිපත් කරපු වෙලාවේ ඒ සම්බන්ධව වචන කිහිපයක් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ප්‍රථමයෙන් මම ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන් අපි දන්නවා, පරිපූරක ඇස්තමේන්තුවක් සභාවකට එන්නේ ඒ නියමිත වර්ෂය තුළදී සභාවේ - 2012 අවුරුද්දේ අවසානයේ අපි 2013 සඳහා අයවැය ඇස්තමේන්තුවක් ඉදිරිපත් කළා. ඊට පරිබාහිරව පළාත් සභාවට ප්‍රතිපාදන ලැබෙනකොට, ඒ වාගේම අතිරේක වියදම් සඳහා ලැබෙනකොට මේ සියල්ල වෙනුවෙන් පිළියෙල කරපු ලේඛනයක් හැටියට තමයි මෙය ඉදිරිපත් වෙන්නේ. එක පැත්තකින් ගත්තාට පස්සේ මේ පරිපූරකය ඉදිරිපත් කරන්නේ, රජයේ නිලධාරීන්ගේ පඩි වැඩි වීම සම්බන්ධව. ඒ අයට වැඩි කිරීම් ලබා දෙන්නටත් අනෙකුත් දීමනා ලබා දීමටත්. ඒ වාගේම පළාත් සභාවේ අපි ඇස්තමේන්තු කරපු ආදායම් මට්ටමට වඩා, ආදායම් ශීර්ෂයන් හරහා වැඩි ප්‍රමාණයක් ලැබීම නිසා ඒ තුළින් පළාත් සභාව ඉලක්ක කර ගත්තු අපේක්ෂිත සංවර්ධන ඉලක්කයන් තවදුරටත් සාක්ෂාත් කර ගැනීමට බලාපොරොත්තු ඇතිව තමයි මේ පරිපූරක ඇස්තමේන්තුව සභාවට ඉදිරිපත් කරලා තිබෙන්නේ.

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම මිලියන 1,417,746,000 ක පරිපූරක ඇස්තමේන්තුවක් අද ඉදිරිපත් වෙලා තිබෙන්නේ. මේ මිලියන 1,417,746,000 තුළ පළාත් සභා ආදායම තුළින් මිලියන 500 ක් අපට වැඩිපුර ලැබිලා තිබෙනවා. ඒ මිලියන 500 අපට අදාළ වුණේ, 2013 අයවැය ලේඛනය තුළින් ඇස්තමේන්තු කරපු නොයෙක් නොයෙක් ක්‍රමවේදයන් මගින් අපි ඇස්තමේන්තු කරපු ප්‍රමාණයට වඩා ආදායම් වැඩිවීම සිදුවීම තුළින් විශේෂයෙන් මෙරට මත්පැන් බලපත්‍ර ගාස්තු හැටියට අපි ඇස්තමේන්තු කරපු මුදලට වඩා මිලියන 15 ක වැඩිවීමක් අපට දකින්න පුළුවන් වෙලා තිබෙනවා. ඒ වාගේම තැගි බදු මිලියන 30 ක්. ඉඩම් හා අනෙකුත් බදු කුලී මිලියන 20 ක්. විශේෂයෙන්ම, මෝටර්

[ ගරු ඩී.ඒ. චන්ද්‍රභානු ]

රථ ප්‍රවාහන පනත මගින් අපට ඇස්තමේන්තු කරපු මුදලට වඩා මිලියන 455 ක මුදලක් වැඩිපුර ලැබීම නිසාවෙන් පළාත් සභාවේ ආදායම් ප්‍රමාණය මිලියන 500 ක පමණ වර්ධනයක් දකින්න පුළුවන් වෙනවා.

ඒ වාගේම මධ්‍යම රජය හරහා, එදා ඔබට මතක ඇති මහින්ද චින්තන වැඩ සටහන යටතේ අපේ පාසල්වල මහින්දෝදය විද්‍යාගාර වෙනුවෙන් මම හිතන්නේ, 2012 අවුරුද්දේ මිලියන 126 ක මුදලක් ලැබිලා එය වියදම් කරගන්න බැරි වෙලා, නැවත 2013 අවුරුද්දේ එය ක්‍රියාත්මක කිරීමට මිලියන 126 ක මුදලක් ලැබිලා තිබෙනවා. ඒ වාගේම අද පළාත් සභාව තුළ බොහොම අත්‍යවශ්‍ය අංගයක් බවට පත් වෙලා තිබෙන ආදාහනාගාර ඉදි කරන්නට මධ්‍යම රජය හරහා මිලියන 67 ක මුදලක් පළාත් සභාවට ලැබිලා තිබෙනවා.

විශේෂයෙන්ම අපි දන්නවා පළාත් සභාවේ සමස්ත වැයෙන් 60% කට ආසන්න ප්‍රමාණයක් වැය කරන්නේ අධ්‍යාපනයට. එහෙම වැය කරනකොට ඒකේ ප්‍රධාන කොටස්කාරයෝ බවට පත් වෙලා ඉන්නේ ගුරුවරු. ගුරුවරුන්ගේ දැනුමට නිති පතාම පුහුණුව අවශ්‍ය වෙනවා. යාවත්කාලීන කරන්න වෙනවා. ඒ ගුරු පුහුණු කටයුතු වෙනුවෙන් මිලියන 100 ක් අපට මධ්‍යම රජය හරහා ලැබිලා තිබෙනවා. මෙන්න මේ කාරණා හේතුකොටගෙන තමයි අද මේ පළාත් සභාවට මෙම පරිපූරක ඇස්තමේන්තුව ගෙන එන්න වෙලා තිබෙන්නේ.

විශේෂයෙන්ම මම හිතන්නේ මේ පරිපූරක ඇස්තමේන්තුවේ පුනරාවර්තන වියදම් හැටියට වැඩි කරපු පඩි නඩි සහ අනෙකුත් දීමනා වෙනුවෙන් මිලියන 624,746,000 ක් වැය කරන කොට කලින් සඳහන් කරපු ගුරු පුහුණුවට, ආදාහනාගාර වැඩි දියුණු කරන්නට, ඒ වාගේම පළාත් සභාවේ අපේක්ෂිත ඉලක්කයන් සාක්ෂාත් කරගෙන සංවර්ධනය තවත් වැඩි කර ගන්නට, ඒ වාගේම මහින්දෝදය විද්‍යාගාර ගොඩ නගලා, ඒ තුළ භාෂාගාර ඒ වාගේම තාක්ෂණික විද්‍යාගාර, ගණිතාගාර වැනි මේ දේවල් වෙනුවෙන් මිලියන 126 ක මුදල් මේ අවුරුද්දේදී අපට ලබා දෙන්න පුළුවන් වෙනවා. ඒ වාගේම විශේෂයෙන්ම පළාත් සභාවේ පාසල්වල දැවෙන ප්‍රශ්නයක් වුණු අඩක් නිම කළ ගොඩනැගිලිවල ඉතිරි වැඩ සම්පූර්ණ කරන්නත් මේ පරිපූරක අයවැය තුළින් මිලියන විශාල මුදලක් වෙන් කරලා පළාත් සභාවේ අපි අපේක්ෂිත ඉලක්කයන් කරා ගමන් කරන්නට හොඳ පාලමක් බවට මෙම පරිපූරක ඇස්තමේන්තුව පත් වුණාය කියන එක මේ වෙලාවේ සඳහන් කරන්න ඕනෑ. ඒ නිසා මම හිතන්නේ මේ පළාත් සභාව නියෝජනය කරන හැම මන්ත්‍රීවරයෙක්ම කැමැතියි තමන්ගේ පාසල්වල දරුවන්ගේ අධ්‍යාපනයට අවශ්‍ය කරන යටිතල පහසුකම් ටික දියුණු කරන්නට. ඒ වෙනුවෙන් තමයි මිලියන 126 ක මුදලක් අපට මධ්‍යම රජයෙන් ලැබෙන්නේ. ඒ මහින්දෝදය විද්‍යාගාර ගොඩනගන්නට. ඒ වාගේම අර ගුරුවරුන්ගේ ගුරු පුහුණුව වෙනුවෙන් මිලියන 100 ක මුදලක් අපට ලැබෙන්නේ, අපේ දරුවන්ගේ අනාගතය වෙනුවෙන්. ගුරුවරුන්ගේ පුහුණුව, දැනුම යාවත්කාලීන කරන්නට.

ඒ වාගේම දැවෙන ප්‍රශ්නයක් වුණු ආදාහනාගාර ඉදි කරන්නට මිලියන 67 ක මුදලක් ලැබෙනකොට මේ සියල්ල තුළින් අඩක් නිම කරපු ගොඩනැගිලි ඉදි වන කොට මේ සියල්ලෙන්ම වෙන්නේ පළාත් සභාවේ අවශ්‍ය කරන සංවර්ධන ඉලක්කයන් කරා අපට ගමන් කරන්නට පුළුවන් වීමයි. ඒ නිසා මම හිතන්නේ, මේ පරිපූරක ඇස්තමේන්තුවට පක්ෂ භේදයකින් තොරව පුද්ගල භේදයකින් තොරව අපි සියලු දෙනාම මේකට සහයෝගය දීමේ වගකීම අපි සතු වෙනවා කියන එක ප්‍රකාශ කරමින් අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, ඔබතුමා හරහා සියලුම ගරු මන්ත්‍රීවරුන්ට මම විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා. මේ පරිපූරකය අනුමත කරන්නට එකඟවීම පිළිබඳව. මෙතැනදී අපේ චන්ද්‍රභානු අදිකාරම් ගරු මන්ත්‍රීතුමා පැහැදිලි කිරීමක් කළා, මේ ප්‍රතිපාදන වෙන් කරන්නේ කොහොමද කියන කාරණාව සම්බන්ධව. මෙතැන්දී ගරු සභාපතිතුමනි, අංක 02 යටතේ, *"බස්නාහිර පළාත තුළ ආදාහනාගාර ඉදි කිරීම සඳහා රජයේ ප්‍රදාන වශයෙන් ලැබී ඇති මුදල වියදම් දැරීම සඳහා ප්‍රතිපාදන සැලසීම"* කියන කාරණාවේදී පැහැදිලි කරන්න ඕනෑ මේ වනකොට භාගෙට ඉදි කරපු ආදාහනාගාර විශාල ප්‍රමාණයක් පළාත් සභාව තුළ තිබෙනවා. ඒ ආදාහනාගාර වැඩ අවසන් කිරීම සඳහා තමයි මේ ප්‍රතිපාදන වෙන් කරන්නේ. අපි අලුතෙන් ආරම්භ කරන්න නොවෙයි. පළාත් පාලන ආයතනවලින්

ඒ කටයුත්ත සිදු විය යුතු කාරණාවක්. නමුත් මේකට පළාත් පාලන ආයතනවල ප්‍රතිපාදන නොමැති නිසා රජයෙන් අපි ඉල්ලීමක් කළා. අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් තිබුණු රැස්වීමේදී මේ කාරණාව අපි දැනුවත් කළාම විශේෂයෙන්ම මම එතුමාට ස්තුතිවන්ත වෙනවා. විශේෂ මුදලක් මේ පළාත් සභාවට ලබා දෙන්න කටයුතු කළා. මේ ආදාහනාගාරවල කටයුතු කරන්න. ඒ වාගේම අපේ පළාත් සභා පාසල්වල මහින්දෝදය තාක්ෂණ විද්‍යාගාර සකස් කිරීම මේ වනකොට සිදු වෙමින් යනවා. ඒ සඳහා අවශ්‍ය කරන මුදල් ලෝක බැංකුවෙන් ලබා ගැනීමට ඇති වුණු ප්‍රමාදය නිසා තමයි මේක ප්‍රමාද වුණේ. ඒ මුදල් ලැබීම නිසා ඒ මුදල් වියදම් දැරීමටත් මේ පරිපූරකය අපි පාවිච්චි කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම ගරු සභාපතිතුමනි, අපි මේ පළාත් සභාවේ ගුරු පවුර වැඩ සටහන පසුගිය දවසක හඳුන්වා දුන්නා. මන්ත්‍රීවරු ඒකට සහභාගී වුණා. මේ ගුරු පවුර වැඩ සටහනේ එකක් තමයි ගුරුවරුන්ට අවශ්‍ය කරන සුහසාධන කටයුතුවලට වැඩි අවධානයක් යොමු කළ යුතුයි කියන කාරණය. අද පාසල්වලට විශාල වශයෙන් භෞතික සම්පත් ලබා දීලා තිබෙනවා.

ඒ වාගේම ගුරු පුරප්පාඩු නැති කරන්න අපි කටයුතු කරලා තිබෙනවා. එදා ළමුන් 25 ක් 27 කට එක ගුරුවරයයි හිටියේ. අද ළමුන් 20 කට 22 කට එක ගුරුවරයෙක් ලබා දෙන්න කටයුතු කරලා තිබෙනවා. ඒ වාගේම ඒ ගුරුවරුන්ට අවශ්‍ය කරන පුහුණුව ලබා දෙන්න මේ ව්‍යාපෘතිය යටතේ අලුතෙන් බඳවා ගත්තු ගුරුවරු විශාල ප්‍රමාණයක් මේ ප්‍රාථමික ගුරු පුහුණුව ලබා ගන්න කටයුතු කරලා තිබෙනවා. එදා පුහුණු ගුරුවරු හැටියට අපට හිටියේ 52% ක් වාගේ ප්‍රමාණයක්. මේ වර්ෂය අවසන් වනකොට සියයට සියයක් ප්‍රාථමික ගුරු පුහුණුව ලබා දෙන්න අපි කටයුතු කරනවා. ඒ වාගේම ලබන අවුරුද්දේ මුල් මාස හය ඇතුළත අනෙක් විෂයයන්වලට අවශ්‍ය කරන ගුරු පුහුණුවත් ලබා දෙන්න කටයුතු කරනවා.

ඒ වාගේම ගරු සභාපතිතුමනි, පසුගිය දවස්වල අපි මේ පිළිබඳව වැඩි අවධානයක් යොමු කළා. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ ඉන්න රාජ්‍ය සේවකයෝ ගැන. රාජ්‍ය සේවකයින්ට පළාත් රාජ්‍ය සේවාව සහ රාජ්‍ය සේවාව අතර තිබෙන සංස්ටනය නිසා අපේ නිලධාරීන් ගොඩක් වෙලාවට තමන්ට සුදුසු තැනක් එනකොට මධ්‍යම රජයේ රාජ්‍ය සේවාවට යන්න බලනවා. නමුත් ඒ තත්ත්වය නැති කරන්න අපි කල්පනා කළා. මේ රාජ්‍ය සේවකයන්ට අවශ්‍ය කරන සුහසාධන පැත්ත වැඩි කරන්න. තව මාස දෙකක කාල සීමාවක් තුළ අපි මේක ආරම්භ කරන්න පටන් ගන්නවා. මේ පරිපූරකයෙන් අපි ඒ සඳහා මුදල් වෙන් කරනවා. අපේ පළාත් රාජ්‍ය සේවයේ ගුරුවරු තිස් තුන්දාහක් වාගේ ප්‍රමාණයක් ඉන්නේ. ආරම්භයේදී ඒ තිස්තුන්දාහක ගුරුවරු ආවරණය කරලා අනතුරුව හැට හයදායක් ආවරණය වන පරිදි සෑම කෙනෙකුට රක්ෂණාවරණයක් ලබා දෙන්න අපි කටයුතු කරලා තිබෙනවා. එතැනදී රක්ෂිතයා මිය ගියොත් ලක්ෂ 05 ක්. හදිසි අනතුරකින් මිය ගියොත් ලක්ෂ 05 ක්. ඒ වාගේම Permanent Disability එකක් වුණොත් ලක්ෂ 05 ක්.

ඊට වඩා වැදගත්ම කාරණාව ගරු සභාපතිතුමනි, ප්‍රධාන ලෙඩ 24 කට, උදාහරණයක් හැටියට හෘදයාබාධයක් වෙලා Operation එකක් කරන්න ගියොත් අපේ ගුරුවරු අද අසරණ වෙනවා. ඒ අයට මුදල් හොයන්න හැම තැනම යන්න වෙනවා. ඒ වාගේ ප්‍රධාන Operation 24 කට ලක්ෂ 05 ක මුදලක් දෙනවා. මේ සඳහා අපි රක්ෂණ සමාගමක් එක්ක සම්බන්ධ වෙලා රුපියල් 900 ක වාර්ෂික වාරිකයකට ඒ රක්ෂණාවරණය ඒ අයට ලබා දෙන්න කටයුතු කරනවා. ගුරුවරයාගෙන් අපි අවුරුද්දට අය කරන්නේ රුපියල් 450 යි. ඉතුරු රුපියල් 450 මේ පරිපූරකය හරහා ගුරුවරුන්ට අපි ලබා දෙන්න කටයුතු කරනවා. මෙතැනදී ගුරුවරයෙකුට දවසකට රුපියල් 2.50 ක වාගේ මුදලක් වැය වෙන්නේ. ඒ නිසා ගුරුවරුන්ගේ සුහසාධන පැත්ත වැඩි දියුණු කරන්න මේ පරිපූරකයෙන් අපි බලාපොරොත්තු වෙනවා. මම හිතන්නේ කිසිම පළාත් සභාවක් හෝ රජයක් මේ සම්බන්ධයෙන් කටයුතු කරලා නැහැ. නමුත් පළාත් සභාවක් හැටියට මේ පළාත් සභාවේ ඉන්න රාජ්‍ය සේවකයන්ගෙන් වැඩි වැඩ කොටසක් ලබා ගන්නකොට, ඒ අය විශාල සේවාවක් සපයනකොට ඒ අයගේ පැත්ත බලලා අපි මේ කටයුත්ත කරන්න බලාපොරොත්තු වෙනවා කියන කාරණාව මතක් කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

## 2013 පරිපූරක ඇස්තමේන්තුව - 01 ට අදාළ විසර්ජන ප්‍රඥප්තිය
APPROPRIATION STATUTE RELEVANT TO THE SUPPLEMENTARY ESTIMATE - 01 - 2013

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, *"2013 වර්ෂයේ පරිපූරක ඇස්තමේන්තුව 01 සඳහා අවශ්‍ය රුපියල් එක්සිය හතළිස් එක් කෝටි හැත්තෑ හත් ලක්ෂ හතළිස් හය දාහක් (1,417,746,000/-) වූ මුදල බස්නාහිර පළාත් සභා අරමුදලින් ගෙවීමටත්, එකී බස්නාහිර පළාත් සභා අරමුදලට ශ්‍රී ලංකා ආණ්ඩුවෙන් ප්‍රදාන වශයෙන් හෝ වෙනත් ආකාරයකින් ලැබෙන මුදල් භාර ගැනීමටත් බලය දෙනු ලබන 2013 අංක ........ දරන විසර්ජන ප්‍රඥප්තිය අනුමත කළ යුතුය."*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

## පෞද්ගලික මන්ත්‍රී යෝජනාව :
PRIVATE MEMBERS MOTION:

## පළාත් පාසල් නඩත්තුව සඳහා වෙනත් ක්‍රමවලින් ලැබෙන මුදල් විධිමත්ව ලබා ගැනීමේ ක්‍රමයක් ඇති කිරීම
ESTABLISHING A METHOD TO PROPERLY OBTAIN MONEY RECEIVED IN OTHER WAYS FOR PROVINCIAL SCHOOL MAINTENANCE

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ගරු සභාපතිතුමනි, *"ශ්‍රී ලංකාව නිදහස් අධ්‍යාපනය ක්‍රියාත්මක වන රටක් බව ප්‍රකාශිතය. එහෙත් රට තුළ මධ්‍යම රජය, පළාත් සභා, පෞද්ගලික, ජාත්‍යන්තර යනුවෙන් පාසැල් පද්ධතියක් ක්‍රියාත්මකව ඇති බව අපි දනිමු. මේ අතරින් බහුතර පාසැල් සංඛ්‍යාව අයත් වන්නේ පළාත් සභාවලටය. මෙම පළාත් සභාව වාර්ෂික අයවැය මගින් ප්‍රතිශතයක් ලෙස වැඩිම මුදල් ප්‍රමාණයක් වෙන් කරනු ලබන්නේ ප්‍රධාන අමාත්‍යවරයා නියෝජන කරන අධ්‍යාපන අමාත්‍යාංශයටය. එහෙත් අප පළාතේ පාසැල් නඩත්තුව සඳහා වාර්ෂිකව වෙන් කරනු ලබන මුදල ප්‍රමාණවත් නොවන බව බලධාරීන් විසින්ම ප්‍රකාශ කිරීම හේතුවෙන්, දෙමව්පියන්, ආදි සිසුන්, සුභ පතන්නන් හා වෙනත් විවිධ ක්‍රම මගින් විදුහල්වල අඩුපාඩු සකස් කර ගන්නා බව නොරහසකි. අවිධිමත් ලෙස සිදුවන මෙම ක්‍රියාවලිය නිසා දෙමාපියන්, සිසුන් පත් වන අපහසුතාවය මග හරවා ගැනීම සඳහා විධිමත් ක්‍රමෝපායක් කඩිනමින් සකස් කළ යුතු යැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් කරයි."*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා** – විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

***[විසින් ස්ථිර කරන ලදී.]***
*[Seconded]*

[පූ.භා. 11.34]

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ගරු සභාපතිතුමනි, මෙම යෝජනාව න්‍යාය පත්‍රයේ ඇතුළත් වෙලා විවිධ හේතූන් නිසා අවස්ථා හතරක් පහක්ම සාකච්ඡා කිරීමට අවස්ථාව ලැබුණේ නැහැ. නමුත් අද වාගේ දවසක ගරු ප්‍රධාන අමාත්‍යතුමා මේ සභාවේ සිටීම වැදගත් වන නිසා මෙම යෝජනාව ඉදිරිපත් කරන්න ලැබීම ගැන මම සන්තෝෂ වෙනවා. විශේෂයෙන්ම මේ යෝජනාව ඉදිරිපත් කරන්න මූලික හේතුව වුණේ, 2012 වර්ෂයේත් ඊට පෙරත්, මේ පාසල්වලට ළමුන් ඇතුළත් කිරීමේදී මේ රටේ විශාල ආන්දෝලනාත්මක තත්ත්වයක් ඇති වුණා. එයින් මේ බස්නාහිර පළාත් සභාව සුවිශේෂී තත්ත්වයක් ගත්තා. දැන් 2012 දරුවන් 2013 වර්ෂයට ඇතුළත් කරලා අවසානයි. දැන් 2014 වර්ෂයට දරුවන් ඇතුළත් කර ගැනීමට මේ දවස්වල සම්මුඛ පරීක්ෂණ පවත්වාගෙන යනවා. ඒ යන අවස්ථාවලදීත් විවිධ ආකාරයට ජනමාධ්‍ය මගින් දැනුවත් වන ආකාරයට මේ සිදු වන අවිධිමත් ක්‍රියාමාර්ගය සහ සිදු වන දූෂණ පිළිබඳව මම හිතන්නේ, සභාව නියෝජනය කරන මන්ත්‍රීතුමන්ලා හැටියට අපි හැමෝටම දැන ගන්නට ලැබිලා තිබෙනවා. විශේෂයෙන්ම අද මේ සභාවේ විශේෂ ප්‍රකාශයක් කරපු පී.ඩී. අබේරත්න මන්ත්‍රීතුමා, කළුතර දිස්ත්‍රික්කයේ එතුමාගේ කොට්ඨාශයේ තවමත් පාසල්වලට ඇතුළත් කර ගන්න බැරිව සිටින දරුවන් පිළිබඳව මේ සභාවේ දැනුවත් කිරීමක් කළා. මේ තත්ත්වය නිසා ඇත්ත වශයෙන්ම හැම අවුරුද්දකම මේ පාසල්වලට දරුවන් ඇතුළත් කිරීමේදී

සිදු වන ක්‍රියාදාමය නිසා දෙමව්පියන්, දරුවන්, ගුරුවරුන්, විදුහල්පතිවරුන් වාගේම සමාජයේ විවිධ තලවල ඉන්න අය ඉතාමත් අසීරුතාවයට පත් වෙනවා. එතකොට මේ සභාවට මම හිතන්නේ, ඕනෑ නම් තව මාස දෙක තුනක ආයුෂ කාලයක් තියෙයි. මේ පස් වන පළාත් සභාවට. ගරු ප්‍රධාන අමාත්‍යතුමාට පූජනීය වගකීමක් තිබෙනවා. මම හිතන්නේ, එතුමා මේ සභාවේ බොහොම ශක්තිමත්ව හිටපු ප්‍රධාන අමාත්‍යවරයා හැටියට - මේ පළාත් සභා ඉතිහාසයේ පස්වන පළාත් සභාව තමයි බොහොම ශක්තිමත් පළාත් සභාවක් හැටියට ආණ්ඩුවට ලැබුණේ. එතකොට එතුමාට කිසිම ප්‍රශ්නයක් තිබුණේ නැහැ. විපක්ෂයෙන් කිසිම අභියෝගයක් තිබුණේ නැහැ. මේ පළාත් සභාව කඩා වැටෙයි කියලා කිසිම භයක් තිබුණේ නැහැ. ඒ නිසා හිතේ හැටියට අත දිග හැරලා තමන්ගේ සහ මේ පළාත් සභාවේ දරුවන්ගේ අනාගත අභිවෘද්ධිය වෙනුවෙන් කටයුතු කරන්න ඕනෑ කරන ශක්තිය එතුමාට තිබුණා. ඒ නිසාම එතුමා විවිධ ක්‍රියාමාර්ග විවිධ අවස්ථාවලදී ගත්තා.

මම මේ අවුරුද්දේ මේ සභාවේදී විවිධ ආකාරයට ප්‍රශ්න කිහිපයක් එතුමාගෙන් ඇහුවා. එක අවස්ථාවකදී එතුමාගෙන් ඇහුවා, තීන්ත ආලේප කිරීම පිළිබඳව මේ සභාවේ වියදම් කරපු ආකාරය පිළිබඳව. ඊළඟට මේ පාසල්වලට තම දරුවන් ඇතුළත් කිරීමේදී දෙමව්පියන් වශයෙන් දීලා තිබෙන ඒවාට කියන්නේ කොහොමද? මොනවාද කියන්නේ? සුභ පතන්නන් හරි. දරුවන්ගේ දෙමව්පියන් හරි. ඒ විද්‍යාලයේ නඩත්තුවට. නමුත් එහෙම නීත්‍යානුකූල තත්ත්වයක් අපේ විද්‍යාලවල නැහැ. මේ සභාවේ නැහැ. අපි ඉස්කෝලේ යන කාලේ, තමුන්නාන්සේ පාසල් යන කාලේ පහසුකම් ගාස්තු කියලා ශත පනහක් ගත්තා. රුපියලක් ගත්තා. දෙකක් ගත්තා. දැන් මම හිතන්නේ රුපියල් විස්සද මම දන්නේ නැහැ කීයද කියලා. දැනුත් ඒ වාගේ තිබෙනවා. නමුත් පාසල්වලට ළමයෙක් ඇතුළත් කර ගන්න ගියාම - මේක අපි කවුරුත් දන්නවා. මේක ඇත්තෙන්ම තිත්ත කසාය බොනවා වාගේ කැමැත්තෙන් හරි අකමැත්තෙන් හරි කියන්න සිද්ධ වෙලා තිබෙනවා. අද මොන තරම් තත්ත්වයකට අපේ සභාව ඇතුළේ තිබෙන පාසල් පත් වෙලා තිබෙනවාද? පසුගිය දවස්වල විශාල උද්ඝෝෂණයක් ගියා. එහිදී ප්‍රශ්නයක් ඇති වුණා. පාසලකට ළමයෙක් ඇතුළත් කර ගන්න ගිහිල්ලා නොවෙයි. ඉන්න දරුවන්ට. ඒ මුදල් පාසලේ මොනවා හරි නඩත්තුවට ඕනෑ කරනවා. ඒ නිසා තමයි අර පොල් ගෙඩි අටක කතන්දරයක් මේ සභාවේ රැව් පිළිරැව් දුන්නේ. ඒ වාගේම තමයි මේ පළාතේ නොවුණත් මම දැක්කා ජනමාධ්‍යයෙන් කියවුණා එක දෙමව්පියෙක්, තාත්තා කෙනෙක් තමන් ජීවිකාව කර ගෙන ගිය ඔරුව විකුණලා තමයි ඒ දරුවාගේ අධ්‍යාපනය වෙනුවෙන් ඒ විද්‍යාලයට දෙන්න ඕනෑ මුදල දීලා තියෙන්නේ. පළාත් සභාවේ මුදල් හම්බ වෙනවා. ප්‍රධාන අමාත්‍යාංශයේ මුදල් හම්බ වෙනවා. නමුත් තවමත් අපට මේ ප්‍රශ්නයට ස්ථිර විසඳුමක් සොයා ගන්න බැරිව ගියා. දරුවෝ ඇතුළත් කර ගන්න ගියාම මේ ඉන්න මන්ත්‍රීවරු මේ සභාවේ ඍජුව නායකත්වය නොදුන්නත් සභාවේ මන්ත්‍රීවරුන් හැටියට අපටත් ආත්ම ගරුත්වයක් තිබෙනවා. මහජන නියෝජිතයෝ හැටියට කොහොමද අපි මේ ප්‍රශ්නයට උත්තරයක් සොයන්නේ කියලා. ඒ මොකද, මේ තිබෙන නිර්නායකයන් එක්ක දේශපාලඥයන්ට එතැනට කිට්ටු වෙන්න තිබෙන පරතරය හුඟක් වැඩියි. ඒ නිසා මම හිතනවා, ගරු සභාපතිතුමනි, ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අවධානය යොමු කරන්නට ඕනෑ. මේ තත්ත්වය, මේ පස් වන පළාත් සභාව ඇතුළතදීවත් අපි නතර කර ගත යුතුමයි. ඒ මොකද, දැන් මේ වන කොට 2014 වර්ෂයට දරුවන් ඇතුළත් කිරීම සඳහා සම්මුඛ පරීක්ෂණ පවත්වන අවස්ථාව. පසුගිය දවසක අපි දැක්කා, මේ පළාත් සභාවේම, මේ පළාත් සභාවටම අයිති කොළඹ කලාපයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙක් අම්මා කෙනෙකුව ගෙනියනවා තානායමකට. ලිංගික අල්ලස් ගන්න. විවිධ ආකාරයේ -

**ගරු දයාකාන්ත පෙරේරා**
Hon. Dayakantha Perera

කොළඹ කලාපයේ නොවෙයි.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

කොළඹ දිස්ත්‍රික්කයේ. කලාපය මාරු වුණාට මේ පළාත් සභාව ඇතුළේ. මේකට ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ වරදක්වත් අපි කියන්නේ නැහැ. එහෙම නොවෙයි. මේ සමාජය දැන් හැදිලා තිබෙන පිළිවෙළ. මේ සම්බන්ධයෙන් මන්ත්‍රීවරුන්ට තමයි පසුගිය කාලේ බොහොම චෝදනා ආවේ. මේ ලිංගික අල්ලස් ගන්නවාය කියලා. එහෙම ගත්ත අයත් ඉන්න පුළුවන්.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මහරගමද?

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

මහරගම ද? ජා - ඇළ ද? කියන එක මම කියන්නේ නැහැ. නමුත් කොහොම වුණත් මේක තමයි ඇත්ත කතන්දරය. මේවා මේ වනලා ගහලා හරියන්නේ නැහැ. මේ ප්‍රශ්නයට විසඳුමක් සොයන්නම ඕනෑ. මොකද, මම ඔබතුමාව දැනුවත් කරන්නම්. මම මේ බොහොම වගකීමෙන් මේ කථාව කියන්නේ. තමුන්නාන්සේ මේ ප්‍රශ්නය ඇති වුණු වෙලාවේ විමර්ශන කණ්ඩායමක් ඇරියා. කවුද? කොයි කොයි විදුහල්වල, කොයි කොයි විදුහල්පතිවරුන්ටද? ඒ තිබුණු පැමිණිලි පිළිබඳ විමර්ශනය කරන්නය කියලා. ඇරියා නේද? ඒකේ වාර්තාව හම්බ වුණා. ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා ප්‍රශ්නයක් අහපු වෙලාවේ මේ සභාවේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඒ වාර්තාව සභාගත කළා. ඒකේ තිබෙනවා විශාල විද්‍යාල ගණනාවක්. මේ මේ විද්‍යාලවල, මෙන්න මේ මේ ආකාරයට මුදල් ලබා ගෙන තිබෙනවාය කියලා. තමුන්නාන්සේම ඇරපු විමර්ශන කණ්ඩායමේ නිලධාරියෙක් ගියා එක ඉස්කෝලයකට. මේ බොහොම වගකීමෙන් කියන්නේ. හැබැයි, මම මේ සභාවේදී නම කියන්නේ නැහැ. මෙතැනින් එළියට ගිහිල්ලා තමුන්නාන්සේට මොකක්ද ඉස්කෝලේ. කවුද විදුහල්පතිවරයා කියලා කියන්නම්. කතෝලික විද්‍යාලයක විදුහල්පතිවරයෙක්. ඒකත් කියන්නම්. ඇරියාම මොකද වුණේ. තිබුණා ලක්ෂ ගණනාවක වංචාවක්. මේක යට ගහන්න තමුන්නාන්සේ ඇරපු විමර්ශන කණ්ඩායමේ නිලධාරියාට - මම වගකීමෙන් කියනවා. රුපියල් ලක්ෂයක් දීලා ප්‍රශ්නය ඉවර කර ගත්තා. කාගේද? මේ හොරාගේ අම්මාගෙන් පේන අහනවා වාගේ වැඩ. ඒ නිසා -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

වත්තල.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

වත්තල ද? ජා - ඇළ ද? කැලණිය ද? කියලා මම කියන්නේ නැහැ. මම කිව්වා කතෝලික විද්‍යාලයක විදුහල්පතිවරයෙක්. මේක මම මේ සභාවේ කියන්නද කියලා ඇහුවාම, කතෝලික පාසල් සම්බන්ධයෙන් මේ බස්නාහිර පළාතේ ඉන්න ගරු රංජිත් මදුරාවල පියතුමා කිව්වා, භය නැතිව යන්න. එතුමා සාක්ෂියට එනවා කියලා. එතුමාට හානියක් වන නිසා මම මේ සභාවේ ඒක කියන්නේ නැහැ. මම ගරු ප්‍රධාන අමාත්‍යතුමාට බොහොම වගකීමෙන් කියනවා. ඒ නිසා මෙන්න මේක තමයි මේ පළාත් සභාව ඇතුලේ තත්ත්වය. මේක මේ සභාවේ විතරක් නොවෙයි රටේම තත්ත්වය. අද පත් වෙලා තිබෙන්නේ මේකයි. දැන් එතුමා පොඩ්ඩකට ඉස්සෙල්ලා පරිපූරක ඇස්තමේන්තුව ඉදිරිපත් කරන වෙලාවේ කථා කළා, ගුරුවරුන්ගේ සුභ සාධනය වෙනුවෙන්. ඒක ඇත්ත. හොඳයි. ගුරුවරුන්ගේ සුභ සාධනය ඇති කරන්න ඕනෑ. පාසල්වල යටිතල පහසුකම් ඇති කරන්න ඕනෑ. අපි දැක්කා කෝටි නවයකට වැඩි මුදලක් මේ වර්ෂයේ තීන්ත ආලේප කිරීම සඳහා මේ සභාවෙන් සහ වෙනත් ආකාරවලින් මුදල් වියදම් කළ ආකාරය. හැබැයි, මේ මොනවා කෙරුවත් පාසල්වලට මුදල් අය කිරීම නතර වෙන්නේ නැහැ. එහෙම නම් අපි මේකට ක්‍රමයක් හදන්න ඕනෑ. මේ ක්‍රමය එක එක විදුහල්පතිවරයාට ඕනෑ ඕනෑ විධියටවත්, එක එක ආකාරයෙන් පෞද්ගලිකව, මානසිකව, ශාරීරිකව අල්ලස් ගන්න ඕනෑ විධියටත් නොවෙයි. මේ සභාවේ ඉන්නේ වගකිවයුතු මන්ත්‍රීවරු. අධ්‍යාපනයට ආදරය කරන මන්ත්‍රීවරු. අපි දැක්කා, පසුගිය කාලයේ කීර්ති උඩවත්ත ගරු මන්ත්‍රීමා මේ සභාවට යෝජනාවක් ගෙනාවා. ඒ ඒ දේශපාලන පක්ෂවලින් දේශපාලඥයින්ව මැතිවරණවලට ඉදිරිපත් කරන්න ඕනෑ කොහොමද කියලා. ඉතාම හොඳ යෝජනාවක් ගෙනාවා. ඒ වාගේ මේ පිළිබඳවත් අද සංවාදයක් ඇති කරන්න. සාකච්ඡාවක් ඇති කරන්න ඕනෑ. පක්ෂ විපක්ෂ භේදයක් බලන්නේ නැතිව කටයුතු කරන්නයි.

අපි දැකලා තිබෙනවා, මේ පළාත් සභාවේ තිබෙන අධ්‍යාපන අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාව. ඒ උපදේශක කාරක සභාවට ඉන්න මන්ත්‍රීවරු වාගේම ඉතාමත් දැඩි කැමැත්තකින් ඒ උපදේශක කාරක සභාවට අයිති නොවුණත් අනික් මන්ත්‍රීවරුත් ඇවිත් කොහොමද ඒ උපදේශක කාරක සභාව ක්‍රියාත්මක කරන්නේ කියලා විමසා බලනවා. එහෙම නම් අපට හැකියාවක් තිබෙන්න ඕනෑ ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පක්ෂ විපක්ෂ මේකට ආදරය කරන සියලුම මන්ත්‍රීවරු එකතු කර ගෙන ඉතිහාස ගත වන වැඩ පිළිවෙළක් මේ පළාත් සභාව තුළ ඇති කරන්න. ඇත්ත වශයෙන්ම පාසල්වලට අවශ්‍යතාවය තිබෙනවා. මේ දෙන සොච්චම් මුදල, අමාරුවෙන් දෙන මුදල, පළාත් සභාවෙන් දෙන මුදල, එහෙම නැත්නම් මධ්‍යම රජයෙන් - මධ්‍යම රජය ගත්තොත්

එහෙම තිබෙන්නේ පාසල් තුන්සිය ගණනයි. කෝටි ප්‍රකෝටි ගණනක් මුදල් වියදම් කරනවා. නමුත් මේ පළාත් සභාව ඇතුළේ තිබෙන, පළාත් සභාවට අයිති පාසල් සංඛ්‍යාවට එයින් තුනෙන් එකක්වත් හම්බ වෙන්නේ නැහැ. ඒක තමයි ඇත්ත. ඒ නිසා මේ බලය විමධ්‍යගත කිරීම අර්ථවත් වෙනවා නම් විශේෂයෙන්ම මධ්‍යම රජයේ ඒ පාසල්වලට වෙන් කරන මුදල වාගේම මේ පාසල් ද තෝරාගෙන විශේෂයෙන්ම කලාප වශයෙන්, කොට්ඨාශ වශයෙන්, මේ විධියට පාසල් වැඩි දියුණු කරන්න හැකි වෙනවා නම් මේ තිබෙන ප්‍රශ්න ඇති වෙන්නේ නැහැ. එහෙම නම් කාටවත් ගිහිල්ලා හොරෙන් පොල් කඩන්නවත්, තමන්ගේ තිබෙන ඔරුව විකුණලා පාසලට මුදල් දෙන්නවත් වුවමනාවක් වෙන්නේ නැහැ. කාටවත් ගිහිල්ලා අල්ලස් දෙන්න වුවමනාවක් නැහැ. අම්මලාට ගිහිල්ලා තානායම්වල බුදියා ගන්න ඕනෑ වෙන්නේ නැහැ.

ඒ නිසා මම තමුන්නාන්සේගේ මාර්ගයෙන් ඉතාමත්ම වගකීමෙන් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් ඉල්ලීමක් කරන්නේ මේ යෝජනාව - අපි දන්න විධියට තව මාස දෙකයි තුනයි මේ පළාත් සභාවට ආයුෂ තිබෙන්නේ. එහෙම නැතත්, නියම කාලය ගියත් තව මාස හයක් හතක් තියෙයි. මේ සඳහා කාලයක් තිබෙනවා. අපි දන්නේ නැහැ, 2014 වර්ෂයට මුදල් ප්‍රකාශය ඉදිරිපත් කරන්න තමුන්නාන්සේට හැකියාවක් තිබෙයිද නැද්ද කියන එක ගැන. නමුත් ඊට කලින් හරි, දැන් මේ වෙලාව වන කොට හැම විද්‍යාලයකටම පළමුවන ශ්‍රේණියට ළමුන් ඇතුළත් කිරීමේ ක්‍රමවේදය, දැන් ක්‍රියාත්මක වන කාලය. එහෙම නම් මේක තමයි හොඳම කාලය. ඒ නිසා මේ සංවාදය ඇති කරන්න. කොහොමද මේ විද්‍යාලවලට - මේ ප්‍රශ්නය ආපු වෙලාවේ මම විදුහල්පතිවරයෙක් හැටියට ඉන්න ගරු කන්‍යා සොයුරියකගෙන් ඇහුවා, දැන් සිස්ටර් මේ ප්‍රශ්නය ආවොත් එහෙම මොකක්ද වෙන්නේ කියලා. අපට නම් සල්ලි ගන්නම වෙනවා කිව්වා. මම ඇහුවා ඇයි? නැහැ, ඉතින් මේ තිබෙන වැඩ කරන්න විධියක් නැහැයි කියලා වැඩ වැලක් කියාගෙන ගියා. දැන් මෙතුමා කියනවා, ළමයි 20 කට 25 කට එක ගුරුවරයෙක් දීලා තිබෙනවා කියලා. හැබැයි අත්‍යවශ්‍ය ගුරුවරු කියන කණ්ඩායම, පිටින් අරගෙන තමයි ඒ ගුරුවරුන්ට සල්ලි දෙන්නේ. නඩත්තුව ගෙවන්නේ. එතකොට සල්ලි ගන්න වෙනවා. එතකොට කොහෙන්ද මේ සල්ලි ගන්නේ? සභාවෙන් දෙන්නෙත් නැත්නම්, ආණ්ඩුවෙන් දෙන්නෙත් නැත්නම් සුභ පතන්නන්ගෙන් හරි දෙමව්පියන්ගෙන් හරි තමයි මේ මුදල් අරගන්න වෙන්නේ. නැත්නම් ඒගොල්ලන්ගේ සාක්කුවෙන්, හම්බ වන මාසික වේතනයෙන් මේක ගෙවන්න බැහැ නේ? ඒක තමයි ඇත්ත කතන්දරය. මේ යථාර්ථය, මේ ඇත්ත වහලා ඉවර වෙලා මේකට මුහුණ දෙන්න බැහැ. මේක ඇත්ත වශයෙන්ම සිද්ධ වෙනවා. ගරු මහ ඇමතිතුමා කොපමණ තහංචි දැම්මත්, පාසලට වුවමනා කරන මූලික පහසුකම් ටික සපයා ගන්න මුදල් අවශ්‍යමයි. ඒ අවශ්‍ය මුදල් ටික ගන්න ක්‍රමවේදයක් අපි හදන්න ඕනෑ. ඒ ක්‍රමවේදය හදන්න කියන එක පිළිබඳව තමයි මම මේ සාකච්ඡාවේදී කරන්න කියලා කියන්නේ.

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

ලයිට් බිල් ගෙවන්නත් සල්ලි හොයන්න වෙනවා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ඔව්. ඒක තමයි. ඒ නිසා ඔබතුමාගේ මාර්ගයෙන් මම ඉල්ලන්නේ. මේක ගෞරවනීය ආයාචනයක්. මේ මන්ත්‍රීවරුන්ට, ඒ වාගේම විදුහල්පතිවරුන්ට - ගුරුවරුන්ට අපි ගුරු දෙවියෝ කියලා කියන්නේ. ආත්ම ගෞරවයක් ඇතිව මේ සමාජයේ හැසිරෙන්න - අවුරුද්දේ අන්තිම වන කොට, නැත්නම් අවුරුද්දේ මුල වන කොට ජනමාධ්‍ය මගින් මහ ලොකුවට කියනවා, වැඩිම අල්ලස් අරගෙන තිබෙන්නේ අධ්‍යාපන ක්ෂේත්‍රයේද? පොලීසියද? මේ විධියට දානවා. හොඳට බලන්න. දැන් මේ 2013 වැඩිම අල්ලස් අරගෙන තිබෙන්නේ අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ අයයි. එතකොට ඇයි මෙහෙම වෙන්නේ? මෙහෙම වෙන්නේ විශේෂයෙන්ම මේ කාරණාවට නීත්‍යානුකූල, නෛතික බලයක් නැති නිසා. ඒ නිසා අනිවාර්යයෙන්ම තමුන්නාන්සේගේ මාර්ගයෙන් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් මම ඉල්ලීමක් කරන්නේ. අපි මේ සභාවේ හිටියත් නොසිටියත් අපි දන්නේ නැහැ, ඊළඟ පළාත් සභාව වන කොට අපේ ඉරණම කොයි විධියට ලියවෙයිද කියලා. හැබැයි, ඉන්න කාලේ හරි - ඒ නිසා ගරු සභාපතිතුමනි, මම ඉල්ලීම කරන්නේ, මේ යෝජනාව සක්‍රීයව ක්‍රියාත්මක කරන්න උවමනා කරන ඒ පසුබිම සකස් කර ගන්න ඕනෑ කරන මූලික සාකච්ඡාව ඔබතුමාගේ මාර්ගයෙන් අඩුම තරමින් ලබන පළාත් සභා රැස්වීම එන්න ඉස්සෙල්ලාවත් ආරම්භ කරන්න. මොකද මේ දවස්වල මේ 2014 වර්ෂයට දරුවන් ඇතුළත් කිරීමේ කාල සීමාව නිසා -

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

මන්ත්‍රීතුමා, ඔබතුමා කිව්වාට මෙය සාකච්ඡා කිරීම -

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ඒක අපි සාකච්ඡා කරමු. ඒකයි මම කියන්නේ. එක එක්කෙනාට විවිධ අදහස් තිබෙන්න පුළුවන්. මොකද, මේ රටේ පාසල් පද්ධතියක් තිබෙනවා. පළාත් සභාවට අයත් පාසල් තිබෙනවා. මධ්‍යම රජයට අයත් පාසල් තිබෙනවා. පෞද්ගලික පාසල් තිබෙනවා. ජාත්‍යන්තර පාසල් තිබෙනවා. හැබැයි දැන් මේ පළාත් සභාවට අයිති පාසල්වලට එන දරුවන්ගේම දෙමව්පියෝ ඉතා විශාල මුදලක් වියදම් කරලා, ටියුෂන් අරින්න, වෙන වෙන ක්‍රියාමාර්ගවලට මේ දරුවන්ව යොමු කරනවා. එතකොට මධ්‍යම රජයේ - මේ එකම පළාතේ තිබෙන, උදාහරණයක් ගත්තොත් එහෙම වත්තල තිබෙන ශාන්ත අන්තෝනි මහා විද්‍යාලය. අපේ ජානක සූරියබණ්ඩාර මැතිතුමා ඉගෙන ගත්ත ඉස්කෝලේ. ඒකේම එහා පැත්තේ තිබෙනවා ශාන්ත ආනා විද්‍යාලය. මේ දෙකේ තිබෙන පරස්පරය බලන්න. මුදල් දෙන විධිය බලන්න. ඒ නිසා මේක ඇත්ත වශයෙන්ම වෙනස් විය යුතුයි. ඒ නිසා සාකච්ඡාව කරන්න ඕනෑ. මොකද, සාකච්ඡාවක් කරන්න එපමණ ලොකු අමාරුවකුත් නැහැ. ජනාධිපතිතුමා ඉන්නේ එක පැත්තක නම්, පාර්ලිමේන්තුවේ බලය තිබෙන්නේ ඒ පැත්තටම නම්, පළාත් සභාවේ බලය තිබෙන්නේ ඒ පැත්තට නම් මේකේ කිසි ප්‍රශ්නයක් නැහැ. මේක උතුරු පළාත් සභාවේ වුණා නම් අන්න ප්‍රශ්නයක් තිබෙනවා. මොකද, දැන් උතුරු වසන්තයත් නතර කරන නිසා ඒගොල්ලන්ට තීරණය කරන්න වෙනවා අනිවාර්යයෙන්ම කොහොමද මේකට සල්ලි හොයන්නේ කියලා. දැන් මේක එහෙම නොවෙයිනේ? සියල්ලම එක පැත්තේ. බැසිල් රාජපක්ෂ ඇමතිතුමාට ගිහිල්ලා කිව්වත්, මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාට ගිහිල්ලා කිව්වත් මේක හදා ගන්න පුළුවන්. මේ ක්‍රමවේදය හදා ගන්න පුළුවන්. මොකද, මේ රටේ දියුණු කරන්න තිබෙන්නේ අධ්‍යාපනය. අධ්‍යාපනය සහ සෞඛ්‍ය. නිරෝගිමත් මිනිහෙක්, ඔළුව තිබෙන දරුවෙක් බිහි කළොත් තමයි මේ තිබෙන ප්‍රශ්න ටික නිරාකරණය කර ගන්න හම්බ වෙන්නේ. එහෙම නම් ඒ මානසික පීඩනයෙන් මිදෙන්න දෙමව්පියන්ට, ගුරුවරුන්ට, විදුහල්පතිවරුන්ට, පළාත් සභා මන්ත්‍රීවරු හැටියට අපට උවමනා කරන වාතාවරණය සකස් කරන්න උවමනා කරන කාලය දැන් එළඹීලයි තිබෙන්නේ. ඒ සඳහා සුදුසු සාකච්ඡාවක් කරන්න කියන ඉල්ලීම කරමින් මම නිහඬ වෙනවා.

[පූ.භා. 11.50]

**ගරු ජගත් අංගගේ** (සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන හා කාන්තා කටයුතු, පරිවාස හා ළමා රක්ෂක සේවා සහ සභා කටයුතු අමාත්‍යතුමා)
Hon. Jagath Angage (Minister of Health, Indigenous Medicine, Social Welfare and Women's Affairs , Probation and Child Care Services and Council Affairs)

ගරු සභාපතිතුමනි, සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව සලසා දීම සම්බන්ධව මම ගරු ඔබතුමාට මගේ කෘතඥතාවය ප්‍රථමකොට පිරිනමනවා. මම හිතනවා, සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා ගරු මන්ත්රීතුමා හදවතින්ම අවංකව මේ ශිෂ්‍ය පරම්පරාවත්, ඒ වාගේම ඔවුන්ගේ අභිවෘද්ධියත් ප්‍රාර්ථනාව ඇතුව පාසල්වලට දරුවන් යොමු කරන දෙමව්පියනුත්, ඒ වාගේම මතු අධ්‍යාපනයේ තිබෙන ගෞරවාන්විත භාවයත් ආරක්ෂා කිරීමේ අභිලාෂයෙන් තමයි මේ යෝජනාව ඉදිරිපත් කරන්න ඇතියි කියලා. විවාදාත්මක කාරණාවක් මේ තුළ නැහැ. මම හිතන්නේ, ගරු ප්‍රධාන අමාත්‍යතුමා පසුගිය වකවානුව තුළ මෙවැනි චෝදනා එල්ල වීම නිසාම පාසල් පද්ධතියේ විදුහල්පතිවරුන්ට නියෝගයක් කරලා තිබුණා, පාසල් පද්ධතියේ දෙමව්පියන්ගෙන් ලබා ගත් සියලු මුදල් නැවත නිදහස් කර ඒ දෙමව්පියන්ට භාර කරන ලෙස.

ඇත්ත වශයෙන්ම ගරු ප්‍රධාන අමාත්‍යතුමනි, අපි යථාර්ථවාදීව හිතුවොත් අපේ කලාපවල විදුහල්පතිවරු මහා කනස්සල්ලට පත් වුණා. ප්‍රධාන අමාත්‍යතුමාගේ නියෝගය පරිදි මේ ක්‍රියාව කළත්, මේ පාසලේ වාර්ෂික සැලැස්ම අනුව ක්‍රීඩා කටයුතු, වෙනත් බාහිර ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය වන මුදල් අපි කොයි ආකාරයෙන් සම්පාදනය කර ගෙන මේ වර්ෂය ගත කරන්නද කියලා. මේ අර්බුදකාරී තත්ත්වය පාසල් පද්ධතියේ අද ඊයේ නොවෙයි මතු වුණේ. රෙජිනෝල්ඩ් කුරේ හිටපු ගරු ප්‍රධාන අමාත්‍යතුමා මේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා වශයෙන් ඉන්න කාලයේ මම මේ සභාවට යෝජනාවක් ඉදිරිපත් කළා. ගරු ප්‍රධාන අමාත්‍යතුමනි, මේ තත්ත්වය නිසා අසීමිත විධියට දෙමව්පියන් කණස්සල්ලට පත් වෙලා තිබෙනවා. විශේෂයෙන්ම පළමුවැනි ශ්‍රේණියේ දරුවන් පාසලට ඇතුළත් කර ගැනීමේදී විවිධ පාසල්වල විවිධ විදුහල්පතිවරු තමන්ට හිතෙන විධියට යෝජනා ඉදිරිපත් කරලා, පාසල්

සංවර්ධන සමිතිය කැඳවලා, තමන්ට හිතෙෂී පුද්ගලයෙකු ලවා යෝජනාවක් ඉදිරිපත් කරලා, ඒ යෝජනාව සමස්ථයටම බලපාන ආකාරයෙන් ක්‍රියාත්මක කිරීම නිසා අසරණ වූ දෙමව්පියන් පළමු වන වසරට දරුවන් ඇතුළත් කර ගැනීමේ කාල සමය තුළ මහජන බැංකුවේ, ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ විවිධ බැංකුවල භාණ්ඩ උකස් කිරීමේ පෝලිම්වල පෙළ ගැහෙනවා. මේක හරි අසාධාරණ තත්ත්වයක්. අද නොවෙයි. ඒ වකවානුවේ. එදා මීට වැඩිය ගැඹුරින් තිබුණා. ඒ නිසා මම යෝජනාවක් කළා.

ගරු සභාපතිතුමනි, ඒ නිසාම අපි ඒ කාලේ දැනට අපේ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් කරුණාදාස මහත්මයාගේ ප්‍රධානත්වයෙන් වෙනම කමිටුවක් මේකට පත් කළා. ඒ කමිටුවට කිව්වා නිර්දේශ ඉදිරිපත් කරන්නය කියලා. මේ දරුවන්ගෙන් මෙවැනි යම්කිසි මුදලක් අය කරනවා නම්, දෙමව්පියන්ගෙන් ඒ අය කිරීම සම්බන්ධයෙන් ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳව. මම හිතනවා, දෙපාර්තමේන්තුවේ තවමත් මේ ලියවිල්ල ඇති කියලා. නමුත් ඒක ක්‍රියාවට නංවන්න ඉදිරිපත් වුණේ නැහැ. අපි කිව්වා, විදුහල්පතිවරයාගේ සහ ගුරුවරුන්ගේ ගරුත්වය, අනන්‍යතාවය, ඒ අයගේ ආරක්ෂාව වෙනුවෙන් කරුණාකරලා කිසිම මුදලක් විදුහල්පතිවරයාගේ අතට අල්ලන්න දෙන්න එපාය කියලා. ඒවා සේරම පාසල් සංවර්ධන සමිතියේ හෝ පාසලට අදාළ ගිණුමක තැන්පත් කරලා, ඒ ගිණුම් සඳහා මුදල් තැන්පත් කරපු කුවිතාන්සිය පමණක් පාසලට රැගෙන යාමේ ක්‍රමයක් හදන්න. එදා ඒ නිර්දේශ අතර තිබුණා, මුදල් වියදම් කරන දේ පිළිබඳව වාර්ෂික සැලැස්මක් අනිවාර්යයෙන් හදන්න. වාර්ෂික සැලැස්ම වර්ෂය මුලදී දෙමව්පියන්ට ප්‍රදර්ශනය කරන්න. මෙන්න මේ වර්ෂයේ අපේ ඇස්තමේන්තුව මේකයි. අපේ අයවැය මෙන්න මේ විධියටයි යන්නේ. මෙපමණ ප්‍රමාණයක් මුදල් අවශ්‍යයි. මෙපමණ මුදලක් වැය වෙනවාය කියලා පෙන්වලා සම්පත්දායක දෙමව්පියන්ට ස්වේච්ඡාවෙන් මේ සඳහා ඉදිරිපත් වෙන්න අවස්ථාව සලසා දෙන්න. නියෝගාත්මක ස්වභාවයකින් තොරව. මෙවැනි නිර්ණායක කිහිපයක් අපි ඉදිරිපත් කළා. මේ දෙමව්පියන්ට, නැති බැරි අහිංසක දෙමව්පියන්ට තමන්ගේ දරුවන්ට මේ නිදහස් අධ්‍යාපන ක්‍රමය යටතේ ඉතාමත් යහපත් ලෙස ප්‍රවේශ වෙන්න තිබෙන ඉඩකඩවලට බාධාවක් නොවන ආකාරයෙන් අපි කටයුතු කරමුයි කියලා එදා ඒ කමිටුව නිර්දේශ කළා. ඒ කමිටුවේ නිර්දේශ අද වන තුරුත් මේ සභාව තුළ, විශේෂයෙන්ම බස්නාහිර පළාත් සභාවේ පාසල් පද්ධතිය තුළ ක්‍රියාත්මක වුණේ නැහැ. මා දන්නේ නැහැ, මේ කාරණාවට හේතුව. නමුත් මේ තත්ත්වය නිසා සමහර වෙලාවට අපි පෞද්ගලිකව කිසිම විදුහල්පතිවරයෙක් එක්ක, එහෙම නැත්නම් පාසලක වෙනත් පුද්ගලයකු සමග අපේ පෞද්ගලික අමනාපයක් නැහැ. කිසිම දවසක අපි එහෙම පුද්ගල බද්ධව කටයුතු කරලා නැහැ. නමුත් සමහර තැන්වලදී ඒක මගේ දේශපාලන ජීවිතයට පවා අවාසිදායක තත්ත්වයක් ඇති වුණා. මොකද, මම පෞද්ගලිකව යම් යම් අයගෙන් පළි ගැනීමේ චේතනාවෙන් කරන ක්‍රියාවක් කියලා තමයි එදා ඒකට හංවඩු ගැහුණේ. පසු කාලයක පානදුර කොට්ඨාශයේ එක්තරා විදුහල්පතිවරයෙකුගේ වැඩ තහනම් කළාට පස්සේ ඒ වැඩ තහනම් කරපු එකේ සමස්ත චෝදනාව මගේ පිට ආවා. ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ නියෝග පිළිනොපැදීම නිසා විදුහල්පතිවරු කිහිප දෙනෙකුගේ වැඩ තහනම් කළා. ඒ වැඩ තහනම් කරපු විදුහල්පතිවරු නැවත සියලු දෙනාටම වැඩ දුන්නා. නමුත් කථාව ගියේ ජගත් අංගගේ ගේ වුවමනාවට පානදුරෙන් වැඩ තහනම් කරපු විදුහල්පතිවරයාගේ වැඩ, තහනම් කළාය කියලයි. වෙනත් පුද්ගලයෝ එකතු වෙලා විදුහල්පතිවරයාට නැවත අවස්ථාව ලබා දුන්නාය කියලා. අදත් ඒ පාසලට මට යන්න බැරි තත්ත්වයට මාර්ගය සම්පාදනය වුණා. සකස් වුණා.

ගරු සභාපතිතුමනි, මේක මහා දැවැන්ත ඛේදවාචකයක්. ගරු ප්‍රධාන අමාත්‍යතුමා බොහොම සාධාරණ විධියට මේ තත්ත්වය වළක්වන්න උත්සාහ දැරුවා. නමුත් අනික් පැත්තෙන් විදුහල්පතිවරු සහ මේ අධ්‍යාපන පරිපාලකයින් කියන ආකාරයටම ඒ පාසල්වල කීර්ති නාමය සහ ක්‍රීඩා කටයුතු, වෙනත් බාහිර ක්‍රියාකාරකම් ඉදිරියට පවත්වාගෙන යාම සඳහා මෙවැනි අමතර ආදායමක් එක් රැස් කර ගන්නේ නැතිව පාසල් පද්ධතිය දුවන්න බැහැයි කියන මතයේ ඔවුන් සිටිනවා. ඒක නිවැරදි තත්ත්වයක්. මම හිතන්නේ, ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඉතාමත් වැදගත් යෝජනාවක් අද ඉදිරිපත් කළා. ඉතාමත් අපහසුවෙන්, දරිද්‍රතාවය කියන එක පැහැදිලිව මතු පිට පේන්න නැති වුණත්, මේ පවතින ක්‍රමයන් තුළ සමහර විට ඔවුන්ට තමන්ගේ දෛනික රාජකාරී කටයුතු කරලා අවසාන වුණාට පස්සේ මුදල්වල හිඟ පාඩු තිබෙනවා. තමන්ගේ සෞඛ්‍ය ආරක්ෂා කර ගැනීම සඳහා සමහර වෙලාවට විශාල මුදලක් ආයෝජනය කිරීමේ හැකියාවක් නැහැ. රජයේ සේවකයෙකු හැටියට තමන්ගේ නිවාස ණය ගත්තාට පස්සේ සැහෙන කාලයක් මේ සඳහා ඔහු පඩියෙන් කොටස් වශයෙන් ගෙවන්න ඕනෑ. මෙවැනි

[ ගරු ජගත් අංගගේ - අමාත්‍යතුමා ]

අපහසුතා තිබෙනවා. ඒ නිසා ඒ සෞඛ්‍ය රැකවරණය ලබා දීමට අද මේ කරපු යෝජනාව සහ මේ පරිපූරකයෙන් ඒ සඳහා මුදල් වෙන් කරලා ඒ ගත්ත ක්‍රියාමාර්ගය මම හිතන්නේ සමස්ත මහජන නියෝජිතයන්ගේ පැසසුමට, ගෞරවයට ලක් විය යුතු කාරණාවක්. ඒක ඒ ආකාරයෙන් සිද්ධ වීම අතිශයින් වැදගත් කටයුත්තක්. ඒ වාගේම අපි පසුගිය දවස්වල පාසල්වල ගිහිල්ලා උත්තම ශ්‍රම පූජා කියලා විශේෂ ව්‍යාපෘතියක් කරන අතරේ බෝ නොවන රෝගවලින් අපේ ගුරුවරුන් කොපමණ පීඩාවට පත් වෙලා තිබෙනවාද කියලා සොයා බැලීමේ පරීක්ෂණ කටයුතු කළා. ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් රෝගාතුර භාවයට පත් වෙලා. මේ තත්ත්වය තුළ අද ප්‍රධාන අමාත්‍යතුමා මේ සභාවට ඉදිරිපත් කරපු ඒ පරිපූරක යෝජනාව පිළිබඳව අපි සමස්තයක් වශයෙන් ඔබතුමාට අපේ ගෞරවය පුද කරන්න කැමැතියි.

ඒ වාගේම ගරු සභාපතිතුමනි, දැන් මේ කියනවා වාගේ, අද යෝජනාවක් වශයෙන් ඉදිරිපත් වෙනවා වාගේ මේ විදුහල්පතිවරු සමස්තයටම යම් නිර්නායක පද්ධතියක් යටතේ වර්ෂයක් අවසානයේ මේ පාසලට සුභ පතන්නන්, මේ පාසලට යම් කිසි ආකාරයකින් ආධාර උපකාරක කරන්න ඉදිරිපත් වන අයට අවස්ථාවක් සලසා දීලා ඔවුන්ගේ ආධාර උපකාර නිත්‍යානුකූල පදනමක් මත මේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රගතිය වෙනුවෙන් ලබා ගැනීමේ ක්‍රමවේදයක් දැන් සකස් වෙනවා නම් හොඳයි කියලා මම නැවත හිතනවා.

ඒ වාගේම මම ගරු ඔබතුමා මඟින් ගරු ප්‍රධාන අමාත්‍යතුමාට සිහිපත් කරනවා. අපේ හිටපු ගරු ප්‍රධාන අමාත්‍ය රෙජිනෝල්ඩ් කුරේ මැතිතුමාගේ කාලයේ අපි සම්පාදනය කරපු ඒ වැඩ පිළිවෙළ පිළිබඳව, නැවත ඒ නිලධාරීන් කැඳවලා යම්කිසි විධියේ අදහසක් ගන්නවා නම් මම හිතන්නේ, ඒකත් මේකට යම් විධියකට කාලෝචිත ක්‍රියාවක් හැටියට වැඩි වටිනාකමක් ලබා දෙයි කියලා මම විශ්වාස කරනවා. ඒ කොහොම වුණත් ගරු ප්‍රධාන අමාත්‍යතුමා මේ දෙමව්පියන්ට පීඩාව අවම වන ආකාරයෙන් මේ පාසල් පද්ධතියේ ක්‍රියාවලිය ඉස්සරහාට ගෙනියන්න දරන වෙහෙස මහන්සිය පිළිබඳව අපි මන්ත්‍රීවරු හැටියට ඉතාමත් ප්‍රසාදය එතුමාට පළ කරනවා. ඒ වාගේම සමහර තැන්වල සිදුවන අක්‍රමිකතා සහ සිදු වන දූෂණ පිළිබඳව සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා දිගින් දිගටම ප්‍රකාශ කළා. ලිංගික අල්ලස් ලබා ගැනීම පිළිබඳ චෝදනාවක් පසුගිය දවස්වල අපට කනට අහන්න ලැබුණා. දැන් අධිකරණයේ ඒ පිළිබඳව විභාග පැවැත්වෙනවා. අපි දැන් ඒ පිළිබඳව කථා කරන්නේ නැහැ. නමුත් මෙවැනි අවිචාරවත් වැඩත් මේ තුළ සිද්ධ වෙනවා. මොකද හේතුව හැම පුද්ගලයෙක්ම මනුස්සයෙක් නොවන නිසා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ඒ අහුවෙන ඒවා විතරයි නේ?

**ගරු ජගත් අංගගේ -**අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

අහුවෙන ඒවා විතරයි. ඉතින් ඒ වාගේ දේවල් කරනවා. අයථා ප්‍රයෝජන ලබා ගැනීමේ උත්සාහයක යෙදිලා ඉන්නවා. ඒ නිසා අපි මේක විධිමත් කිරීම ඉතාමත් කාලෝචිත ක්‍රියාවක් හැටියට ප්‍රකාශ කරමින්, මේ යෝජනාව ඉදිරිපත් කරපු ගරු මන්ත්‍රීතුමාටත් මගේ ප්‍රසාදය පිරිනමමින් මට කාලය වෙන් කර දීම පිළිබඳව ගරු සභාපතිතුමාට මගේ ස්තූතිය ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ අවස්ථාවේදී ඒ.එම්. යූසුෆ් ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ වනවා ඇත.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ඒ.එම්. යූසුෆ් ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.***
*Accordingly the Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Yoosuf M.P.C took the Chair.*

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මීළඟට ගුණසිරි ජයනාත් ගරු මන්ත්‍රීතුමාට විනාඩි 10 ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 11.59]

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම හිතනවා ඉතාම වැදගත්, පළාත් සභාවට අදාළ වුණු යෝජනාවක් අපේ

සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරලා තිබෙන්නේ. මේ වැදගත් යෝජනාව සාකච්ඡා කරන වෙලාවේ විශේෂයෙන් පාසල්වල මුදල් එකතු කිරීම සම්බන්ධ කියන මූලික කාරණය පිළිබඳව අපි සැලකීමේදී අපේ ගරු ජගත් අංගගේ අමාත්‍යතුමා සඳහන් කළ කාරණා එක්කත් බැලුවාම, විශේෂයෙන් අපි මේ කාරණය බොහොම පරිස්සමින් සාකච්ඡා කරලා, තීරණයක් ගන්නට අවශ්‍ය කාරණාවක්. මම හිතන්නේ නැහැ මේ වසර තුළ, මේ වසර අවසාන වීමට මත්තෙන් අපට තීරණයක් ගන්න පුළුවන් වෙයි කියලා. මොකද, පාසල් පද්ධතිය කඩා නොවැටෙන පරිදි බොහොම ප්‍රවේසමෙන් තීරණයක් ගත යුතු කාරණයක් හැටියට මෙය සලකන්න පුළුවන්. විශේෂයෙන්ම මම හිතන්නේ, මේකට ප්‍රධානම කාර්යය තමයි සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා සඳහන් කළ ආකාරයට පළමු වැනි ශ්‍රේණියට දරුවන් ඇතුළත් කිරීමේදී වෙලා තිබෙන තදබදයත් එක්ක තමයි මේ මුදල් ඉස්සරහට යන කාරණය බොහෝ පාසල්වල සිද්ධ වෙන්නේ. සද්භාවයෙන් මේ මුදල් පාසල් පද්ධතියේ සංවර්ධනය සඳහා යොදවන අවස්ථාත් අපි දකිනවා. ඒ වාගේම එහෙම නොයොදපු අවස්ථාත් අපි අනන්තවත් දැකලා තිබෙනවා. මේක බොහොම පැහැදිලි ප්‍රශ්නයක්.

විශේෂයෙන් මම මතක් කරන්න කැමැතියි. අද වන කොට බස්නාහිර පළාත් සභාවක් හැටියට අපට සතුටු වෙන්න පුළුවන් මට්ටමක ඉන්නවා. පෙර පාසල් අධ්‍යාපනය පළාත් සභාව සතු පාසල් පද්ධතියත් එක්ක බැලුවාම මේ මොහොත වන කොට, ගුරු සිසු අනුපාතය ගත්තාම ඉතාම සැලකිය යුතු මට්ටමකට අවශ්‍ය විෂයන්ට ගුරුවරුන් පාසල් පද්ධතියට ලබා දීමේ වැඩ පිළිවෙළ තුළ බස්නාහිර පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යතුමා නියැළිලා ඉන්න නිසා පෙර පාසල් පද්ධතියත් එක්ක ගත්තාම යම් සාධනීය මට්ටමක්, ගුණාත්මක මට්ටමක් ඒ පැත්තෙන් අපට සලකන්න පුළුවන්. හැබැයි, භෞතික සම්පත් දියුණු කිරීමේදී බොහෝ පාසල්වල යම් යම් අඩුපාඩු තිබ්බා වුණත්, ඒවාටත් අවශ්‍ය මුදල් ප්‍රතිපාදන - විශේෂයෙන් මට මතකයි අපේ පළාත් සභාවේ මුදල්වලට අමතරව ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය හරහාත් ඒ ව්‍යාපෘතීන් සඳහාත් මුදල් යොදවන්නට කටයුතු කරලා තිබුණා.

ඒ වාගේම තමයි මේ ප්‍රශ්නය විසඳීම සඳහා මහින්ද චින්තනය හරහා අර ද්විතියික පාසල් දහසක් සංවර්ධන වැඩ පිළිවෙළ තුළත්, ප්‍රාථමික පාසල් පන්දාහක් සංවර්ධනය කිරීමේ වැඩ පිළිවෙළ තුළත් විශාල මුදල් ප්‍රමාණයක් භෞතික සම්පත් දියුණු කරන්නට, පාසල් පද්ධතිය තුළට මුදල් මේ වසරේ සිට ගලා ඒමේ ප්‍රවණතාවයක් අපට දකින්නට පුළුවන්. කොහොම වුණත් මම අර පෙර සඳහන් කරපු පළමුවැනි ශ්‍රේණියට ළමුන් ඇතුළත් කිරීමේදී අපේ සිරිකමල් ගරු මන්ත්‍රීතුමා කිව්ව විධියටම සැබෑ ප්‍රායෝගික කාරණය තමයි දියුණු වුණු පාසල්වල, විශේෂයෙන් ජාතික පාසල්වල බොහොමයක්, ඒ වාගේම ඒ අතරට, ඒ මට්ටමේ පවතින පළාත් පාසල්වලත් ආධාර ලැයිස්තුවක් දාලා තිබෙනවා ලියන්න. ඒක තමයි සත්‍ය කථාව. අපි කොහොම කථා කළත්. අපට නැහැයි කියන්න බැහැ. පළමු වැනි ශ්‍රේණියේ සම්මුඛ පරීක්ෂණයේදී පාසලට ලබා දෙන ආධාරය ලියන්න ලැයිස්තුවක් දාලා තිබෙනවා. ඒක ඇත්ත කථාවක්. සමහර විට පරීක්ෂණයක් කරන්න ගියාම මේ ලැයිස්තුව අපට සොයා ගන්න නැති වේවි. නමුත් පළමු වැනි ශ්‍රේණියේ සම්මුඛ පරීක්ෂණයකට, දියුණුයි කියන සම්මතය තිබෙන පාසලකට ගියාම අපට දකින්නට ලැබෙනවා ආධාර ලේඛනයකට ආධාර ලියන්න සිද්ධ වීම පිළිබඳව. ඒක ඇත්ත. මේ සියලු කාරණා සිද්ධ වෙලා තිබෙන්නේ, එක පැත්තකින් අර මම ඉස්සෙල්ලා කිව්වේ මේ කාරණය අපට බොහොම ප්‍රවේසමෙන් අත ගහලා තීරණයක් ගන්න ඕනෑ කියන කාරණයක්. වාර්ෂික අධ්‍යාපන සැලැස්මක් හැම පාසලකම තිබෙනවා. ඒ සැලැස්මට ඒ අවුරුද්ද තුළ ඒ පාසලේ ක්‍රියාත්මක වැඩ කටයුතු පිළිබඳව යම් ඇස්තමේන්තුගත මුදල් ප්‍රමාණයකුත් එක්ක, වැඩ සටහන් ප්‍රමාණයකුත් පාසල් පද්ධතිය තුළ තිබෙනවා. මෙන්න මේවාට අවශ්‍ය මුදල් තමයි විදුහල්පතිවරු ඒ නිල හෝ නොනිල ආකාරයෙන් මුදල් එක්කාසු කිරීමේ කටයුත්තට බැහැලා තිබෙන්නේ කියන කාරණය මම මතක් කරන්න වෙනවා. ඒ නිසා වාර්ෂික අධ්‍යාපන සැලැස්මක් මේ වන කොට හදලා ක්‍රියාත්මක වන නිසා මම ඒකයි කිව්වේ, මේක ඉතාම කඩිමුඩියේ අපට යම් තීරණයක් ගන්න පුළුවන් කාරණයක් නොවෙයි.

ඒ වාගේම තමයි මේ මුදල් එක්කාසු කිරීමේ ප්‍රවණතාවය වැඩි වෙන්න තව එක් හේතුවක් වෙලා තිබෙනවා. මම පැහැදිලිව සඳහන් කරන්න කැමැතියි. අපි අපේ ප්‍රධාන අමාත්‍යතුමාත් අධ්‍යාපන අමාත්‍යාංශය හැටියට දැඩි තීරණයක ඉන්නවා, පළමුවැනි ශ්‍රේණියේ සමාන්තර පන්ති වැඩි කරන්නේ නැහැයි කියන එක. මෙන්න මේක පිළිබඳව නැවත සමාලෝචනය කරන්න, සලකා බලන්න අවශ්‍යයි කියන කාරණය මම මතක් කරන්න කැමැතියි. මොකද,

[ ගරු ගුණසිරි ජයනාත් ]

ඒකට හේතුවක් හැටියට ගත්තොත් මම නියෝජනය කරන බියගම අධ්‍යාපන කොට්ඨාශය ගත්තාම පෞද්ගලික පාසල්, ජාත්‍යන්තර පාසල් පහක් - මේ මෑත කාලයේ, මේ අවුරුදු තුන හතරක් ඇතුළත බියගම අධ්‍යාපන කොට්ඨාශයේ පමණක් ජාත්‍යන්තර පාසල් පහක් බිහි වෙලා තිබෙනවා. බියගම අධ්‍යාපන කොට්ඨාශයේ පමණක්. මෙන්න මේක සැලකිය යුතු ප්‍රශ්නයක්. ඉතාම හොඳින් අධ්‍යයනය කරලා පළමු වැනි ශ්‍රේණියේ සමාන්තර පන්ති වැඩි කරනවාද නැද්ද කියන - අපි දැනට ඉන්නේ කිසිසේත් වැඩි කරන්නේ නැහැයි කියන තීරණයක. මේ කරුණු සොයා බලලා අපට මේ පිළිබඳවත් සලකන්න සිද්ධ වෙනවා. ඒ දැඩි තීරණයක ඉන්න නිසා තමයි මම දකින්නේ - දැන් අපේ කොට්ඨාශය උදාහරණයක් හැටියට ගත්තාම ජාත්‍යන්තර පාසල් පහක් බිහි වෙලා. අද ඒවාට දරුවන් විශාල ප්‍රමාණයක් ඇතුළත් වෙලා තිබෙනවා. ඒකට ප්‍රධාන හේතුවක් තමයි හැම දෙමව්පියෙක්ම දරුවන්ගේ දියුණුව අපේක්ෂාවෙන්, තමන්ගේ දරුවාව හොඳයි කියන සම්මතය තිබෙන පාසලකට දරුවා ඇතුළත් කර ගන්න ගන්නා උත්සාහය. අවංකවම මහජන නියෝජිතයන් හැටියට අපි කථා කළත් අපේ දරුවන් ගැන වුණත් හරියට බැලුවොත් ගමේ පාසලට නොවෙයි යන්නේ. දියුණුයි කියන පාසලකට. අවංක කතන්දරේ ඒක. ඒ නිසා ගමේ ඉන්න දෙමව්පියන්ටත් ඒ අයිතිය අපි ලබා දෙන්න ඕනෑය කියන කාරණය මේ සභාවේදී මම පැහැදිලිව කියනවා. අපි වාගේම දියුණු අපේක්ෂා ඒ දෙමව්පියන්ටත් තිබෙනවා.

ඒ නිසා මේ වෙලාවේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා මාර්ගයෙන් මේ මුදල් සොයන කාරණයට ප්‍රධාන හේතුවක් වෙලා තිබෙනවා අපේ පළමුවැනි ශ්‍රේණියේ සමාන්තර පන්ති හිර කර ගෙන වැඩි නොකරන තත්ත්වයක් තුළ මුදල් සොයන්න කිසියම් කෙනෙක් පෙළඹෙනවා නම් ඒකේ වැඩි ඉඩකඩක් අපි ලබා දීලා තිබෙනවා, පළමුවැනි ශ්‍රේණියේ සමාන්තර පන්ති වැඩි නොකිරීම කියන කාරණය තුළින් කියලා මම මතක් කරන්න කැමැතියි. මේකට ප්‍රධාන හේතුවක් තිබෙනවා. සමාන්තර පන්ති වැඩි කරන්න කියලා අපි නිකම් කියන්නේ නැහැ. ඒ ප්‍රදේශයේ තිබෙන ජනගහන ප්‍රතිශතය, ඒ පාසලට පෝෂිතයන් පිළිබඳව සලකන්න අවශ්‍ය වෙනවා. විශේෂයෙන් දැන් මම සඳහන් කළොත් අපේ ප්‍රදේශය බියගම කොට්ඨාශය ගත්තාම නාගරීකරණය දැඩි ලෙස ඉක්මණින් සිදු වුණු ප්‍රදේශයක්. ඒ නිසා ඉතාම සීමිත භූමි ප්‍රමාණයක් තුළ විශාල ඉඩකඩම් ප්‍රමාණයක් වෙන්දේසි වෙලා තියෙනවා. අද වෙන්දේසි වූ ඉඩම්වල වතු ප්‍රමාණයන් වැඩි වෙලා, ඒවායේ ජනගහනය වැඩි වෙලා තියෙන තත්ත්වයක් තුළ අපට මේ කරුණු සලකන්න සිද්ධ වෙනවයි කියන කාරණය මම මතක් කරන්න කැමතියි. ඒ වාගේම තමයි අනෙක් පැත්තෙන් ගත්තාම අර අපේ මන්ත්‍රීතුමන්ලා සඳහන් කළ විධියට අල්ලස් දෙන්න, ලිංගික අල්ලස් දෙන්න පුළුවන්. මුදල් අල්ලස් වෙන්න පුළුවන්. භාණ්ඩවලින් දෙන අල්ලස් වෙන්න පුළුවන්. මේවා පිළිබඳව ජනතාවගේ පැත්තෙනුත් එක කාරණයක් මම දකිනවා. වැරදියි. කිසියම් විධියක අදාළ නිශ්චිත බලධාරීන්ට මේ කරුණු ලිඛිතව, හෝ වාචිකව දැනුවත් කරන්න යන ප්‍රමාණයක් අඩු වෙලා තියෙනවා. අර ඉතාම කෙටි මාර්ගවලින් තමුන්ගේ අවශ්‍යතාවය ඉෂ්ට කර ගන්න යාම නිසා තමයි මෙවැනි කටයුතුවලට ජනතාව පෙළඹීලා තියෙන්නේ කියන කාරණයත් මම මේ වෙලාවේ මතක් කරන්න කැමතියි.

ඒ නිසා මම හිතන්නේ මේ කරුණු පිළිබඳව අපි දැඩි ලෙස අවධානය යොමු කරන්න වෙනවා. මේ මෑත භාගයේ හොයලා බැලුවොත් රජයක් හැටියට මධ්‍යම ආණ්ඩුවත්, පළාත් සභාවත් වෙන කිසි කවරදාකටත් වඩා රජයේ පාසල්වල අධ්‍යාපනයේ සංවර්ධනය සඳහා අති විශාල ලෙස මුදල් සම්භාරයක් ලබා දෙමින් පවතින වකවානුවක් හැටියට මේ වෙලාවේ සඳහන් කරන්න කැමතියි. අපේ සිරිකමල් ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාවේම තියෙනවා, අපේ පළාත් සභාවේ අයවැයෙන් වැඩිම ප්‍රතිශතයක් මේ අධ්‍යාපන අමාත්‍යාංශයට අපි වැය කරනවා. ඊට අමතරව, මම අර සඳහන් කරපු ද්වීතියික පාසල් 1000 සහ ප්‍රාථමික පාසල් 5000 සංවර්ධනය කරන වැඩ පිළිවෙළ තුළ අති විශාල මුදලක් ඒ ව්‍යාපෘතිය හරහාත් ලබා දෙනවා. ඊට අමතරව විවිධ ආධාර මගින්, විදේශ ආධාර මගින් ලබා දෙනවා. ඒ විධියටත් විශාල මුදල් ප්‍රමාණයක් මේ අධ්‍යාපන පද්ධතියට ලැබෙනවා.

ඒ වාගේම විශේෂයෙන්ම අපේ පළාතේ ගුරු සිසු අනුපාතය 19 දක්වා පහළ මට්ටමකට මේ පළාත් සභාව ගෙනෙන්න කටයුතු කරලා තියෙනවා. ඒ තුළ අපේ දරුවන්ගේ අධ්‍යාපන සංවර්ධනයට විශාල දායකත්වයක් මේ පළාත් සභාව හැටියට අපි ගෙනැල්ලා තියෙනවයි කියන කාරණය මතක් කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

[අ.භා. 12.05]

ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා
Hon. Ananda Harischandra de Silva

මට අවස්ථාව ලබා දීම සම්බන්ධව බොහොම ස්තුතිවන්ත වෙනවා. මා හිතන්නේ, සිරිකමල් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා ගෙනාවේ ඉතාමත් හොඳ කාලෝචිත යෝජනාවක්. ඒ සම්බන්ධව ස්තුතිවන්ත වෙනවා. ගරු සභාපතිතුමනි, මම හිතන්නේ එතුමා ගෙනාපු යෝජනාව අනාගතය වෙද්දි යම් ප්‍රමාණයකට සමනය වෙයි. ඔය මුදල් ගන්නවා. ලිංගික අල්ලස් - මුදල් ගන්න එක සම්බන්ධයෙන් යම් ප්‍රමාණයක සහනයක් ඉදිරියේදී ලැබෙයි. මොකද, හේතුව එතුමාගේ සංකල්පයක් අනුව සපිරි පාසල් 1000 ලංකාව පුරා ගොඩනගන්න යනවා. ලංකාවේ අපට පාසල් නවදහස් ගණනක් තමයි තියෙන්නේ. ඒ දාහත් සපිරි පාසල් කරන කොට 5000 පෝෂිත පාසල් බවට පත් වෙනවා. අනිවාර්යෙන්ම ඒ පාසල් දහසේ එක - පහ ශ්‍රේණි නැතුව යනවා. අර පාසල් පන්දහසට එක - පහ පාසල් ඇති වෙනවා. එහෙම නම් ඒ ළමයින්ට අනිවාර්යයෙන්ම එක - පහ පාසල් දාන්නම සිද්ධ වෙනවා. එතැන්දි අර පාසල කෙරෙහි මුදල් දෙන්න තියෙන වුවමනාව නැති වෙනවා. අද වන කොට මම හිතන්නේ, විශාල මුදල් ප්‍රමාණයක් වැය කරනවා, ඒ පාසල් දාහයි පන්දාහයි පෝෂණය කරන්න.

ඒ එක්කම මට තියෙන ප්‍රශ්නයක් තමයි ඇයි මේ සල්ලි දෙන්නේ? ඕනෑම කෙනෙකුට තමන්ගේ ප්‍රදේශයේ ගමේ පාසල් තියෙනවා. එහෙනම් ඇයි මේ සල්ලි දෙන්නේ? ඒ සල්ලි දෙන්නේ ඒ පාසල හොඳයි කියන නමක් ප්‍රදේශයේ පවත්වා ගෙන යන නිසා. ඒ පාසලේ උගන්වන්නේත් මේ රජයේ ගුරුවරුමයි. ඒ පාසලට Building දුන්නේත් මේ රජයෙන්මයි. අපේ පළාත් සභාවෙන්මයි. මම දැක්ක ප්‍රධාන දෙයක් තමයි ඒ දියුණු යැයි කියන පාසල්වල, මම අදහන දෙයක් තමයි හොඳ විදුහල්පතිවරු ඉන්න නරක ඉස්කෝල නැහැ. නරක විදුහල්පතිවරු ඉන්න හොඳ ඉස්කෝලත් නැහැ. ගොඩක්ම ඒ විදුහල්පතිවරුන්ගේ දැක්ම අනුව ඒ පාසල ඉදිරියට යනවා. ඒ වාගේම ඒ දියුණු පාසලේ ඉන්න දෙමව්පියෝ, සුභපතන්නෝ, ආදි ශිෂ්‍යයෝ ආධාර කරලා ඒ පාසලේ අධ්‍යාපන මට්ටම වාගේම ඒ පාසලේ බාහිර වටපිටාව තුළත් යම් තරමක අගයක් තියෙනවා. එහෙමනම් අනෙක් අය මුදල් දීලා හෝ ඒ පාසල හදන්න උත්සාහ කරනවා. සිරිකමල් ගරු මන්ත්‍රීතුමා ගෙනාපු ඒ යෝජනාව මාත් අනුමත කරනවා. මුදල් ලබා ගන්නවා නම් යම් ක්‍රමවේදයක් - දැන් මම හිතන්නේ පාසල් සංවර්ධන සමිතිය තියෙනවා. පාසල් නගා සිටුවීමේ කමිටුව තියෙනවා. ඒ දෙකටම මුදල් අය කිරීමේ හැකියාවක් තියෙනවා. ඒ මුදල් අය කිරීමේ හැකියාව විධිමත් කරන්නයි ඕනෑ. ඒ සම්බන්ධව මම හිතන්නේ ඔබතුමා ගරු මහ ඇමතිතුමාට යෝජනා කරපු එක හොඳයි. විධිමත් විධියකට ඒ මුදල් පරිත්‍යාග ලැබෙනවා නම් ඒවා අය කරලා මේ පාසල් පද්ධතිය ගොඩ නගන්න තමයි හොඳම යෝජනාව. මම එතුමා ඒ කරපු යෝජනාවට ස්තුතිවන්ත වෙනවා.

[අ.භා. 12.10]

**ගරු එම්.එම්.එම්. අම්ජාඩ්**
Hon. M.M.M. Amjad

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ අවස්ථාවේදී සන්තෝෂ වෙනවා අපේ සිරිකමල් සිල්වා ගරු මන්ත්‍රීතුමා විසින් මේ සභාවට ඉදිරිපත් කරන ලද යෝජනාව පිළිබඳව වචන ස්වල්පයක් කථා කිරීමට අවස්ථාව ලබා දීම සම්බන්ධව. ඇත්තෙන්ම අපේ සිරිකමල් ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා, මේ පස්වන පළාත් සභාවේ ඉතාමත්ම කාර්යක්ෂමව වැඩ කරන මහ ඇමති කෙනෙක් වශයෙන් එතුමාගේ අධ්‍යාපන අමාත්‍යාංශයේ නව පිබිදීමක් නව ප්‍රබෝධයක් ඇති වුණු පළාත් සභාවක් බව මම හිතනවා. විශේෂයෙන්ම විපක්ෂයේ හොඳ අවබෝධයක් තිබෙන ගරු මන්ත්‍රීවරයෙක් වශයෙන් අපේ සිරිකමල් සිල්වා ගරු මන්ත්‍රීතුමාගේ මේ යෝජනාව ඉතාමත්ම කාලෝචිත යෝජනාවක්. අපි දකින්නේ, බස්නාහිර පළාත් සභාවේ අපට අභිමානයෙන් පළාත් සභා මන්ත්‍රීවරයෙක් වශයෙන් කථා කරන්න පුළුවන් හැකියාව, ශක්තිය හයිය මේ අධ්‍යාපන අමාත්‍යාංශය තුළින් සිදු වෙන්නා වූ වැඩ පිළිවෙළ තුළ ඇති වෙනවා කියලා. ඒ ප්‍රගතියන් සම්බන්ධයෙන් කථා කරන කොට අපට ආඩම්බරයෙන් කථා කරන්න පුළුවන් අවස්ථාවක් කියන එකත් අපි මේ අවස්ථාවේ සඳහන් කරන්න කැමතියි. අද අපි දකිනවා අපි අධ්‍යාපනය පිළිබඳව කථා කරන කොට කොට්ඨාශ මට්ටමින් ව්‍යුහ රැස්වීම්වලදී පක්ෂ විපක්ෂ භේදයකින් තොරව සියලු දෙනාම එක තැන වාඩි වෙලා ඉඳගෙන ඒ ප්‍රදේශයේ පාසල්වල දියුණුව වෙනුවෙන් කථා කරන කොට ආණ්ඩු පක්ෂය, විපක්ෂය කියලා භේදයක් නැතුව සියලු දෙනාගේම යෝජනා එක හා සමාන විධියට ක්‍රියාත්මක වන ස්ථානයක් තමයි අපේ ව්‍යුහ කමිටු රැස්වීම.

[ ගරු එම්.එම්.එම්. අම්ජාඩ් ]

මේ ව්‍යුහ කමිටු රැස්වීම හඳුන්වා දුන්න අපේ බස්නාහිර පළාත් ප්‍රධාන අමාත්‍ය ප්‍රසන්න රණතුංග මැතිතුමාගේ සංකල්පය මම හිතන්නේ, ඉතාමත්ම ප්‍රායෝගිකව ක්‍රියාත්මක කරන විනිවිද භාවයක් ඇතිව ක්‍රියාත්මක වන විශාල ව්‍යාපෘති සංඛ්‍යාවක් සාර්ථකව ක්‍රියාත්මක වන ස්ථානයක් තමයි ව්‍යුහ කමිටුව. අද ව්‍යුහ කමිටුව හරහා ඒ ප්‍රදේශයේ පාසල් සංවර්ධනය වන කොට, ඒ ප්‍රදේශයට අවශ්‍ය කරන ගුරුවරු ටික ලබා දෙන කොට ඒ පාසල්වල අඩුපාඩු කථා කරන කොට මම හිතන්නේ, ඉතාමත් කාලීන ප්‍රශ්නවලට ඒ මන්ත්‍රීවරුන්ගේ සහභාගිත්වය ඇතිව පිළිතුරු ලබා දෙමින් ඒ කටයුතු කිරීමට අවස්ථාව ලැබීම මම හිතන්නේ අපි සියලු මන්ත්‍රීවරුන්ට ලැබුණු ලොකු භාග්‍යයක්, වරමක්, හයියක්, ශක්තියක් කියන එක මම මේ අවස්ථාවේදී කියන්න කැමතියි.

අද බස්නාහිර පළාත් සභාවේ තියෙන සමස්ත පාසල් තුළ අපි දැක්කා, අධ්‍යාපන අමාත්‍යාංශයට 2011 දී බිලියන 14.08 ක් වෙන් කරලා තිබුණා. ඒක 2012 වෙන කොට බිලියල 15.32 ක් වෙන් කරලා තිබුණා. 2013 වෙන කොට බිලියන 16.45 ක් සමස්ත අයවැයෙන් 41% ක මුදලක් අධ්‍යාපන අමාත්‍යාංශ වෙනුවෙන් වෙන් කරලා, බස්නාහිර පළාතේ හදවත මම හිතන්නේ 42% ක මුදලක් අධ්‍යාපන අධ්‍යාපනය සඳහා වියදම් කරන එකම පළාත් සභාව නම් ඒක බස්නාහිර පළාත් සභාව විය යුතුයි කියන එක තමයි අපි තමුන්නාන්සේලා සියලු දෙනාගේම තර්කය වන්නේ. මේ සමස්ත පාසල්වල ළමුන් හත් ලක්ෂ ගණනක් ඉගෙන ගන්න කොට බස්නාහිර පළාත් සභාවේ, ඒ හත්ලක්ෂ ගණනට ඉගෙනුම ලබා දෙන්න ගුරුවරු 32500 ක ප්‍රමාණයක් ඉන්නවා. මේ 32500 ක ප්‍රමාණය පිළිබඳව අපට ආඩම්බර වෙන්න පුළුවන්. 2010 වෙන කොට ගුරුවරු 1259 ක් බඳවා ගත්තා. 2011 දී ගුරුවරු 2644 ක් බඳවා ගත්තා. 2012 දී දෙදහස් පන්සිය ගණනක් බඳවා ගත්තා. 2013 මම හිතන්නේ, ගුරුවරු හාර දහසක්, පන්දහසකට ආසන්න සංඛ්‍යාවක් බඳවා ගෙන තියෙනවා. මම හිතන්නේ, සමස්ත ගුරුවරුන්ගෙන් 35% ක නව බඳවා ගැනීම් කරලා තියෙන්නේ, අපේ බස්නාහිර පළාත් සභාවේ ප්‍රසන්න රණතුංග ගරු මහ ඇමතිතුමා කියන එක මේ සභාවේ සන්තෝෂයෙන් කියන්න කැමතියි. ඒ නිසා ඒ වාගේ හයිය, ශක්තිය පාවිච්චි කරලා මේ බස්නාහිර පළාත් සභාවේ අධ්‍යාපනය වෙනුවෙන් උපරිම කැපකිරීමකින් කටයුතු කරන්න ඒ උපරිම හැකියාව, ශක්තිය තියෙන නිසා තමයි මම හිතන්නේ, අද අධ්‍යාපන අමාත්‍යාංශය තුළින් බස්නාහිර පළාත් සභාවේ ප්‍රගතිය පිළිබඳව කථා කරන කොට ආණ්ඩු පක්ෂයත්, විපක්ෂයත් කිසිම භේදයකින් තොරව කථා කරන අවස්ථාවක් කියන එක අපි තමුන්නාන්සේට මතක් කරන්න කැමතියි. ඒ නිසා අපි මේ අවස්ථාවේ දකිනවා එක දරුවෙකුට බස්නාහිර පළාත් සභාවෙන් වර්ෂයකට රුපියල් 20,000/- ක මුදලක් වෙන් කරනවා දළ වශයෙන්. ඒ නිසා වර්ෂයකට රුපියල් 20,000/- ක මුදලක් එක පළාත් සභාවක මුදලින් දරුවෙකුට වියදම් කරන කොට මම හිතන්නේ ඒ ප්‍රගතිය ලබා ගෙන මේ බස්නාහිර පළාත් සභාවේ අභිවෘද්ධිය, කීර්තිය, ගෞරවය හිමි කර ගෙන මේ සිරිකමල් ගරු මන්ත්‍රීතුමා ගෙන ආ යෝජනාව තුළින් අපට මේ පළාත් සභාවේ අධ්‍යාපන අමාත්‍යාංශයෙන් කරන්නා වූ සේවය පිළිබඳව කථා කිරීමට අවස්ථාව ලැබීම භාග්‍යයක් කියමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසන් කරනවා. ස්තුතියි.

[අ.භා. 12.15.]

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ස්තුතිවන්ත වෙනවා. අපි දන්නවා, සිරිකමල් පිලිෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ යෝජනාව, මීට කලින් යෝජනාවක් හැටියට න්‍යාය පත්‍රයට ගෙනත් අපි සාකච්ඡා නොකළත්, විටින් විට ආණ්ඩු පක්ෂයේ විපක්ෂයේ අපි හැමෝම මේ අධ්‍යාපනයට මුදල් අය කිරීම සම්බන්ධයෙන් අපි සාකච්ඡා කරලා තියෙනවා. විටින් විට අයවැය විවාදවලදී, අධ්‍යාපනය සම්බන්ධයෙන් මාතෘකාවක් පැන නැගුණු සෑම වේලාවම අපි මේ ගැන සාකච්ඡා කරලා තියෙනවා. නමුත් ස්තුතිවන්ත වෙනවා ගරු මන්ත්‍රීතුමාට මෙය යෝජනාවක් හැටියට න්‍යාය පත්රයට ගෙනැල්ලා අද දින සාකච්ඡා කිරීම සම්බන්ධයෙන්. අපි දන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ප්‍රශ්නය, අපි උදාහරණ කියන්න ගත්තොත් පාසල්වල ලිංගික අල්ලස් ගැනීම් සහ වෙනත් විවිධ ආකාරයේ අල්ලස් ගැනීම් මේවා කෙළවරක් නැතිව කියන්න පුළුවන්. නමුත් මේ ප්‍රශ්නයට මූලික හේතුව, අපි මේ සාකච්ඡා කරමින් මෙතෙක් වේලා විවාදයේ කථා වුණේ මේ ඵලය පිළිබඳව. හේතුව පිළිබඳව සොයා බලද්දී ගරු මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ පිළිබඳව අපි මෙන්න මේ ආකාරයෙන් දකිනවා. දැන් මෙන්න මේකෙදී විශේෂයෙන්ම අධ්‍යාපනය සම්බන්ධයෙන් අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාට මම ස්තුතිවන්ත වෙනවා. බස්නාහිර පළාත්

සභාවේදී ප්‍රධාන අමාත්‍යතුමා තමන්ගේ යුතුකම මේ නිදහස් අධ්‍යාපන වෙනුවෙන් ඉෂ්ට කළාය කියලා අපට කිසියම් ප්‍රමාණයකින් උපදේශක කාරක සභාවේ මන්ත්‍රීවරයෙක් වශයෙන් සෑහිමට පත් වෙන්න පුළුවන්. මොකද, මේ දැක්ම මධ්‍යම රජයට නැහැ. මධ්‍යම රජයේ තියෙන්නේ අධ්‍යාපනය පෞද්ගලික කිරීමේ ප්‍රතිපත්තිය තමයි. විශේෂයෙන් අපි දන්නවා. ඒ සඳහා සුදුසුකම්ලාභී - දැන් වැඩ බලන අධීක්ෂණ මන්ත්‍රීවරයෙකුත් ගත්තා එක්සත් ජාතික පක්ෂයේ අධ්‍යාපන කඩ හිමියෙක්. එහෙම අරගෙන මේ නිදහස් අධ්‍යාපනය විනාශ කිරීමේ වැඩ පිළිවෙළ මධ්‍යම රජයෙන් ගෙන යද්දී, අපේ ප්‍රධාන අමාත්‍යතුමා, නිදහස් අධ්‍යාපනයේ ප්‍රතිලාභ ලබපු ගරු ඇමතිතුමා ඒ අධ්‍යාපනය සම්බන්ධයෙන් වූ එතුමාගේ දැක්ම සම්බන්ධයෙන් අපට සතුටු වෙන්න පුළුවන්. දැන් අර ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ එතුමා අධ්‍යාපනය පැත්තෙන් වැඩි ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් කරලා තියෙනවා.

ඒ වාගේම අපි දන්නවා. ගුරු හිඟය. විශේෂයෙන්ම මම නියෝජනය කරන ජයවර්ධනපුර කලාපයේ කොලොන්නාව ආසනයේ තිබුණු ගුරු හිඟය මෙතුමාගේ කාලසීමාව තුළ ඒ තිබුණු පුරප්පාඩු ටික සැලකිය යුතු මට්ටමකින් අවම කරලා තියෙනවා. දරුවන්ට අධ්‍යාපනය ලබා දීමේ වැඩ පිළිවෙළේදී එතුමා ඒ පැත්තෙන් දායකත්වය සපයලා තියෙනවා. මේ ආකාරයෙන් අපි දකිනවා අධ්‍යාපනය රැක ගැනීමේ පැත්තේදී ප්‍රධාන අමාත්‍යතුමාගේ කාර්ය භාරය ඉෂ්ට කරලා තියෙන බව. හැබැයි, මේකෙන් මම කියන්නේ නැහැ, ප්‍රධාන අමාත්‍යතුමා පළාත් සභාව ඇතුළේ හොඳ වූ පළියට පළාත් සභාවේ මේක හරි සාර්ථකයි. එහෙම තැනකටත් මේ මාතෘකාව ගෙන යන්න එපා මන්ත්‍රීතුමනි. මෙන්න මෙතැන්දී අපි දකිනවා, මධ්‍යම රජයේ ප්‍රතිපත්ති ටික තමයි බස්නාහිර පළාත් සභාවටත් බලපාන්නේ හෝ අනෙකුත් පළාත් සභාවලට බලපාන්නේ. දැන් උදාහරණයක් ගත්තොත් ගරු සභාපතිතුමනි, දැන් අපේ මන්ත්‍රීතුමා කිව්වා පාසල් දහසේ ව්‍යාපෘති ඒ ආකාරයෙන් අවසන් වෙද්දී අවුරුදු පහකට පස්සේ මේ අධ්‍යාපනයේ මුදල් අයකිරීම් සහ ඔය කියන අල්ලස් ගැනීම් සියල්ල බොහෝ දුරට නතර කර ගන්න පුළුවන් වෙයි කියලා. නමුත් අපි විශ්වාස කරනවා සම්පූර්ණයෙන්ම අසාර්ථක ව්‍යාපෘතියක් බවට පත් වෙලා තියෙනවා කියලා, මේ පාසල් ඒකාබද්ධ කිරීමේ ව්‍යාපෘතිය. සපිරි පාසල් ව්‍යාපෘතිය. මේක කිසියම් ප්‍රමාණයකින් සාර්ථක වුණා. ප්‍රධාන ඇමතිතුමා මැදිහත් වෙලා සමහර පාසල් ඒකාබද්ධ කළා. ඒ සුදුසු පාසල් ටික ඒකාබද්ධ කිරීම කළා. හැබැයි, මේක සම්පූර්ණයෙන්ම අව්වාරුවක් බවට පත් කළා සපිරි පාසල් ව්‍යාපෘතිය මේක මැද්දට දැම්මාට පස්සේ. අර ප්‍රධාන ඇමතිතුමා සහ ඊට කලින් හිටපු රෙජිනෝල්ඩ් කුරේ මැතිතුමා හදපු ඒ වැඩ පිළිවෙළ හොඳම ආකාරයෙන් නොවුණත් කිසියම් මට්ටමකින් සාර්ථකව තිබුණා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. නමුත් මේ මධ්‍යම රජයේ වැඩපිළිවෙළත් එක්ක සම්පූර්ණයෙන් ඒ වැඩ පිළිවෙළ අවුල් වෙලා ගියා. දැන් උදාහරණයක් ගත්තොත් ගරු ප්‍රධාන අමාත්‍යතුමාට දැන ගන්නත් එක්ක කියන්නම්. අපි උපදේශක කාරක සභාවයි ව්‍යුහ කමිටුවයි දෙක එකතු වෙලා සාකච්ඡා කරලා කඩුවෙල කොට්ඨාශයේ පාසල් කිහිපයක් නම් කළා. ඊළඟට මධ්‍යම රජයේ ගරු අධ්‍යාපන ඇමතිතුමා ආවා ජාතික පාසල් දෙකකට. ආ... විදුහල්පතිතුමා, හරි ෂෝක් නේ මේ පාසල් දෙක. මේ පාසලත් සපිරි පාසලක් කළොත් හොඳයි කියලා නම් කළා. ඒ වෙන කොට පළාත් සභාව හැටියට ව්‍යුහ කමිටුවේදී මේ පාසල් ටික නම් කරලා වැඩ පිළිවෙළ සකස් කරලා ප්‍රතිපාදන වෙන් කිරීම්, ඒ යෝජනා කිරීම් ටික කරලා ඉවරයි. මධ්‍යම රජයේ ඇමතිතුමා ජාතික පාසල් නම් කළ හැටියට ඊළඟට ඒකට ඒකාබද්ධ කළා අනෙකුත් පාසල් ටික. වෙලාවක් නැති නිසා මම මේ පාසල් නම් කිය කියා උදාහරණ කියන්න යන්නේ නැහැ. ඒ වැඩ පිළිවෙළ සම්පූර්ණයෙන් අවුල් වෙලා ගියා. අනෙක් පැත්තෙන් බෝමිරිය ජාතික පාසල ඒකාබද්ධ කරද්දි, මේ වැඩපිළිවෙළ හදලා තිබෙද්දි සම්පූර්ණයෙන්ම අපේ කඩුවෙල කොට්ඨාශයේ තියෙන ජාතික පාසල් දෙක මේකට ඒකාබද්ධ කිරීමත් එක්ක බස්නාහිර පළාත් සභාවේ හදපු වැඩ පිළිවෙළ සම්පූර්ණයෙන් අවුල් සහගත වෙලා අසාර්ථක ව්‍යාපෘතියක් බවට පත් වෙමින් තියෙන බව අපි දකිනවා. නමුත් ප්‍රධාන ඇමතිතුමා මෙන්න මේ මැදිහත්වීම කිසියම් මට්ටමකින් අවම කර ගන්න දරණ උත්සාහය පිළිබඳවත් අපි සෑහීමකට පත් වෙනවා.

ඒ වාගේම මුදල් අය කිරීම සම්බන්ධයෙන්. මේ අවසානයට පැවැතුණු උපදේශක කාරක සභාවේදීත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි මම ඉදිරිපත් කළා, කොට්ටාවේ ලිංගික අල්ලස් ගත්ත විදුහල්පතිවරයා සම්බන්ධයෙන් කාරණයක්. අධ්‍යාපන උපදේශක කාරක සභාවේදී එතුමා මුදල් අය කිරීම සම්බන්ධයෙන් ලිඛිතව මම කරුණු ඉදිරිපත් කෙරුවා. බැංකුවේ එතුමාගේ Account එකට මුදල් තැන්පත් කරපු රිසිට් එකත් එක්ක මම උපදේශක කාරක සභාවේදී ඉදිරිපත් කළා. ඒ උපදේශක

කාරක සභාවේදී ඉදිරිපත් කිරීමෙන් පසු ඒ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් කඩිනමින් කළා නම්, මෙතුමාට මේ අපහාසය විඳ විඳ ඒ ලිංගික අල්ලස් ලබා ගැනීම කියන චෝදනාවට නොවෙයි, අඩුම තරමින් අල්ලස් ලබා ගැනීමේ චෝදනාවට විතරක් බන්ධනාගාරගත වෙන්න තිබුණා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ලිංගික කැල්ල නැතුව.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ලිංගික කැල්ල නැතුව. කඩිනමින් ක්‍රියාත්මක නොවීම නිසාම - සමහර කාරණා සම්බන්ධයෙන් විධිමත්ව ක්‍රියාත්මක වීම් තිබුණා. ඒ පිළිබඳවත් කියන්න ඕනෑ. නමුත් විශේෂයෙන්ම අද න්‍යාය පත්‍රයෙත් මගේ ප්‍රශ්න තියෙනවා. ඒ ඔබතුමාත් නියෝජනය කරන කිට්ටුව පාසලක. හේනේගම මධ්‍යම මහා විද්‍යාලයේ විදුහල්පතිතුමාගේ ක්‍රියා කලාපය සම්බන්ධයෙන්. තේක්ක ගස් 14 ක් කපා ගෙන ගිහිල්ලා තියෙනවා. කවුද අනුමැතිය දුන්නේ? ඒ වාගේම මම අහපු ප්‍රශ්න ටිකත් එක්ක බැලුවාම ඒ හේම ප්‍රතිභා සැණකෙළියේදී එතුමාට ආරාධිත අමුත්තන්ගෙන් විශාල මුදල් ප්‍රමාණයක් ලැබෙනවා. ඒ මුදල් ටිකට මොකද වුණේ කියලා පරීක්ෂණ වාර්තාව එවලා නැහැ. පරීක්ෂණයක් කරලා තියෙනවා. පරීක්ෂණ වාර්තාව ගැන මම දන්නේ නැහැ. එතුමා උත්තර දෙයි, මේ ප්‍රශ්න ටිකට. ඒ උත්තර දුන්නාට පස්සේ මට මේ පිළිබඳව නැවත සාකච්ඡා කරන්න පුළුවන්. මම කියන්නේ, මේ වාගේ උදාහරණ ගත්තොත් පාසල්වල අක්‍රමිකතා සැලකිය යුතු මට්ටමින් සිදු වෙනවා. ඒ මුදල් සෙවීම සමහර විට පාසලට ප්‍රතිලාභයකුත් නැහැ. සමහර විදුහල්පතිවරු මුදල් එකතු කරනවා. ඒවා යටි මගඩි ගහන්නේ නැහැ. පාසලේ ප්‍රතිලාභය සඳහා ඒ මුදල් එකතු කිරීම්වල කිසියම් ප්‍රතිලාභයක් දරුවන්ට ලැබෙනවා. ඒ මුදල් එකතු කිරීම් ක්‍රමවත්ද, අක්‍රමවත්ද කියන කාරණය වෙනම එකක්. නමුත් ඒ එකතු කරන මුදල් ටික යටි මඩි ගහන්නේ නැහැ. හැබැයි, මේ ආකාරයේ විදුහල්පතිවරු පාසලට වැඩකුත් නැහැ ගරු මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා මෙන්න මේ මූලික ප්‍රශ්නය තියෙන්නේ අධ්‍යාපනය සම්බන්ධයෙන් මධ්‍යම රජයේ තියෙන දැක්මත් එක්කයි. ඒ සඳහා තමයි දින සියයකට වැඩි කාලයක් අපේ රටේ අධ්‍යාපනය සම්බන්ධයෙන් විශේෂඥවරු ටික පාරට බැහැලා උද්ඝෝෂණය කළේ. ඒ අධ්‍යාපනය පිළිබඳ දැක්මක්, දැනීමක් තියෙන අය පාරේ උද්ඝෝෂණය කළේ. මහ පාරේ ගිහින් තමන්ට දෙයක් ලබා ගන්න නොවෙයි. ඒක ඇතුළේ වැටුප් වැඩි කිරීම් තිබුණේ අන්තිමට. මූලික ඉල්ලීම තිබුණේ, මූලික අවශ්‍යතාවය තිබුණේ දළ දේශීය නිෂ්පාදිතයේ වෙන් කරන මුදල සම්බන්ධවයි. 6% ක් අධ්‍යාපනය සඳහා වෙන් කළ යුතුයි කියන ඉල්ලීමයි. ඒ ඉල්ලීම ඉෂ්ට කළා නම් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි විශ්වාස කළා මේ පාසල්වලට මේ මේ ආකාරයෙන් මුදල් එකතු කිරීම් ටික කරගන්න ඒ ආකාරයෙන් විදුහල්පතිවරුන්ට ඒ චෝදනා ලබන්න සිද්ධ වෙන්නේ නැහැයි කියලා. අධ්‍යාපනය සම්බන්ධයෙන් ලැබෙන ඒ ප්‍රතිපාදන ටික ලබා දීම තමයි මේ මොහොතේ කඩිනමින් වෙන් කළ යුතු ක්‍රියාමාර්ගය කියලා අපි විශ්වාස කරන්නේ. ඒ ක්‍රියාමාර්ගය ගත්තොත් අපි විශ්වාස කරනවා, මෙන්න මේ පාසල්වල අවිධිමත් ආකාරයේ මුදල් එකතු කිරීම්, විධිමත් කිරීම වෙනුවට මධ්‍යම රජයෙන් විධිමත් ප්‍රතිපාදනයක් මෙන්න මේ ආකාරයට ලැබුණොත් මේ ප්‍රශ්නයට උත්තරයක් ලැබේ කියා විශ්වාස කරමින් අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නවතිනවා.

[අ.භා. 12.25]

**ගරු කීර්ති උඩවත්ත**
Hon. Keerthi Udawatte

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම සන්තෝෂ වෙනවා. මේ වැදගත් යෝජනාව ශ්‍රවණය කිරීම සඳහා ගරු ප්‍රධාන අමාත්‍යතුමාත්, ඒ වාගේම පරිපාලන නායකත්වය දරන අපේ ලේකම්වරයාත්, නිලධාරීනුත් ගැලරියේ සිටත් මේ යෝජනාවට ඇහුම්කන් දීම පිළිබඳව මම පළමුවෙන්ම සතුටු වෙනවා. ගරු සභාපතිතුමනි, මා විශ්වාස කරන්නේ, අපේ සිරිකමල් ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ මේ යෝජනාවේ අන්තර්ගතය පිළිබඳ අපි බොහෝ දෙනෙක් හරියට ග්‍රහණය කර නොගත් බවයි. එතුමාගේ මේ යෝජනාවේ මුඛ්‍ය පරමාර්ථය වන්නේ, පාසලකට රජයෙන් දෙන ප්‍රතිපාදනවලින් ඒ පාසල නඩත්තු කළ නොහැකි බවයි. එසේ නම් ඒ සඳහා වන අතිරේක ප්‍රතිපාදන අප සොයා ගත යුත්තේ කුමන ආකාරයෙන්ද කියන කාරණාව තමයි එතුමා මේ යෝජනාවෙන් ප්‍රශ්න කරන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනප්‍රිය පාසලක නඩත්තුව යථාර්ථවාදීව අප පිළිගත්තොත් අප විසින් ලබා දෙන

මුදල්වලින් කරන්නට බැහැ. ඒ ජනප්‍රිය පාසලට බස් රථයක් ඕනෑ කරනවා. ඒ ජනප්‍රිය පාසලට දුරකථන කිහිපයක් ඕනෑ කරනවා. ඒ ජනප්‍රිය පාසලේ විදුලි බිල බොහොම වැඩියි. ඒ ජනප්‍රිය පාසලේ විවිධ ක්‍රීඩාවන් තිබෙනවා. නාන තටාක තිබෙනවා. බාහිර ගුරුවරුන් සම්බන්ධ කරගත යුතුව තිබෙනවා. ක්‍රීඩා, ඒ වාගේම විශේෂ විෂයයන් සඳහා. ඒ නිසා ඒ විදුහල්පතිවරයා ඒ මුදල් සොයා ගැනීම පිළිබඳව අර්බුදයකට මුහුණ දෙනවා. මේ අර්බුදය විසඳා ගන්නා ක්‍රමවේදය වඩාත් විධිමත් සහ නෛතික ක්‍රියාමාර්ගයකට ගෙන ආ යුතුයි කියන කාරණාව තමයි සිරිකමල් ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාවේ හරය වී තිබෙන්නේ කියලා මා විශ්වාස කරන්නේ, අද වී තිබෙන්නේ කුමක්ද? අද මේ ජනප්‍රිය පාසලේ විදුහල්පතිවරයා වටා මාෆියාවක් ගොඩ නැගෙනවා. පළමුවෙන්ම දේශපාලනඥයන්. පාසලේ ආදි ශිෂ්‍යයන්. සංවර්ධන සමිතිය. විදුහල්පතිවරයාට හිතවත් දෙමාපියන් සහ පාසලේම ලගිමින් පාසලෙන්ම පෝෂණය වන පරපෝෂිතයන් බඳු පිරිසක් මේ පාසල් එක්ක ජීවත් වෙනවා. මෙන්න මේ පිරිස විදුහල්පතිවරයාව ග්‍රහණයට ගන්නවා. අරගෙන ඔහුව විවිධාකාර අයුතු මාර්ගවලින් මුදල් උපයා ගැනීම සඳහා යොමු කරනවා.

මට මතකයි. කොළඹ දිස්ත්‍රික්කයේ ජනප්‍රිය පාසල් ගණනාවක් නියෝජනය කරන ප්‍රදේශයක මන්ත්‍රීවරයෙක් හැටියට. එක අම්මා කෙනෙක් ඇවිල්ලා මට රුපියල් ලක්ෂ දෙකක මුදලක් ලබා දෙනවා. ජනප්‍රිය පාසලකට ඒ දරුවා ඇතුල් කරන්න. ඒ අවස්ථාව වනවිට ඒ පාසලේ කිසිම පුරප්පාඩුවක් නැහැ. මා බොහොම නිහතමානීව ඇගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කළා. මා කියන්නේ, මේ මුදල ඇය කිසිම තරහකින් අමනාපයකින් දෙන මුදලක් නොවෙයි. තම දරුවාගේ යහපත වෙනුවෙන් ඇය පරිත්‍යාග කිරීමට සූදානම් මුදලක්. මේ මුදල් විධිමත්ව ලබාගත හැකි ක්‍රමවේදයක් පාසල තුළ සංවිධානය වෙනවා නම්, ඒ මුදල් විදුහල්පතිවරුන්ගේ සාක්කුවලට යන්නේ නැහැ. දේශපාලඥයන්ගේ සාක්කුවලට යන්නේ නැහැ. ඒ වාගේම පාසල වටා සිටින මාෆියාවේ සාක්කුවට යන්නේ නැහැ. සමහර විට ජනතා විමුක්ති පෙරමුණේ අපේ මිතුරන් මේ කාරණාව විවේචනය කරන්න පුළුවන්. අපි සමාජවාදයේ පරමාදර්ශී රාජ්‍යයක් නොවෙයි. අපි දියුණු වෙමින් පවතින රාජ්‍යයක්. එවැනි රටක සියලු දේ සියයට සියයක් සර්ව සම්පූර්ණ කර ගෙන යන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා මට මතකයි එක්තරා අයවැය විවාදයකදී මා යෝජනා කළා, අපි සෑම ජනප්‍රිය පාසලකම එක පන්තියක් ආරම්භ කළ යුතුයි මුදල් ගෙවා ඇතුල්වන දරුවන් ඇතුල් කරන්න. මැණික් ව්‍යාපාරිකයන්, ඒ වාගේම විවිධාකාර කළු සල්ලි තියෙන පුද්ගලයන්. ඒ අය ලැහැස්තියි යම්කිසි මුදලක් තමන්ගේ දරුවා වෙනුවෙන් පරිත්‍යාග කරන්න. අපි කවුරු කොහොම නැහැයි කිව්වත් මේ රටේ ප්‍රධාන ජාතික පාසල්වලට නියම වූ මිලක් තියෙනවා. ඒවා මිනිස්සු කථා කරනවා. අහවල් ඉස්කෝලෙට ලක්ෂ 10 යි. අහවල් ඉස්කෝලෙට ලක්ෂ 5 යි. ඒක දුන්නොත් යන්න පුළුවන් කියලා. ඒ නිසා තමයි හිටපු අධ්‍යාපන අමාත්‍යාංශයේ බලධාරියෙකුට ගෙදර යන්න වුණේ, එවැනි ලිපි නිකුත් කරලා. ඒ නිසා අපි මේ යථාර්ථය තේරුම් ගත යුතුයි. එහෙම නම් මේ මුදල් නීත්‍යානුකූලව පාසලේ දියුණුවට යොදා ගන්න ක්‍රමවේදයක් අපි සකස් කළ යුතුව තිබෙනවා. මුදල් තියෙන දෙමාපියෙක් ඒ මුදල තමන්ගේ දරුවා පාසලට ඇතුළත් කිරීම වෙනුවෙන් පරිත්‍යාග කරන්න සූදානම් නම් එය ගෞරවාන්විතව, ඒ වාගේම නීත්‍යානුකූල විධියට ලබා ගැනීමේ ක්‍රමවේදයකට අපි යා යුතු කාලය එළඹ තිබෙනවා. එහෙම නැතිවුනොත් වෙන්නේ මොකක්ද? ඒ මුදලට තවත් මුදලක් එකතු කරලා ඒ දරුවා ජාත්‍යන්තර පාසලකට ඇතුලත් කිරීම තමයි හුඟක් වෙලාවට දෙමාපියන් කරන්නේ. සමහර විට කෙනෙක් හිතන්න පුළුවන් මේක බොහොම ප්‍රතිගාමී, ධනවාදී යෝජනාවක් කියලා. නමුත් අපි බදු අය කිරීමේ ක්‍රියාදාමයෙන් කරන්නේ කුමක්ද? වැඩියෙන් සල්ලි තියෙන මිනිස්සුන්ගෙන් අපි ආදායම් බදු අය කර ගෙන ඒවා ආදායම ප්‍රතිව්‍යාප්ත කිරීම සඳහා දුප්පත් මිනිස්සු වෙනුවෙන් වැය කරනවා. ඒ වාගේ මුදල් තියෙන දෙමාපියන්ගේ මේ මුදල් අරගෙන අඩු ආදායම්ලාභී දරුවන් ඉන්න පාසල්වල දියුණුවට ඒ මුදල් අපට යොදා ගන්න පුළුවන්.

ඒ වාගේම ඒ පාසලේ ඉන්න අඩු ආදායම්ලාභී දරුවන්ට අවශ්‍ය පහසුකම් ලබා දීම සඳහා ඒ මුදල් යොදා ගන්න පුළුවන්. එහෙම නැතිවුනොත් මේ ප්‍රශ්නය ඉදිරියටත් මේ ආකාරයටම පවතිනවා. අපි දන්නවා. සමහර පාසල්වලට පා පැදියක්වත් නැතුව එන සමහර විදුහල්පතිවරු අවුරුදු හතරක් පහක් යන කොට ගරු සභාපතිතුමනි, අවුරුදු පහක් හයක් යන කොට ඉතාම වටිනා මෝටර් රථයකින් ගමන් කරනවා. මා ඔවුන් කෙරේ ද්වේශ සහගතව කථා කරනවා නොවෙයි. නමුත් ඔවුන් අල්ලස් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ ග්‍රහණයට ලක් වුණොත්, එහෙම නැත්නම් වෙනත් ආකාරයකින් වංචනික ක්‍රියාවකට හසු වී සිරභාරයට පත් වුණොත් එහිදී ඔබතුමා

[ ගරු කීර්ති උඩවත්ත ]

ඇතුළු අප සියලු දෙනාටම එක්තරා විධියකට ලැජ්ජාවට සහ නින්දාවට භාජනය වෙනවා. ඒ නිසා මා යෝජනා කරන්නේ, අපි මේ පිළිබඳව උපදේශක කාරක සභාවේදී සාකච්ඡා කරලා, සමහර විට රජයේ ප්‍රතිපත්තිවලට ගැලපෙන ආකාරයකට මේ මුදල් ශුද්ධ කරලා, ඒ කියන්නේ යම් යම් අනවශ්‍ය පුද්ගලයන් අතට යන මේ මුදල්, තමන්ගේ පෞද්ගලික ප්‍රයෝජනයට යන මුදල් යම් විධිමත් ආකාරයකින් ගිණුමක තැන්පත් වන ක්‍රමවේදයකට අපි යා යුතුයි කියන එකයි. අපි දන්නවා. හුඟක් වෙලාවට අපේ විදුහල්පතිවරු මෙවැනි ක්‍රියාවලට පෙළඹෙන්නේ නොකරම බැරි අවස්ථාවලදී. මොකද? මම දන්නවා. සමහර ජනප්‍රිය පාසල්වල විදුලි බිල ගෙවා ගන්න බැරි වෙන කොට, දුරකථන බිල ගෙවා ගන්න බැරි වෙන කොට, ක්‍රීඩා කණ්ඩායම්වලට අවශ්‍ය කරන පුහුණු ගුරුවරු ලබා ගන්න බැරි වෙන කොට, මුදල් එකතු කිරීම හැර වෙනත් විකල්ප ක්‍රියාමාර්ගයක් නැහැ. අන්න එවැනි අවස්ථාවක අපි අර වාගේ අරමුදලක් ඇති කරලා තිබුණා නම්, ඒ අරමුදල අපට උපයෝගී කර ගන්න පුළුවන් පාසලේ ඒ අවශ්‍ය කරන්නා වූ එදිනෙදා වියදම් පියවා ගැනීමට. විදුහල්පතිවරුන් හැටියට සමහර දක්ෂ පරිපාලකයින් පත් වෙන්න අකමැති වෙනවා.

අපි දන්නවා. සමහර වෙලාවට ඒ අය කාර්යාලයට වෙලා නොයෙක් නොයෙක් සැලසුම් හදමින් ඒ කාර්යාලවල ඉන්නවාට වැඩිය ඒ අයට පුළුවන් විදුහල්පතිවරයෙක් හැටියට ඇවිල්ලා විශාල සේවයක් ප්‍රායෝගික වශයෙන් ඉෂ්ට කරන්න. නමුත් ඒ අය සමග සාකච්ඡා කරන කොට කියන්නේ, මන්ත්‍රීතුමා අපි ඉස්කොලෙකට ගිහිල්ලා අපට හිරේ යන්න තමයි වෙන්නේ කියලා. මොකද? ඒ අයගේ ඒ දක්ෂතාවයන් තිබුණත් ඔවුන් දන්නවා, මේ පාසල දියුණු කරන්න විවිධ ආකාරයෙන් අරමුදල් ලබා ගන්න වෙනවා. ඒ අරමුදල් ලබා ගැනීමේ නෛතික ක්‍රියාවලියක් නැති නිසා ඔවුන්ටත් අකමැත්තෙන් වුවත් අවිධිමත් ක්‍රියාවලියකට යන්න වෙනවා. ඒ අවිධිමත් ක්‍රියාවලිය තුළ සමහරවිට ඔවුන්ට නතර වෙන්න වෙන්නේ හිර ගෙයක. ඒ නිසා ඔවුන් ඒ සියලු දේ අමතක කරලා ශීත කරපු කාමරයකට වෙලා පරිපාලනය කරමින් කටයුතු කරන අවස්ථාවන් අපි දැකලා තියෙනවා. ඒ නිසා ප්‍රධාන අමාත්‍යතුමන්ට මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා මාර්ගයෙන් මම යෝජනා කරන්න කැමතියි, මෙම ප්‍රශ්නය දේශපාලන ප්‍රශ්නයක් කර ගන්නේ නැතුව අපි සියලු දෙනා උපදේශක කාරක සභාවක් තුළ සාකච්ඡා කළ යුතු ඉතා වැදගත් මාතෘකාවක් කියලා. මොකද, මේ වන කොට අල්ලස් ලබා ගැනීම් නිසා - ලිංගික අල්ලස් වේවා, මුල්‍ය අල්ලස් ලබා ගැනීම් වේවා, ඒ ආකාරයෙන් විදුහල්පතිවරු ගණනාවක් මේ චෝදනාවලට ලක් වී තිබෙනවා. මේ ආකාරයට මේ ක්‍රියාදාමය ඉදිරියට ගියොත් විදුහල්පති තනතුරක් භාර ගැනීමට දක්ෂ පුද්ගලයෙක්, කාර්යක්ෂම පුද්ගලයෙක්, පරිපාලකයක් ඉදිරිපත් නොවන වකවානුවකට අපේ රට පත්වන්නට පුළුවන්. ඒ නිසා බස්නාහිර පළාත තුළ ඉතා විශාල වගකීමක් පැවරී තිබෙන අපේ ප්‍රධාන අමාත්‍යවරයාට මම මේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාගේ මාර්ගයෙන් යෝජනා කරන්න කැමතියි. අපේ සිරිකමල් ගරු මන්ත්‍රීතුමා ගෙනාපු මේ යෝජනාව ඉතාම වැදගත් යෝජනාවක් සේ සළකා ඒ විදුහල්පතිවරුන්, ඒ වාගේම පරිපාලන නිලධාරීන්, දේශපාලඥයන්, අධ්‍යාපන විශේෂඥයන් ඇතුළු කමිටුවක් මගින් මේ සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියා මාර්ගය සහ අපි යොදාගත යුතු ක්‍රමවේදය පිළිබඳ යම් කිසි නිශ්චිත සැලැස්මක් සැකසීමට කාලය පැමිණ ඇතැයි කියන බව ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

[අ.භා. 12.35]

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
**Hon. Prasanna Ranatunga - Chief Minister**

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සිරිකමල් පිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා ඉතා වැදගත් යෝජනාවක් ගෙනාවා. මේ යෝජනාවෙන් එතුමා ප්‍රකාශ කරන්නේ, මේ රටේ නිදහස් අධ්‍යාපනය තියෙන රටක්. මේ රටේ පාසල් පද්ධතිය ජාතික පාසල්, පළාත් පාසල්, ජාත්‍යන්තර පාසල් හා පෞද්ගලික පාසල් හැටියට ක්‍රියාත්මක වෙනවා. වැඩි පාසල් ප්‍රමාණයක් තිබෙන්නේ පළාත් සභාවට. ඒ වාගේම වැඩි මුදලක් පළාත් සභාවෙන් වෙන් කරන්නේ අධ්‍යාපනයට. ඒ වෙන් කරන මුදල් ප්‍රමාණය ප්‍රමාණවත් නොවන නිසා වෙනත් ආකාරයෙන් පාසල්වල මුදල් එකතු කරනවා. මේක ක්‍රමවත් වැඩ පිළිවෙළක් බවට පත් කරන්න කියන කාරණාව තමයි කියන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වන කොටත් මේකට විධිමත් වැඩ පිළිවෙළක් තියෙනවා. මේ පාසල් පද්ධතිය තුළ මේ විධිමත් වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වෙනවාද කියන කාරණාවයි තියෙන ගැටලුව වන්නේ. අද අපි පැහැදිලිවම උපදෙස් දීලා තියෙනවා. චක්‍රලේඛනානුකූලව පාසල් නගා සිටුවීමේ කමිටු

තියෙනවා. පාසල් සංවර්ධන කමිටු තියෙනවා. මේවට මුදල් එකතු කරන්න ක්‍රමවේද හදලා තියෙනවා. ව්‍යාපෘතියක් හඳුනාගෙන, ව්‍යාපෘතිය අනුමත කර ගෙන, විදුහල්පතිවරයාගේ නිර්දේශය අනුව කලාප හරහා අනුමත කර ගෙන මේක ක්‍රියාත්මක කරන්න අවශ්‍ය ක්‍රමවේද හඳුන්වා දී තිබෙනවා. දරුවන්ගෙන් මුදල් එකතු කරන ප්‍රමාණය තියෙනවා. යම් දරුවෙකුට මුදලක් දෙන්න බැරි නම් ග්‍රාම සේවක සහතිකය ඉදිරිපත් කළාම ඒ දරුවාව නිදහස් කරන්න කියලා තියෙනවා. ඒ ක්‍රමවේදය තියෙනවා. නමුත් මේ පාසල් පද්ධතිය තුළ ඒක ක්‍රියාත්මක වෙන්නේ නැති කාරණාවයි මෙතැන තියෙන ගැටලුව. නමුත් අද සාකච්ඡාවට ගන්න කොට මුදල් එකතු කිරීම, පාසල් සංවර්ධනයට මුදල් එකතු කිරීම පිළිබඳවත් කථා වුණා. ඒ වාගේම අවිධිමත් විධියට පෞද්ගලිකව විදුහල්පතිවරු ගන්නා වූ අල්ලස් පිළිබඳවත් කථා වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පැහැදිලිවම පළාත් සභාවක් හැටියට විදුහල්පතිවරු දරුවන් ඇතුළත් කර ගැනීමේදී මුදල් එකතු කරනවාට අපි විරුද්ධයි. මම මේ පළාත් සභාව භාර ගන්න කොට මේක පුරුද්දක් විධියට සිද්ධ වුණා. අර සරත් පතිරණ ගරු මන්ත්‍රීතුමා කිව්වා, අපි ඔක්කෝම තොරතුරු අරගෙන ආපහු මුදල් release කළා. දරුවා ඇතුළත් කර ගත්තාට පස්සේ ආපහු ඒ දෙමව්පියන්ට දෙන්න කිව්වා. අපට තිබුණා පරීක්ෂණ කරලා විදුහල්පතිවරු ඉවත් කරන්න. නමුත් අපි ඉවත් කරන කොට ඒ විදුහල්පති තනතුරු ආවරණය කරන්න අපට අවශ්‍ය විදුහල්පතිවරු නැහැ. ඒ නිසා තමයි ඔවුන්ට දැඩි අවවාද කරලා ආපහු මුදල් දෙමව්පියන්ට දෙන්න කියන යෝජනාව කළේ. ළමුන් ඇතුළත් කර ගැනීමේදී පළමුවැනි මාස හය තුළ පළමුවැනි පන්තියට ළමයින්ගෙන් මුදල් එකතු කරන්න එපාය කියලා තියෙනවා. මේ කාරණා තිබෙද්දිත් යම් යම් පුද්ගලයෝ අවිධිමත් විධියට කීර්ති උඩවත්ත ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ විදුහල්පතිවරුත් සමග එකතු වුණු පාසල් සංවර්ධන සමිති, පාසල් නගා සිටුවීමේ සමිති එකතු වෙලා අවිධිමත් ක්‍රමයකට සිද්ධ වෙනවා. ඒ නිසා අපි පළාත් සභාවක් හැටියට - මම ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාවට එකඟයි. අපි මේක උපදේශක කාරක සභාවට දාලා කමිටුවක් පත් කරලා සාකච්ඡා කරලා අපේ තියෙන චක්‍රලේඛ, ඒ කරන නීති රීති පද්ධතිය දිහා බලලා මේක වෙනස් විය යුත්තේ කොහොමද? කියලා, සොයා බලලා මෙය ක්‍රියාත්මක කරන්න හොඳයි කියන එක මම පෞද්ගලිකව පිළිගන්නවා.

ඒ වගේම අවිධිමත් විධියට මුදල් එකතු කිරීම, ලිංගික අල්ලස් ලබා ගැනීම වැනි ගැටළුවලට අපට පහුගිය කාලයේ මුහුණ දෙන්න සිද්ධ වුණා. පළාත් සභාවක් හැටියට ඒක අපේ ක්‍රමවේදය තුළ තිබෙන දෙයක් නොවෙයි. නමුත් පෞද්ගලිකව, පුද්ගලයන් ක්‍රියාත්මක වන ක්‍රමවේදය තුළ මුළු ගුරු පද්ධතියටම ඒක අපහාසයක් බවට පත් වෙලා තියෙනවා. ගුරුවරු කියන්නේ, මේ රටේ වෛද්‍යවරු, ඉංජිනේරුවරු ඇතුළු පරිපාලන ක්ෂේත්‍රයේ ඉහළම නිලධාරින් මේ රටට දායාදය කරන පිරිස.

ඒ වාගේම මේ රටේ දේශපාලන අධිකාරියේ ජනාධිපතිතුමාගේ සිට පහළම ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයා දක්වා සිටින අයට අධ්‍යාපනය ලබා දෙන පිරිසක්. මේ අයගෙ ගරුත්වය රැකෙන පරිදි කටයුතු කරන්න, ඒ අය වගකීමෙන් කටයුතු කළ යුතු අය වනවා සේම, රජයක් හැටියට ඒ අයගේ අවශ්‍යතාවන් හඳුනා ගෙන කටයුතු කිරීම අපේ වගකීමක් බවට පත් වෙලා තියෙනවා. 2009 දී මම මේ පළාත් සභාව භාර ගන්න කොට, අධ්‍යාපනයට වෙන් කළේ මිලියන 800 යි. අද 2013 වන කොට අපි අධ්‍යාපනයට මිලියන 1600 ක් වියදම් කරනවා. මේ මුදල වියදම් කරන්න පුළුවන්කම අපට ලැබුණේ, අපි අධ්‍යාපනයේ වටිනාකම දන්න නිසා. නිදහසින් පසු දශක තුනක තිබුණු යුද්ධය අවසන් වෙලා, රටේ නිදහස යළි ඇති වෙන කොට මිනිසුන්ගේ අවශ්‍යතාවයන් වැඩිවෙලා තියෙනවා. අද පාසල්වල පන්ති කාමරය වායුසමීකරණය කරන්න මගේ අනුමැතිය ඉල්ලලා එවලා තිබෙනවා. එදා swimming pool ඉල්ලපු නැති පාසල් අද swimming pool ඉල්ලනවා. මම විශ්වාස කරනවා ගරු සභාපතිතුමනි, අපි මොනතරම් මුදලක් පළාත් සභා පාසල්වලට දුන්නත්, ජනප්‍රිය හා සම්පත් අධික පාසල් පාලනය කරන්න අපි දෙන මුදල ප්‍රමාණවත් නැහැ. ඒ නිසාම පාසල තුළ යම් යම් දෙමව්පියෝ පාසල් නගා සිටුවීමේ සමිති එකතු වෙලා, ක්‍රමවේද හඳුනාගෙන ක්‍රියාත්මක කරනවාට අපේ විරුද්ධතාවයක් නැහැ. මේක තමනේග් පාසල. දරුවන්ව, ගෙදර පෝෂණය කරන්න දෙමව්පියෝ යම් වැය බරක් දරනවා වගේම ඒ දරුවගේ අධ්‍යාපනයට වැය බරක් දරන්න පුළුවන්නම් ඒක රජයක් හැටියට අපට ශක්තියක් වෙනවා. ඒ නිසා වැය කරන මුදල ක්‍රමවත් විධියට වැයවීම වෙනවද කියන කාරණාව තමයි අපි බලන්න ඕනෑ. ඒ නිසා අපි භෞතික සම්පත් දෙනවා, පාසල්වලට ගොඩනැඟිලි තියෙනවා, ගුරුවරු සම්බන්ධව කථා කරනවා, අපි අවශ්‍ය

[ ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා ]

ප්‍රමාණයට දීලා තිබෙනවා. නමුත් අපි නිර්දේශ නොකරන විෂයයන් සම්බන්ධව සමහරවිට පාසලේ අවශ්‍යතාවය අනුව නිර්දේශ කරන විෂයයන්වලට ගුරුවරු පිටින් බඳවා ගන්නවා. මේවාට යම් මුදලක් දරන්න සිද්ධ වෙනවා. මේවා ක්‍රියාත්මක වෙන්නේ ජනප්‍රිය පාසල්වල. මුදල් අය කරනේන්ත් ජනප්‍රිය පාසල්වල. ඒකයි ගරු සභාපතිතුමනි මෙතන තියෙන ගැටළුව. ඒ අපි විශාල මුදලක් අධ්‍යාපනයට වෙන් කරනවා. භෞතික සම්පත් ලබා දීලා තියෙනවා. මානව සම්පත් අපි වැඩි වැඩියෙන් දීලා තියෙනවා. මගේ කාලසීමාවේදී ගරු සභාපතිතුමනි. මේ මන්ත්‍රීවරුනේග් සහයෝගය ඇතිව කවදාවත් ඉතිහාසයේ නොවුණු පරිදි පළාත් සභාවේ පාසල් 1270 ටම වාර්ෂික ප්‍රතිපාදනයක් පහුගිය අවුරුදු තුනේම අපි අඛණ්ඩව දීලා තියෙනවා. අපේ පාසල අපේ දැතින් සුරකිමු කියන වැඩ සටහන යටතේ හැම පාසලකට ම අපි දීලා තියෙනවා. මේ දෙසැම්බර් මාසයෙත් අපි දෙනවා. අපි ප්‍රතිපාදන, එදා ප්‍රධාන පාසල්වලට තිබෙන ක්‍රමවේදය නවත්තලා, ශිෂ්‍ය අනුපාතය අපි ව්‍යුහ කමිටුවෙන් හඳුනාගෙන ලැබෙන මුදල ශිෂ්‍ය අනුපාතය අනුව කලාපවලට බෙදනවා. කලාපවල කොට්ඨාශ අනුව ඒ මුදල් බෙදනවා. ඒකට අමතරව වාර්ෂික පාසල් නඩත්තුවට අපි මුදලක් දෙනවා ශිෂ්‍ය අනුපාතය බලලා. මේ වගේ වැඩ පිළිවෙළවල් අපි ක්‍රියාත්මක කරලා තියෙනවා. ඒ නිසා අපි එනකොට තිබුණාට වඩා අද මුදල් එකතු කරනවා කියන කාරණාව කථා වෙනවා අඩුයි. ජාතික පාසල් පිළිබඳව මම කථා කරන්නේ නැහැ. පළාත් පාසල් පිළිබඳව පමණයි කථා කරන්නේ. මම සන්තෝෂ වෙනවා.

ගරු සභාපතිතුමනි. මගේ උපදේශ කාරක සභාවේදී ආණ්ඩු පක්ෂයේ හා විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරු යම් යම් ස්ථාන සම්බන්ධව ප්‍රශ්න කරන කොට සමහරවිට නිලධාරින්ට උත්තර දෙන්න බැරි තත්ත්වයක් ඇතිවෙනවා. සමහරවිට ඒ නිලධාරින් අවබෝධයක් නැහැ තමන්ගේ කාරණාව පිළිබඳව. ඊට වඩා හොඳ අවබෝධයක් අපේ මහජන නියෝජිතයන්ට තියෙනවා. ඔවුන්ව මේ පාසල්වල මෙහෙමයි මේක මේ විධියටයි තියෙන්නේ කියන කාරණාව පැහැදිලි කරන්න පුළුවන්කම තියෙනවා. අපි බලන් ඉඳලා තියෙනවා, අපේ මන්ත්‍රීවරු එහෙම පැහැදිලි කරනවා. ඒ මන්ත්‍රීවරුන්ගේ අවධානය අධ්‍යාපනයට යොමු වන්නේ මේකේ තියෙන වැදගත්කම නිසා. ඒ වැදගත්කම නිසාම තමයි මේ වගේ යෝජනාවක් අද සභාවට ගෙනල්ලා තියෙනේන්. ඒනිසා මේ යෝජනාව පිළිබඳව අපේ විරෝධතාවයක් නැහැ. මේ යෝජනාව හොඳයි. මේක අපි ඉදිරියේ උපදේශක කාරක සභාවකට දාලා ආණ්ඩු පක්ෂයේ හා විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ කමිටුවක් පත් කරලා මේ තියෙන චක්‍ර ලේඛ අධ්‍යයනය කරලා මෙය ක්‍රියාත්මක කළ යුතු ආකාරය, මේකේ යමක් සංශෝධන විය යුතු නම් ඒ කටයුතු කරන්න අපි උදව් කරනවා. අපි කටයුතු කරනවා. ඒ සඳහා තමුන්නාන්සේලා සියළු දෙනාගේම සහයෝගය ලබා දෙන්න කියන කාරණය මතක් කරමින් මම නිහඬ වෙනවා.

[ අ.භා. 12.45]

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, මෙම යෝජනාවට අදහස් දැක් වූ සියළුම මන්ත්‍රීවරුන්ට මම ස්තුතිවන්ත වෙනවා. ඒ වගේම අදහස් කිහිපයක් මතුවුණා. අපේ ගුණසිරි ජයනාත් ගරු මන්ත්‍රීතුමා එතුමාගේ කථාවේදී කිව්වා, සමාන්තර පන්ති වැඩි කිරීම පිළිබඳව. ඇත්ත වශයෙන්ම කුඩා පාසල් වැසි යාමේ තර්ජනයට ලක්වීම නිසා පාසල් ඒකාබද්ධ කිරීමේ වැඩ සටහන හුඟක් සාර්ථක වුණා. විශේෂයෙන් ම අපේ පළාත් සභාව යටතේ කරපු. නමුත් නැවත වතාවක් පන්ති වැඩි කිරීමට යාමේදී මේ ගැටළුව මතු වෙන්න පුළුවන් කියන කාරණාව මතක් කරන්න ඕනැ. ඒ වගේම කීර්ති උඩවත්ත ගරු මන්ත්‍රීතුමා ඉතා ප්‍රගතිශීලී අදහස් කිහිපයක් ඉදිරිපත් කළා. 70% ක විතර ප්‍රමාණයක් මේ පළාත් සභාවේ මුදල් අධ්‍යාපනය සඳහා විවිධාකාරයෙන් වෙන් කෙරුවත්, අපිට සෑහීමකට පත්වෙන්න, සතුටු වෙන්න පුළුවන් තත්ත්වයක් තියෙනවා. ඒ ගැන මට තර්කයක් නැහැ. නමුත් එතුමාගේ අදහස අනුව හරියට අර සරදියෙල් ක්‍රමය වගේ කිව්වේ. අදහස අනුව ඇත්ත වශයෙන්ම එතුමා මේ යෝජනාවේ අන්තර්ගතය ඉතා හොඳින් තේරුම් අරන් තිබුණා. ඒ, මුදල් තියෙන කෙනාගෙන් අරගෙන, නැති දෙමව්පියන්ටත් සාධාරණයක් එන විධියට කටයුතු කරන්න වුවමනාය කියලා. ගරු ප්‍රධාන ආමාත්‍යතුමාගේ අවධානය යොමු කරන්න ඕනැ, විශේෂයෙන්ම එතුමා අමාත්‍යාංශය භාරගන්න කොට වෙන් කළ මුදල වගේ දෙගුණයක් ලක්ෂ 800 , ලක්ෂ 1600 කරලා තියෙනවා. ඒක මම හිතන්නේ අධ්‍යාපනය වෙනුවෙන් දක්වපු සුවිශේෂී දායකත්වයක්. නමුත් මේ සියළුම කතන්දර තිබුණත්, මේ මුදල් එකතු කිරීමේ ක්‍රමවේදය හරියාකාරව සකස් වෙන්න ඕනැ. මම

දැක්කා ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා අහපු ප්‍රශ්නයක් නිසා මේ පළාත් සභාවෙන් විමර්ශන කණ්ඩායමක් ගිහිල්ලා, ඒ විමර්ශණය කරපුවහම නැවත වතාවක් ඒ විදුහල්පතිවරුන්ට ඒ මුදල් ඒ දෙමාපියන්ට ගෙවන්න සිද්ධ වුණු ආකාරය. ඒවා කොයි විධියට කොයි ආකාරයෙන් ගෙව්වද මම දන්නේ නැහැ. නමුත් නිර්දේශ වුණා ඒකට ගෙවන්න කියලා. එතනදී මම මේක බොහෝම වගකීමෙන් කියන්නේ. මම මේක අනුමත කරන්නේ නැහැ. මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමාත් මේ පිළිබඳව අවධානය යොමු කරනවා නම් හොඳයි. මොකද එතැනදී කතෝලික පාසල්වලට මේගොල්ලෝ ගිහිල්ලා යම් කිසි වැඩ පිළිවෙලක් හැදුවා. දේවස්ථාන ආසන්නයේ තමයි, දේවස්ථානයේ වත්තේ තමයි හුඟක් වෙලාවට මේ පාසල තියෙන්නේ. එතකොට පල්ලියේ ඉන්න පියතුමාගේ මූලිකත්වයෙන් මේ පාසල නඟා සිටුවීම කියලා. උදාහරණයක් හැටියට මම මේ කියන්නේ. ශාන්ත පාවුළු විද්‍යාලය ගනිමු. එතකොට ඒ ළඟම තියෙන පල්ලියේ ස්වාමිව අරගෙන මේ පාසල නඟා සිටුවීමේ අරමුදල කියලා අර සල්ලි ටික ගරු පියතුමාව සභාපතිත්වයේ තියාගෙන, කටයුතු කරනවා.

මම හිතන්නේ නැහැ, මේක ඒ තරම් හොඳ ක්‍රමයක් කියලා. නමුත් මෙහෙම දේවල් මේ 2013 අවුරුද්දේ වුණා. එහෙම වෙන එක නතර කරන්න ඕනෑ හින්දා තමයි මම මේ කියන්නේ, මේ සඳහා ඍජු දායකත්වය පළාත් සභාවට දෙන්න බැරි ඇයි? (බාධා කිරීමක්) මම මේ කිව්වේ එතුමාත් දන්නවා මේකේ සමහර කතන්දර. ඒ හින්දා කිව්වේ. මොකද අපි දෙන්නම ඒ සම්බන්ධයෙන් කටයුතු කරන නිසා. ඒක නිසා ඒවා නොවිය යුතු දේවල්. දැන් කවුරුහරි කියන්න පුළුවන්, නැහැ ඒක හොඳයි නේ. සමහර විට මට ප්‍රශ්නයක් වෙන්නත් පුළුවන්. ඒක වෙනම දෙයක්. දේශපාලන කතන්දරයක්. ඒක නොවේ. අපට පුළුවන්කම තියෙනවා නම් මේ සභාව හරහා විධිමත් වැඩපිළිවෙලක් හදන්න. ඇත්ත වශයෙන්ම දැන් සමහර වෙලාවට ඒක විද්‍යාල වශයෙන් වෙන් වෙන් වශයෙන් නොවී, ඒ කලාපයේ හරි ඒ කොට්ඨාශයේ හරි ඒ සියළුම ලැබෙන මුදල් සමාන්තරව අවශ්‍යතාවය අනුව බෙදන්න. දැන් මෙතනදී ප්‍රධාන ඇමතිතුමා කියපු දේ සම්බන්ධව මම ඒකක් කියන්න ඕනෑ, පාසල් තියෙනවා, සංවර්ධනය වන පාසල් සංවර්ධනය සඳහා මුදල් ගන්නවා. තවත් පාසල් තියෙනවා, යම් යම් දේවල් නඩත්තු කිරීම සඳහා අනිවාර්යයෙන්ම සල්ලි ගන්න ඕනෑ. එතකොට කොයින්ද ඒ නඩත්තුවට සල්ලි හොයා ගන්නේ. පළාත් සභාවෙන් ලැබෙන්නේ නැත්නම්, නඩත්තුවට සල්ලි දෙන්න ඕනෑ. සංවර්ධනය කරනවා කියන එකක්. නඩත්තුව කියන ඒක තව එකක්. සංවර්ධනය කරනවා කියන්නේ, අර කිව්වා වගේ swimming pool දෙන්න, විද්‍යාගාර දෙන්න, ක්‍රීඩාවලට තව ගුරුවරු ගන්න වෙන වෙන දේවල් සඳහා. නමුත් නඩත්තුව කියන්නේ, තියෙන දේවල් නඩත්තු කරගෙන යෑම. එතකොට ඒකටත් මුදලක් ඕනෑ. ඒක නිසා මේ මුදල දැන් තියෙන්නේ කොහාටද? මේ සඳහා නිත්‍යානුකූල ක්‍රමයක් මේ තුළම ඇති කරන්න. ඒ සඳහා මම හිතන්නේ, මේ කතිකාවතට සම්බන්ධ වුණු, යෝජනාවට සම්බන්ධ වුණු සියළුම මන්ත්‍රීවරුන්ට මම විශේෂයෙන්ම ස්තූතිවන්ත වෙනවා. මම ඔබතුමාගේ මාර්ගයෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාගේ මාර්ගයෙන් ඉල්ලා සිටින්නේ, ගරු ප්‍රධාන ඇමතිතුමාගේ උපදේශ කාරක සභාව හරහා මේ ක්‍රමවේදය ඉතාමත්ම ඉක්මනින් මේ වර්ෂය තුළදීම ක්‍රියාත්මක කරන්න අවස්ථාව ලැබේවා කියලා ප්‍රාර්ථනා කරමින් මේ යෝජනාවට සම්බන්ධ වුණු සියළුම ගරු මන්ත්‍රීවරුන්ට මගේ ස්තූතිය ප්‍රකාශ කරමින් මම නිහඬවෙනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

# කල් තැබීමේ යෝජනාව
## ADJOURNMENT

**ගරු සුනිල් ජයමිණි - සභානායකතුමා**
Hon. Sunil Jayamini - Leader of the House

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, *"දැන් මෙම සභාව කල් තැබිය යුතු යැයි"* මම යෝජනා කරනවා.

***ඊට අනුකූලව පළාත් සභාව අ.භා. 12.47 ට, 2013 ඔක්තෝබර් මස 08 වන දින පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***
*Sitting, accordingly adjourned at 12.47p.m till 9.30 a.m. on* 08.10.2013